# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය
# 2023 වාර්ෂික වාර්තාව



**මාර්තු 7 දින අන්තර්විශ්වවිද්‍යාල ශිෂ්‍ය පෙරමුණ සංවිධානය කළ විරෝධතාවය විසුරුවා හැරීමට යකඩ වළලු යෙදූ ලී පොලු රැගත් මුහුණු ආවරණ පැළඳි හමුදා හටයින් යොදා තිබිණ. විරෝධතාවය මැඩීමට හමුදාව සම්බන්ධ වූ නැති බව පැවසූ නිසා මෙම හටයින් හෝ එම බලකාය හඳුනා ගත නොහැකිය.**
**ඡායාරූපය ෂෙහාන් ගුණසේකර අනුග්‍රහයෙනි.**

**INFORM** Human Rights Documentation Centre
www.inform.lk

2023 ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය වාර්ෂික වාර්තාව .
2024 මැයි ප්‍රකාශයට පත් කරන ලදී..
© INFORM මානව අයිතිවාසිකම් ප්‍රලේඛන මධ්‍යස්ථානය
කොළඹ ශ්‍රී ලංකාව
https://www.inform.lk/

වාර්තාව ගැන

විසම්මුතියේ මර්දනය යනු ශ්‍රී ලංකාවේ ඉන්ෆෝර්ම් ආයතනයේ මානව අයිතිවාසිකම් මධ්‍යස්ථානය කලින් කලට යාවත්කාලීන කොට ප්‍රසිද්ධ කරන ප්‍රකාශන මාලාවකි. මෙම වාර්තාවෙන් මූලික වශයෙන් ප්‍රධාන ප්‍රවාහයේ සහ සමාජ මාධ්‍ය යේ වාර්තාවන තොරතුරු පදනම්ව ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය කිරීම පිළිබඳ කැපී පෙනෙන සිද්ධීන්වල විස්තර සහ සමහර ප්‍රවනතා ඉදිරිපත් කරයි. ඒවාට ප්‍රකාශනය, රැස්වීම, සංගම් පැවැත්වීම සහ විසම්මුතියේ නිදහසට හානි විය හැකි අත් අඩංගුවට ගැනීම්, තර්ජන, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට එරෙහි විමර්ශන සහ නව මර්දනකාරී නීති, ප්‍රතිපත්ති තිරණ යනාදිය වැනි තර්ජනයක් විය හැකි සිද්ධීන් පිළිබඳ ඇතුළත් ය.

ඉන්ෆෝර්ම් ආයතනය 1990 දී පිහිටුවන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වය අධීක්ෂණය සහ ප්‍රලේඛනය සහ ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ මැදිහත්වීම් සහ ලේඛන ගත කිරීම හරහා තත්වය වාර්තා කිරීමට ය. ඉන්ෆෝර්ම් ආයතනය තම අයිතිවාසිකම් නිරන්තරයෙන් සහ ක්‍රමානුකූලව උල්ලංඝනය වන අනෙකුත් ප්‍රජාවන් සමග ද වැඩ කිරීමට අවධානය යොමු කරයි. දැනට ඉන්ෆෝර්ම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය, ප්‍රකාශණයේ නිදහස සහ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් කෙරේ අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාවේ කොළඹ පදනම්ව ඇති එම ආයතනය ප්‍රාදේශීය ක්‍රියාකාරීන්, කණ්ඩායම් සහ ජාල මෙන්ම කලාපීය (ආසියානු) සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් ජාල සමග සමීපයෙන් වැඩ කරයි.

# පටුන


| | | |
|---|---|---|
| **1.** | විධායක සාරාංශය | 4 |
| **2.** | සමස්ත දැක්ම | 13 |
| **3.** | නඩු යාවත්කාලීන කිරීම් | 18 |
| **5.** | රැස්වීමේ නිදහස මර්දනය | 32 |
| **6.** | ප්‍රකාශනයේ නිදහස මර්දනය | 38 |
| **7.** | ක්‍රියාකාරිකයන් සහ තොරතුරු හෙළිකරන්නන් මර්දනය | 39 |
| **8.** | මර්දනකාරී නීති සහ ප්‍රතිපත්ති පියවර | 40 |
| **9.** | රාජ්‍ය නිලධාරීන් මර්දනය | 44 |
| **11.** | වෙනත් | 47 |

# 1. විධායක සාරාංශය

මෙම වාර්ෂික වාර්තාවට පදනම් වන්නේ 2023 වසරේ පළ කරන ලද විසම්මුතියේ මර්දනය පිළිබඳ වාර්තාය. මෙම විසම්මුතියේ මර්දනය පිළිබඳ වාර්ෂික වාර්තාව මූලික වශයෙන් ප්‍රධාන ප්‍රවාහයේ සහ ජනමාධ්‍ය යේ වාර්තා කළ තොරතුරු පදනම්ව ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනයට අදාල කැපී පෙනෙන සිද්ධීන්වල විස්තර සහ සමහර පොදු ප්‍රවනතා ඉදිරිපත් කරයි. එය ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ පුලුල් සමස්ත දැක්මක් ද ඉදිරිපත් කරයි.

ක්‍රමවේදය: මෙම විසම්මුතියේ වාර්ෂික වාර්තාවේ සඳහන් මර්දන සිද්ධීන්වලට අත්අඩංගුවට ගැනීම්, තර්ජන, බියවැද්දීම්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් පිළිබඳ විමර්ශන සහ අනාගතයේ දී ප්‍රකාශනයේ, රැස්වීමේ, සංගම් පැවැත්වීමේ නිදහසට හානි විය හැකි නව මර්දන නීති, පත්කිරීම්, ප්‍රතිපත්ති තිරණ ඇතුළත් වේ. මෙම වාර්තාවේ 'විසම්මුතිය'' යන්න පුලුල් වශයෙන් නිර්වචනය කරන්නේ විරෝධතා, විරෝධය පෑම්, එරෙහිවීම්, අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ප්‍රශ්න කිරීමට සහ වාර්තා කිරීම අභියෝග කිරීම, පොලිසිය, සන්නද්ධ හමුදා, ආගමික කණ්ඩායම් සහ වෙනත් අය අතර දේශපාලකයන් ද ඇතුළත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන යාන්ත්‍රණයන් මගින් කෙරෙන සමාජ අසාධාරණය ද ඇතුළත් වන සේය. ''විසම්මුතිය'' යනු ඉහත සඳහන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයන් විසින් විසම්මුති පියවර යටපත් කිරීමට ගන්නා කිසියම් උත්සාහයයි. අයිතිවාසිකම් සෝදාපාලුවට ලක්වීමේ අනතුර නිසා මානව අයිතිවාසිකම් හෙළා දැකීමේ ප්‍රකාශන ද විසම්මුතිය මර්දනය කිරීමක් සේ සැලකිල්ලට ගෙන ඇත.

සිද්ධීන් යාවත්කාලීන කිරීම්: මාස පහකට වැඩි කාලයක් ත්‍රස්තවාදි චෝදනා යටතේ රඳවා ගෙන සිටි ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු වන වසන්ත මුදලි ගේ ට පෙබරවාරි මස ඇප ලබා දුන්නේය. වසර තුනකට පෙර පවත්වන ලද විරෝධතාවයක් සම්බන්ධයෙන් වෙනත් ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් 21 දෙනෙකුට පනවා තිබූ ඇප කොන්දේසි ද ඉවත් කරන ලදී. අගෝස්තු මාසයේ දී දින 200ක් රඳවා ගෙන සිටි තවත් ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් දෙදෙනෙකුට ඇප ලබා දී ඇත. මාර්තු මස ශ්‍රී ලංකා පොලීසිය දශක දෙකකට පෙර කල් ඉකුත් වූ කඳුලු ගෑස් භාවිතා කර ඇති බව විමර්ශන මාධ්‍යයෙන් වාර්තා විය. ඒවාට නිරාවරණය වූ අයට බරපතල ශ්වසන ආබාධ ඇති විය. කල් ඉකුත් වූ කඳුලු ගෑස් භාවිතා කිරීමෙන් මිය ගියේයැයි කියන විරෝධතාකරුවෙකු ගේ මරණය සම්බන්ධයෙන් යොදා ගෙන ඇති කඳුලු ගෑස් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස මහෙස්ත්‍රාත් පොලිසියට නියෝග කෙළේය. අප්‍රේල් මස මහජන ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව කල් ඉකුත් වූ ගෑස් තොග ඉවත් කරන ලෙස පොලීසියට උපදෙස් ලබා දුන්නේය. මැයි මස කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය හිටපු අගමැති මහින්ද රාජපක්ෂ සහ තවත් කීප දෙනෙකුට පනවා

තිබූ සංචාර තහනම් ඉවත් කෙළේය. 2022 මාර්තු මස මිරිහානේ දී ආණ්ඩු විරෝධී විරෝධතාකරුවන්ට පහරදීම සහ හිතුවක්කාර ලෙස අත් අඩංගුවට ගැනීම සහ 2022 මාර්තු මස ගාලු මුවදොර විරෝධතාකරුවන්ට මැර පිරිස් පහරදීම වැළැක්වීමට පියවර නොගැනීම සම්බන්ධයෙන් ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකක් ජූලි මස ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රතික්ෂේප කෙළේය. රජයේ නීතිඥයන් ඉදිරිපත් කළ මූලික විරෝධතා සැලකිල්ලට ගත් අධිකරණය පෙත්සම් පවත්වා ගැනීමට අවසර දුන්නේ නැත. අරගලයට සම්බන්ධ නීතිඥයන් කණ්ඩායමකට බාධා කිරීම ගැන පොලිසිය දෙසැම්බර් මස සිය කණගාටුව ප්‍රකාශ කෙළේය. ඇමතිවරුන් සහ පාර්ලිමේන්තු මංත්‍රීන් ඇතුළත් පාර්ශ්ව කීපයක් 2022 මැයි මස ගාලු මුවදොර විරෝධතාකරුවන්ට පහර දීමෙන් පසු හට ගත් ප්‍රචණ්ඩතාවය වැළැක්වීමට අපොහොසත් වූයේයැයි පොලීසියේ සහ හමුදාවේ ප්‍රධානීන්ට එරෙහිව ගොනු කර තිබූ රිට් පෙත්සමක් නව පරීක්ෂණයක් පැවැත්වීමට බලධාරීන් පොරොන්දු වීමෙන් පසුව ඉල්ලා අස්කර ගන්නා ලදී.

2020 කොළඹ දී පැවැත් වූ සාමකාමී විරෝධතාවයක දී විරෝධතාකරුවන් හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීමට සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් සහ තවත් පොලිස් නිලධාරීන්ට එරෙහිව ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරියට පවත්වා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණය ජුනි මස අවසර ලබා දුන්නේය. 2022 අප්‍රේල් මස රඹුක්කන  දී විරෝධතාකරුවන්ට පොලිසියෙන් වෙඩි තැබීම ගැන මානව හිමිකම් කොමිසම නිකුත් කළ වාර්තාවකින් පොලීසිය අසීමිත බලය යෙදවීම නිසා විරෝධතාකරුවෙකුට මරණය සිදු වී තවත් දහඅට දෙනෙකුට තුවාල සිදුව ඇතැයි සඳහන් කෙළේය. මහර බන්ධනාගාරයේ සිරකරුවන් 11 දෙනෙකු මරා දැමීම පිළිබඳව වැලිසර මහෙස්ත්‍රාත් පවත්වන ලද පරීක්ෂණය නිම කොට වෙඩි තැබීමට සම්බන්ධ බන්ධනාගාර නිලධාරීන් අත්අඩංගුවට ගන්නා ලෙස පොලීසියට නියෝග කළ ද එය ක්‍රියාත්මක වූයේ නැත.

නීති වෙනස් කිරීම්: වධ හිංසා සහ හිරිහැර කිරීම්වලට තුඩු දිය හැකියැයි විවේචනයට ලක් වූ විවාදාත්මක පුනරුත්ථාපන කාර්යංශ පනත සම්මත කෙරිණ. සැප්තැම්බර් මැද භාගයේ දී ප්‍රති-ත්‍රස්ත පනත සහ මාර්ගගත  ආරක්ෂාව පිළිබඳ පනත යන පනත් දෙක ගැසට් කරන ලදී. මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත අභියෝගයට ලක් කරමන් විශේෂ තීන්දුවක් ලබා ගැනීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් 46ක් ගොනු කෙරිණ. එම පනතේ වගන්ති 31ක් සංශෝධනය කිරීමෙන් පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයකින් සම්මත කළ හැකියැයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙළේය. නොයෙකුත් අංශවලින් මතු වූ විරෝධය නිසා එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙළේ නැත. යෝජිත විකාශන නියාමන කොමිසම් සභා කෙටුම් පත දේශපාලන වශයෙන් පත් කරන මණ්ඩලයකින් මාධ්‍ය පාලනයට ගන්නා උත්සාහයක් සේ ජනමාධ්‍ය වේදීන් සහ මාධ්‍ය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින

අයගේ තදබල විවේචනයට ලක් විය. සෞඛ්‍ය සේවකයන්ට මාධ්‍යයට ප්‍රකාශ නිකුත් කිරීම තහනම් කරමින් මෑතක දී නිකුත් කරන ලද චක්‍රලේඛයක් ගැන සාකච්ඡා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය වෘත්තීය සමග සාකච්ඡාවක් පැවැත් වූයේය. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ දී විශ්‍රාමික අරමුදල් යොදා ගැනීමට යෝජනා කරන මතභේදයට තුඩු දුන් දේශීය ආදායම් පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලදී. වසර දෙකකට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිකුත් කරන ලද සමහර නියෝග මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන හෙයින් බලරහිත බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙළේය. දූෂණ විරෝධී පනත යෝජිත සංශෝධන 196ක් සමග ඒකමතිකව සම්මත විය.

මැතිවරණ: පළාත් පාලන ඡන්ද පැවැත්වීමට එරෙහිව හිටපු හමුදා නිලධාරියෙකු ගොනු කරන ලද පෙත්සමක් විභාගයට ගත් අවස්ථාවේ දී රටේ පවතින ආර්ථික අර්බුදය නිසා ඡන්ද පැවැත්වීමට අරමුදල් නිකුත් කළ නොහැකියැයි මුදල් අමාත්‍යාංශය අධිකරණයට දැන් වූයේය. අරමුදල් නතර කිරීම වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය අන්තර්වාර නියෝගයක් නිකුත් කළ නමුත් මැතිවරණය පැවැත් වූයේ නැත. මැතිවරණ කොමිසම පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට අලුත් දිනයක් ප්‍රකාශයට පත් කෙළේය. පළාත් පාලන ඡන්ද විමසීම නොපවත්වා විසුරුවා හරින ලද පළාත් පාලන ආයතන නැවත ස්ථාපනය කිරීමට මංත්‍රීවරයෙකු ඉදිරිපත් කළ පුද්ගලික පනතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියැයි නීතිපති අධිකරණයට දැනුම් දුන්නේය.

වගවීම: තොරතුරු කලින් ලැබී තිබුණ නමුත් 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය වැළැක්වීමට හිටපු ජනාධිපති සහ ආණ්ඩුවේ වෙනත් උසස් නිලධාරීන් අපොහොසත්වීමෙන් වින්දිතයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙළේය. වන්දි වශයෙන් රු. දශලක්ෂ 310ක් ගෙවීමට නියම කෙරිණ. වන්දි මුදල ගෙවීමට නියම වූ මාස හයක කාල සීමාව ජුලි මාසයේ දී ගෙවී යන විට හිටපු ජනාධිපති සහ අනෙකුත් අය ගෙවා තිබුනේ නියමිත මුදලින් සියයට නමයක් පමණි. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයට දේශපාලකයන් ගේ සහ හමුදාවේ සම්බන්ධතාවයක් ඇතැයි බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනි නාලිකාව කළ හෙළිදරව්ව ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රතික්ෂේප කර හෙළා දකින ලදී. මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් හිටපු මුදල් ඇමති රවි කරුණානායකට එරෙහිව ගොනු කර තිබූ චෝදනා අභියාචනාධිකරණයෙන් ඉවත දමන ලදී.

මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මංත්‍රී නාමල් රාජපක්ෂ සහ තවත් අයට එරෙහිව ගොනු කර ඇති චෝදනාවලින් ඔවුන් නිදහස් කරන ලෙස ඉල්ලීමක් කර ඇත. විවාදාත්මක මිග් ගනුදෙනුවේ ප්‍රධාන සැකකරුවන්ට පනවා තිබූ සංචාරක තහනම කොළඹ කොටුව මහෙස්ත්‍රාත් තාවකාලිකව ඉවත් කෙළේය. 2009 දී ජනමාධ්‍යවේදී ලසන්ත

වික්‍රමතුංග ඝාතනය කිරීමට ආසන්නතම හේතුව මිග් ගනුදෙනුව හෙළි කිරීමයැයි සැළකේ. වැරදි කළමනාකරණය නිසා රටේ ආර්ථිකය අර්බුදයකට පත් කර ඇතැයි කලින් පැවති ආණ්ඩුවේ ප්‍රධාන දේශපාලකයන් සහ උසස් නිලධාරීන් කීප දෙනෙකු මහජන විශ්වාසය සහ නීතිය ඉදිරියේ සමානාත්මතාවය උල්ලංඝනය කර ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණය ඓතිහාසික නඩු තීන්දුවක් ලබා දුන්නේය. මානව අයිතිවාසිකම් කඩ කිරීම සම්බන්ධයෙන් චෝදනා ගණනාවක් ඉදිරිපත්ව ඇති ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරි දේශබන්දු තෙන්නකෝන් ශ්‍රී ලංකා පොලිසියේ වැඩ බලන පොලිස්පති වශයෙන් පත් කරන ලදී. 2010 දී අත්අඩංගුවේ දී පුද්ගලයෙකු මියයෑම සහ ඔහුට වධහිංසා පැමිණවීම, හිතුවක්කාර අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සම්බන්ධයෙන් ඔහු සහ තවත් පොලිස් නිලධාරීන් කිපදෙනෙකු වැරදිකරුවන් විය.

මාධ්‍යය සහ ජනමාධ්‍යවේදින්: ප්‍රධාන වශයෙන්ම නිතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් මාධ්‍යය සහ ජනමාධ්‍යවේදීන් හිරිහැරයට ලක් කළ අවස්ථා බොහොමයක් තිබිණ. අඩුම වශයෙන් ජනමාධ්‍ය වේදීන් දෙදෙනෙකු අත්අඩංගුවට ගත් අතර තවත් ජනමාධ්‍ය වේදීන් 10ක් පැහැදිලි හේතුවක් නොමැතිව බොහෝ විට මර්දනකාරී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා ගෙන ප්‍රශ්න කර ඇත. ජනමාධ්‍යවේදී සහ මාධ්‍ය අයිතිවාසිකම් ක්‍රියාකාරික තරිඳු උඩුවරගෙදරට පහර දීම සහ හිතුවක්කාර ලෙස අත් අඩංගුවට ගැනීම ජාතික සහ ජාත්‍යන්තර කණ්ඩායම්වල තදබල විවේචනයට ලක් විය. එක් අවස්ථාවක ජනමාධ්‍යවේදීයෙකුට තම මූලාශ්‍රය හෙළි කිරීමට පොලීසියෙන් බලපෑම් එල්ල විය. ජනමාධ්‍යවේදීන්ට සමහර ප්‍රදේශවලට සහ ස්ථානවලට පිවිසීමට බාධා කළ සහ අවසර ලබා නොදුන් අවස්ථා ගණනාවක්ම තිබිණ. පොලිසිය සමහර විට ආණ්ඩුවෙන් නිකුත් කරන ලද හැඳුනුම් පත ඉදිරිපත් කරන මෙන් ජනමාධ්‍යවේදින්ගෙන් ඉල්ලා සිටියේය. වෙබ් අඩවි ජනමාධ්‍යවේදීන් බොහොමයකට එම හැඳුනුම් පත් ලැබී නැත.

රූපවාහිනි වැඩ සටහනකට විරුද්ධව පාර්ලිමේන්තු යෝජනාවක් සම්මත කළ අතර වෙනත් රූපවාහිනී නාලිකාවක් ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණය කරන්නේයැයි විමර්ශනය කිරීමට පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලදී. ජනමාධ්‍යවේදීන් තිදෙනෙකු බෞද්ධ භික්ෂුවකගේ නායකත්වයෙන් යුත් මැර කණ්ඩායමක් විසින් රඳවා ගෙන ඔවුන්ගේ කැමරාවල තිබූ විස්තර මකා දැමීමට බල කළහ.

මේ අතර දශකයකට පෙර මරා දමන ලද ජනමාධ්‍යවේදීන් අනුස්මරණ කිරීමට සහ ඔවුන් වෙනුවෙන් යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. අතුරුදහන් කළ ජනමාධ්‍යවේදි ප්‍රගීත් එක්නැලිගොඩගේ නඩුවට අදාල තවත් දුර කතන අංක අටක් අධිකරණයට ඉදිරිපත් කරන ලදී. වසර පහළොහක නිහැඬියාවෙන් පසුව රජයේ රූපවාහිනී සංස්ථාවේ ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කිරීම සම්බන්ධයෙන් හිටපු ඇමති

මර්වින් සිල්වාට එරෙහි නඩුව විභාගයට ගෙන ඇත. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ආරක්ෂක අමාත්‍යාංශයේ අවසරය නොලැබීම නිසා ප්‍රවෘත්ති වෙබ් අඩවියක් ලියා පදිංචි නොකිරීමෙන් ජනමාධ්‍යවේදියෙකුගේ අයිතිවාසිකම් කඩකර ඇතැයි මානව හිමිකම් කොමිසම තීරණය කෙළේය.

මුලතිවු මහේස්ත්‍රාත් උසාවිය 2019 අප්‍රේල් මස යාපනයේ ජනමාධ්‍යවේදියෙකු වන ෂම්මුගන් තවසීලන් ට තර්ජනය කිරීම සම්බන්ධයෙන් නාවික හමුදාවේ බුද්ධි නිලධාරියෙකු කැඳවන ලදී. තොරතුරු ලබා ගැනීමේ කොමිසමෙන් නියෝගයක් නිකුත් කළ නමුත් ජනමාධ්‍යවේදි සහ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වන තරිඳු ජයවර්ධනට පසුගිය වසරේ දිනක පොලීසියෙන් පහර දීම සම්බන්ධයෙන් කෙරෙන පරීක්ෂණවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට පොලිසිය අපොහොසත් විය. ජනමාධ්‍යවේදියෙකුට පහර දීම ගැන බිංගිරිය පොලීසියේ ස්ථාන භාර නිලධාරිට එරෙහිව විමර්ශනයක් පවත්වන්නැයි ඉල්ලා ප්‍රදේශයේ ජනමාධ්‍ය අයිතිවාසිකම් කණ්ඩායමක් පොලීසියට ලිපියක් භාර දුන්හ.

රැස්වීමේ නිදහස: සාමකාමී එකතුවීම් සහ රැස්වීම් සංවිධානය කළ බොහෝ දෙනෙකුට තර්ජන, බියවැද්දීම්, අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීම් ඇතුළත් පලිගැනීම්වලට දිගටම මුහුණ දීමට සිදු විය. වෘත්තීය සමිති, ශිෂ්‍ය ක්‍රියාකාරිකයන්, දේශපාලන පක්ෂ සහ වෙනත් අය පවත්වන ලද නොයෙකුත් විරෝධතා සහ පෙළපාලි ගණනාවකට අඩුම වශයෙන් වැළැක්වීමේ නියෝග 16ක් නිකුත් කර තිබිණ. මහාවීර දිනය සැමරීමට ඉදි කරන ලද ස්මාරකයක් අධිකරණ නියෝගයක් මත පොලීසියෙන් කඩා බිඳ දමන ලදී. උතුරු නැගෙනහිර සිවිල් සමාජ සංවිධානය කළ අනුස්මරණ උත්සවවලට එරෙහිව පොලීසියෙන් ඉල්ලා සිටි තහනම් නියෝග ඉඳහිට අධිකරණයෙන් ප්‍රතික්ෂේප කෙරිණ. පොලීසියෙන් කඳුලු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීමෙන් අඩුම වශයෙන් විරෝධතා 21ක් විසිරුවා හරින ලදී. එම විරෝධතා 21න් 17ක්ම සංවිධානය කරන ලද්දේ ශිෂ්‍ය ක්‍රියාකාරීන් විසිනි. අනෙක් ඒවා සංවිධානය කර තිබුණේ සිවිල් සමාජ ක්‍රියාකාරිකයන්, වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂවලිනි. තවත් විරෝධතා සහ රැස්වීම් 10 කට පමණ පොලීසියෙන් බාධා කළ අතර තවත් කීපයකට සිංහල බෞද්ධ ජාතිවාදී කණ්ඩායම් විසින් බාධා කරන ලදී.

පොලීසිය කිරි ගොවීන් සංවිධානය කළ විරෝධතාවයකට පහර දී විසුරුවා හරින ලද අතර දේශපාලන පක්ෂයක් සංවිධානය කළ විරෝධතාවයක් විසුරුවා හැරීමට ගත් උත්සාහයේ දී 28 කට තුවාල සිදු වූ අතර පුද්ගලයෙකු මිය ගියේය. කොළඹ විශ්වවිද්‍යාලයේ සේවකයෙකු වන ප්‍රියන්ත වන්නිනායක කඳුලු ගෑස් වැදීමෙන් මිය ගියේය.

වසර පුරාම පැවති විරෝධතා සහ පෙළපාලිවල දී විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීම් සහ කඳුලු ගෑස් ගැසීම සිදු විය. උතුරු පළාතේ වසර පුරාම පැවති නොයෙකුත් පෙළපාලිවලදී පුද්ගලයන් 100 කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් අයගෙන් අඩුම වශයෙන් 30ක් උතුරු පළාතෙන් වන අතර නැගෙනහිර පළාතේ ක්‍රියාකාරිකයන් 8 දෙනෙකු ද අත්අඩංගුවට ගෙන ඇත. සාමකාමී රැස්වීම්වලට සහභාගිවීම ගැන ක්‍රියාකාරිකයන් 10 ක් පමණ පොලිසියට කැඳවා ප්‍රශ්න කරන ලදී.

ක්‍රියාකාරිකයන් සහ තොරතුරු හෙළිකරන්නන් මර්දනය: මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් කීපදෙනෙකුම තම වැඩ කටයුතු නිසා හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීම්, රඳවා ගැනීම් සහ වෙනත් ආකාරයේ පලිගැනීම්වලට ලක් වූහ. 2022 ජනතා අරගලයට සම්බන්ධ ක්‍රියාකාරිකයෙකු සහ ගොවි නායකයන් දෙදෙනෙකුට පහර දී ඇත. මඩකලපුවේ සිවිල් සමාජ සංවිධානයක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු දෙමළ ජනසාතන දින අනුස්මරණය කිරීම නිසා අත්අඩංගුවට ගෙන ඇත. මානව අයිතිවාසිකම් නීතිඥයෙකුට මරණ තර්ජන එල්ල වී ඇත. අතුරුදහන් කිරීම්වලට එරෙහි ක්‍රියාකාරිකයෙකු ට අපහාස වන පත්‍රිකා මඩකලපුව නගරයේ ප්‍රදර්ශනය කර ඇත.

මර්දනකාරී නීති සහ ප්‍රතිපත්ති පියවර: ප්‍රකාශන නිදහස සහ වෙනත් අයිතිවාසිකම් කෙරේ බරපතල බලපෑමක් වන ප්‍රති-ත්‍රස්ත පනත, මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත සහ උසාවියට, විනිශ්චය සභාවකට හෝ ආයතනයකට අපහාස කිරීම පිළිබඳ පනත යන පනත් කෙටුම් පත් තුන ජුනි සහ සැප්තැම්බර් මාසවල ගැසට් කරන ලදී. මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනතේ දඬුවම් කළ හැකි වැරදියැයි දැක්වෙන සමහර කරුනු අපැහැදිලි සහ පුළුල් අර්ථයෙන් යුතු අතර විධිමත් සංවරණ සහ තුලන ක්‍රමයකින් තොරව විධායක ජනාධිපති පත් කරන ලබන ආයතනයකින් අනවශ්‍ය සහ ප්‍රමාණය ඉක්මවා යන දඬුවම් නියම කෙරේ. ප්‍රති-ත්‍රස්ත පනතේ ද අපැහැදිලි සහ පුළුල් අර්ථ ඇති යෙදුම් ඇතුළත් වන අතර රක්ෂිත බන්ධනාගාර ගත කිරීම්, දීර්ඝ කිරීම ඇතුළත් චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව රඳවා ගැනීමට බලය පැවරේ. විධායක ජනාධිපතිට අසීමිත බලයක් ලැබෙන අතර පොලිස් බලතල පුළුල් කෙරේ. යෝජිත විකාශන නියාමන කොමිසම් සභා පනතින් ප්‍රකාශන අයිතිවාසිකමට බරපතල නිෂේධාත්මක බලපෑමක් ඇති කෙරේ. මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතර සිවිල් සමාජයෙන් නැගුණු බරපතල විරෝධය නිසා අනෙක් පනත් දෙක නතරව ඇත. හමුදාකරණ ප්‍රවනතාවය අනුව වසර පුරාම හමුදාවට විශේෂ බලතල ලබා දෙන ගැසට් නිවේදන මාසිකව නිකුත් කෙරිණ. වෘත්තීය සමිති පියවර වැළැක්වීමට සහ අධෛරය කිරීමට සමහර සේවා අත්‍යාවශ්‍ය බවට ප්‍රකාශ කරන ලදී. සමාජයීය වගකීමක් ඇති ව්‍යාපෘතියකට වරාය අධිකාරියට භාර දුන් බව පවසමින් 2002 ජනතා විරෝධය සඳයා යොදා ගත් ගාලු මුවදොර පිට්ටනියේ කිසියම් විරෝධතාවයක් පැවැත්වීම වැළැක්වීමට පියවර ගෙන තිබිණ. පෙබරවාරි මස රෝගීන්

ගේ මානසික තත්වයට අහිතකර සේ බලපාන්නේයැයි පවසමින් රෝහල්වල සහ සෞඛ්‍ය ආයතනවල කලු කොඩි ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීමේ චක්‍රලේඛයක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කෙළේය. ළමා මන්දපෝෂණය පුදුම සහගත අනුපාතයකින් ඉහළ යන බව ප්‍රකාශ කිරීම නිසා වෛද්‍යවරයෙකුගේ වැඩ තහනම ශ්‍රේෂ්ඨාධිකරණය අනුමත කිරීම හුවා දක්වමින් තම දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ අනුමැතියකින් තොරව සෞඛ්‍ය සේවකයන්ට මාධ්‍යයට අදහස් ප්‍රකාහ කිරීම තහනම් කෙරෙන තවත් චක්‍රලේඛයක් සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කෙළේය. 2022 අප්‍රේල් මස රඹුක්කන දී විරෝධතාකරුවන්ට වෙඩි තැබූ පොලිස් නිලධාරීන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට මානව හිමිකම් කොමිසම නිර්දේශ කිරීම හෙළා දකිමින් ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව ආරක්ෂක රාජ්‍ය ඇමතිට ලිපියක් ඉදිරිපත් කෙළේය. ජාතික සාම මණ්ඩලය ජාතික එකමුතුව සහ සන්හිඳියාව කාර්යාලයට ( ONUR) නව පනතින් දේශීය සිවිල් සමාජ සංවිධාන පවත්වා ගෙන එන සාමය සහ සන්හිඳියාව වැඩ සටහන් අධීක්ෂණයට සහ පහසුකරණයට ලබා දී ඇති බලතල පිළිබඳව සිය කණස්සල්ල ප්‍රකාශ කරන ප්‍රකාශයක් නිකුත් කෙළේය.

රාජ්‍ය නිලධාරීන් මර්දනය කිරීම: ප්‍රකට දේශපාලකයන් සහ රාජ්‍ය නිලධාරීන් පරීක්ෂණවලට කැඳවීමේ දී අනෙකුත් සාමාජිතයන්ගේ අදහස් නොසලකා සභාපතිනිය සිය අභිමතාර්ථය අනුව කටයුතු කරන්නේ යැයි චෝදනා කරමින් මානව හිමිනම් කොමිසමේ කොමසාරිස්වරුන් තිදෙනෙකු ජනාධිපතිට ලිපියක් යවා ඇත. උසස් පෙළ විභාගය පැවැත්වෙන සමයේ බාධාවකින් තොරව විදුලිය සැපයුම ලබා දීමට නියෝගයක් නිකුත් කිරීමෙන් විදුලි බල මණ්ඩලයේ අනුමැතිය බලහත්කාරයෙන් ලබා ගැනීම ගැන නීතිමය පියවර ගැනීමට තමා උපදෙස් ලබා ගන්නා බව බලශක්ති ඇමති කන්චන විජේසේකර පැවසුවේය. රාජකාරියෙන් බැහැරව සිටි පොලිස් නිලධාරියෙකු සාමාන්‍ය ඇඳුමෙන් වාමාංශික දේශපාලන පක්ෂයක් සංවිධානය කළ විරෝධතාවයකට සහභාගිවීම නිසා වැඩ තහනමට ලක් වූයේය. මහජන උපයෝගිතා කොමිසමේ සභාපති ජනක රත්නායක එම තනතුරෙන් ඉවත් කිරීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවෙන් සම්මත විය. පසුව ඔහුට මරණ තර්ජනය කෙරෙන ඇමතුම් ගණනාවක් ලැබී ඇත. ඔහු තනතුරෙන් ඉවත් කිරීමට පෙර ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණය කරන්නේයැයි පොලිසිය ඔහුගේ කාර්යාලය කඩා වැදිණ.

අලුතින් පන්සලක් ඉදිකිරීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා බෞද්ධ භික්ෂූන් කණ්ඩායමක් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට තර්ජනය කළහ. කුරුන්තමලෙයි පුරාවිද්‍යාත්මක ස්ථානයේ ආගමික කටයුතු පැවැත්වීමට හින්දූන්ට ඉඩ දීම නිසා මහෙස්ත්‍රාත් මාරු කරන මෙන් පාර්ලිමේන්තු මංත්‍රී කෙනෙකු ඉල්ලා සිටියේය. රිය අනතුරකින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ෂානි අබේසේකර මරා දැමීමට කුමන්ත්‍රණයක් පවතින බව ට අභියාචනාධිකරණය දැනුවත් කර ඇත. අබේසේකර

ජනමාධ්‍යවේදීන් සහ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ට එරෙහි අපරාධ ඇතුළත් විවාදාත්මක විමර්ශන ගණනාවක්ම සිදු කෙළේය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ගේ උපදෙස් අනුව අරගල සමයේ ජනාධිපති කාර්යාලයේ තිබී අරගලකරුවන් සොයා ගත් මුදල් ප්‍රමාණය ඇමතිට භාර නොදී උසාවියට භාර දීම සම්බන්ධයෙන් පොලීසියේ විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඩී ඇස් වික්‍රමසිංහට දේශබන්දු තෙන්නකෝන් තර්ජනය කෙළේය. ජාතික ජනබලවේග පක්ෂය සමග දේශපාලන කටයුතුවල යෙදීම නිසා ශ්‍රී ලකා ගුවන් හමුදාවේ හිටපු හමුදා නිලධාරීන් අසාදු ලේඛන ගත කර ඇතැයි එම පක්ෂය වාර්තා කෙළේය.

පළාත් පාලන ඡන්ද විමසීම: ආණ්ඩුව අවශ්‍ය කරන අරමුදල් ලබා නොදීම නිසා පළාත් පාලන ඡන්ද විමසීම දින නියමයක් නැතිව කල් දමන ලදී. කොමිසමේ සාමාජිකයන් තිදෙනෙකුට සිය තනතුරුවලින් ඉල්ලා අස්වීමට බල කරමින් මරණ තර්ජන නිකුත් කර ඇත. පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් කැබිනට් තීරණයක් අනුව අපේක්ෂකයන්ගෙන් ඇප මුදල් භාර නොගන්නා ලෙස දන්වා ලිපියක් නිකුත් කෙළේය. ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය නිසා පළාත් පාලන ඡන්ද විමසීම නතර කිරීමට විශ්‍රාමික හමුදා නිලධාරියෙකු රිට් ආඥාවක් ලබා ගැනීමට පෙත්සමක් ගොනු කෙළේය. මූල්‍ය අර්බුදය නිසා මුදල් ඇමති වශයෙන් ජනාධිපති වික්‍රමසිංහ මැතිවරණ වියදම් හැර අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා වියදම් සීමා කිරීමට ආණ්ඩුවට චක්‍රලේඛයකින් උපදෙස් දුන්නේය. ඒ අනුව මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ ලේකම් පළාත් පාලන ඡන්ද විමසීම සඳහා අවශ්‍ය අරමුදල් නිකුත් කිරීමේ අසීරුතාවය ජාතික මැතිවරණ කොමිසමට දැන් වූයේය.

වෙනත් සිද්ධීන්: සමහර වෘත්තීය සමිති සහ ශිෂ්‍ය සංගම් රටේ ආර්ථිකය අස්ථාවර කිරීමට උත්සාහ ගන්නා නිසා ඔවුන් ත්‍රස්තවාදීන් ලෙස හැඳින්විය යුතුයැයි රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න කීවේය. තම ස්ථාවරය වෙනස් කිරීම පිළිබඳව විරෝධය පළ කිරීමට මහජන උපයෝගිතා කොමිසමට ගිය වෘත්තීය සමිති නායකයන් දෙදෙනෙකු කොමිසමේ සාමාජිකයන්ට තර්ජනය කෙළේයැයි අත්අඩංගුවට ගෙන ඇත. මාධ්‍යවේදී සේපාල් අමරසිංහ මහනුවර දළදා මාලිගාව ගැන අපහාසාත්මක ප්‍රකාශයක් සිදු කෙළේයැයි අත්අඩංගුවට ගෙන ඇත. ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පැවති දිනවල ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බලහත්කාරයෙන් ඇතුලු වූයේයැයි රන්දිමාල් ගමගේ සිරභාරයට ගෙන ඇත. සමාජ ක්‍රියාකාරික චිරන්තන අමරසිංහ තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමට අයැදුම් පතක් භාර දීමට රාජ්‍ය බුද්ධි සේවයට පැමිණි විට අත් අඩංගුවට ගෙන පොලීසිය විසින් වධහිංසාවන්ට ලක් කෙළේයැයි වාර්තා වේ. විරෝධතා මර්දනය කිරීමට පොලීසිය යොදා ගන්නා කල් ඉකුත් වූ කඳුලු ගෑස්වලට නිරාවරණය වීමෙන් බරපතල සෞඛ්‍ය තත්වයන්ට මුහුණ දිය හැකි බව හෙළි විය. පොලීසිය එම චෝදනාව

ප්‍රතික්ෂේප කරයි. වැඩ නිමවී ආපසු පැමිණෙමින් සිටි නීතිඥයෙකුට පුද්ගලයින් දෙදෙනෙකු පහර දී ඇත. තම කවිවලින් අන්තවාදය ප්‍රචාරය කරන්නේයැයි අසාධාරණ ලෙස අත්අඩංගුවට ගෙන වසරකට අධික කාලයක් සිර ගත කොට සිටි අහ්නාෆ් ජසිම් කවියා ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයෙකු සේ නම් කර ලැයිස්තු ගත කර ඇත. උතුර සහ නැගෙනහිර බෞද්ධ පන්සල් තැනීමට එරෙහිව පෙනී සිටි පාර්ලිමේන්තු මංත්‍රීවරයෙකු ගේ නිවස සිංහල ජාතිවාදී දේශපාලකයන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් පිරිසක් වටලා ගත්හ. උතුර සහ නැගෙනහිර බෞද්ධ පන්සල්වලට හානි කරන්නන්ගේ හිස ගසා දමන බවට තවත් හිටපු පාර්ලිමේන්තු මංත්‍රීවරයෙකු තර්ජනය කෙළේය.

රාජ්‍ය නොවන සංවිධාන කාර්යංශයේ ලියාපදිංචි නොවූ රාජ්‍ය නොවන සංවිධාන ඉදිරියේ දී තහනම් කරන බවට මහජන ආරක්ෂක ඇමති තර්ජනය කෙළේය. තම ජීවිතයට ඇති තර්ජන නිසා මුලතිවු දිස්ත්‍රික් විනිසුරු සහ මුලතිවු වැඩ බලන මහෙස්ත්‍රාත් ටී සරවනරාසා තම තනතුරෙන් ඉල්ලා අස්වී රටින් පිටව ගියේය. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන්කරුවෝ පක්ෂයේ ( Crusaders for Democracy Party )උප සභාපති එන් නගුලේස් එල්ටිටීර්යේ මිය ගිය කාර්යධරයන්ගේ පවුල්වලට ආහාර ලබා දිම නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබිණ. මුහුණු පොතේ පිටුවක් පවත්වා ගෙන යන සහ පූස් බුද්ධ නම් සංවිධානයේ සාමාජිකයෙකුයැයි කියන තරුණයෙකු බුද්ධාගමට අපහාස කෙළේයැයි සිරභාරයට ගෙන ඇත.

# 2. සමස්ත දැක්ම

ආර්ථික අර්බුදය

ශ්‍රී ලංකාවේ 2022 විදෙස් ණය ආපසු ගෙවීමේ අර්බුදයෙන් පසුව අන්තර්ජාතික මූල්‍ය අරමුදල රටේ ආසන්නතම ආර්ථික හානියෙන් ගොඩ ඒමට ඇ.එ.ජ. ඩොලර් බිලියන 3ක ගලවා ගැනීමේ ණය මුදලක් ශ්‍රී ලංකාවට ලබා දුන්නේය. ලෝක ආහාර වැඩ සටහන පවසන ආකාරයට ජීවන මට්ටම සහ මානව අයිතිවාසිකම් දුර්වල කරන ආණ්ඩුවේ සහ අන්තර්ජාතික මූල්‍ය අරමුදල ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ගත් පියවර නිසා වයස අවුරුදු පහට අඩු ළමයින්ගෙන් 31% හා ජන සංඛ්‍යාවෙන් 17% අධික ප්‍රමාණයක් මධ්‍යම හෝ බරපතළ ආහාර අනාරක්ෂිත තත්වයක පසුවේ[1].

ආර්ථික අර්බුදය නිසා රටේ දරිද්‍රතා අනුපාතය 25% දක්වා වැඩි වූ අතර එය ඉදිරියේ දී තවත් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකව ණය ගෙවීම පැහැර හැරීමෙන් [2]පසු 2022 අප්‍රේල් මස රට තුළ ඇති වූ වැඩි වන ආර්ථික අර්බුදය විසඳීමේ පියවරක් වශයෙන් 2023 මාර්තු 20 අන්තර්ජාතික මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාවට ඩොලර් බිලියන 3 ක ණය මුදලක් අනුමත කෙළේය.[3] අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ අනුමැතිය නිසා ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි බහුපාර්ශ්වීය ආයතනවලට නව ණය මුදල් ලබා දීමට අවස්ථාවක් උදා විය. හියුමන් රයිට්ස් වොච් සංවිධානය පවසන ආකාරයට ආණ්ඩුවේ ආදායම් වැඩි කිරීම, දූෂණය වැළැක්වීම සහ සමාජ සුභ සාධනය වැඩි කිරීම ප්‍රමුඛතා සේ හඳුනා ගෙන ඇති නමුත් එය සැලසුම් කර ඇති ආකාරයට වැඩි බරක් පැවරුණේ  අඩු ආදායම් ලබන අය මතය. ඔවුන්ගේ සමාජ සහ ආර්ථික අයිතිවාසිකම් බාදනයට ලක් විය. නිදසුනක් වශයෙන් අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ගිවිසුම අනුව ආණ්ඩුව වටිනාකම් මත අය කරන බදු මුදල් වැඩි කිරීම, ඉන්ධන සහනාධාර ක්‍රම ක්‍රමයෙන් කපා හැරීම සහ විදුලි ගාස්තු වැඩි කිරීම වැනි පියවර ගත් අතර ඒ සියල්ල ජීවන වියදම වැඩි වීමට හේතු විය. ප්‍රතිසංස්කරණ යෝජනාවලියක කොටසක් වශයෙන් සමාජ වියදම්වල අවම මට්ටමක් පවත්වා ගැනීමට ද.දේ.නි යෙන් 0.6% ඒ සඳහා වෙන් කිරීමට අනුමැතිය ලැබුණ ද එය සංවර්ධිත රටවල 1.6%ට වඩා අඩුය. පුමාණවත් ජීවන මට්ටමක් නැති බොහෝ දෙනෙකු ආණ්ඩුවේ ඉලක්ක ගත සමාජ ආරක්ෂක ප්‍රතිලාභ වැඩ සටහනට ඇතුළත් වූයේ නැත. තදබල විරෝධයක් තිබුණ ද ආණ්ඩුව නව සමාජ ආරක්ෂණ වැඩ සටහන වූ අස්වැසුම සඳහා ඉල්ලුම් පත් දශලක්ෂයක් පමණ භාර ගත්තේය. පුද්ගලයන්ගේ ආර්ථික තත්වය මත පදනම් සමාජ ආරක්ෂණ වැඩසටහනක් වූ අස්වැසුමෙන් වැරදීම්, කපා හැරීම්, දූෂණය සහ සමාජ විශ්වාසය බිඳ වැටීම වැනි තත්වයන්ට හේතු විය හැකි බව විචේචකයෝ පෙන්වා දෙති.

මාස ගණනාවක් පැවති විරෝධතා නිසා ඔහුගේ පූර්වගාමියා වූ ගෝඨාභය රාජපක්ෂට ආණ්ඩුව අතහැර යෑමට සිදු විය. විරෝධතාවය මැඩීමට ජනාධිපති වික්‍රමසිංහ තහනම් කර තිබූ දරදඬු නීතියක් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යළි ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගත්තේය. දැනට ඉදිරිපත් කර ඇති ප්‍රති-ත්‍රස්ත පනතින් භාෂණයට අදාල චෝදනා ඇතුළත් කර ඇති අතර ජනාධිපතිට, හමුදාවට සහ පොලීසියට අලුතින් පුලුල් බලතල ලබා දේ. යෝජිත වෙනත් පනත්වලින් අන්තර්ජාලයේ ප්‍රකාශන නිදහස තව දුරටත් සීමා කෙරේ.

---

1 https://www.hrw.org/world-report/2024/country-chapters/sri-lanka
2 https://www.imf.org/en/News/Articles/2023/03/20/pr2379-imf-executive-board-approves-under-the-new-eff-arrangement-for-sri-lanka?cid=em-COM-123-46270
3 https://www.imf.org/en/News/Articles/2023/03/20/pr2379-imf-executive-board-approves-under-the-new-eff-arrangement-for-sri-lanka?cid=em-COM-123-46270

යුද සමයේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය, වගවීම සහ යුක්තිය

1983 සිට 2009 දක්වා පැතිරී ගිය සිවිල් යුද්ධයෙන් වැඩියෙන්ම බැට කෑ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල කුරිරු ලෙස මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වල වින්දිතයෝ, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයෝ සහ ක්‍රියාකාරිකයෝ තවමත් පොලිසියේ සහ බුද්ධි අංශවල සෝදිසියට සහ හිරිහැර කිරීම්වලට ලක්වෙති.[4] 2009 සිවිල් යුද්ධය නිමා වීමෙන් පසුව රජයේ සන්නද්ධ හමුදා විසින් හිටපු එල්ටීටීඊ සටන්කරුවන් සහ සාමාන්‍ය දෙමළ ජනතාව නීතියෙන් පරිබාහිරව මරාදැමීම සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇතැයි හියුමන් රයිට්ස් වොච් වාර්තා කරයි. අතුරුදහන් වූවන් සෙවීමට ස්ථාපනය කරන ලද අතුරුදහන් වූවන් පිළිබඳ ආණ්ඩුවේ කාර්යාලය ද මේ ගැන ලබා ඇත්තේ ඉතා සුලු ප්‍රගතියක් පමණක්යැයි ද එම වාර්තාවේම සඳහන් වේ.[5] 2023 අප්‍රේල් මස නිකුත් කළ එක්සත් ජාතින්ගේ වාර්තාවක හානිපූරණ කාර්යලය සහ අතුරුදහන් පුද්ලයන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම සහ ක්‍රියාත්මකවීම සැලකිල්ලට ගෙන ඇති අතර ඒවායේ ප්‍රගතියක් නොමැතිවීම ගැන සහ බලහත්කාරයෙන් අතුරුදහන් කළ පුද්ගලයන් සිටින තැන් සහ ඔවුන්ගේ ඉරණම සොයා බැලීමට පියවර නොගැනීම ගැන කනස්සල්ල පළ කරයි. වඩාත් වැදගත්ව මෙම ආයතනවලට පත් කර ඇති පුද්ගලයන් ඊට පෙර මානව අයිතිවාසිකම් කඩ කිරීම සහ චෝදනා ගොනු කර ඇති නඩුවලට මැදිහත්වීම් පිළිබඳව චෝදනා මතුව ඇති නිසා වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල් යුක්තිය ලබා ගැනීමට ඉදිරිපත්වීමට පසුබට වන බවද සඳහන් කරයි.[6] හිටපු සටන්කරුවන් 2018 අංක 34 හානිපූරණ කාර්යාලය පනත යටතේ සමාජ සේවා වැඩ සටහන්වලින් ආවරණය වන අතර හානිපූරණය ලබා ගත හැකි බවත් රාජ්‍ය පාර්ශ්වය පවසන නමුත් මෙම මූලාශ්‍රවලට සහ සෞඛ්‍ය රැකවරණය වැනි වෙනත් සේවාවන් ලැබෙන්නේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි බවද එම වාර්තාවේ සඳහන් වේ.

ගැටුම් පැවති කාලයේ සිදු කරන ලදැයි කියන මානව අයිතිවාසිකම් අල්ලංඝනය කිරීම් පිළිබඳව චෝදනා ගොණු කිරීමට දීර්ඝ කාල පරිච්ඡේදයක් ගතවීම ගැන සිය කනස්සල්ල පළ කරන බව එක්සත් ජාතින්ගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ ශ්‍රී ලංකාව පිළිබඳ හයවැනි කාලාන්තර වාර්තාවේ අවසානාත්මක නිරීක්ෂණවල සඳහන් වේ. යුද අපරාධ පිළිබඳ තදබල සාක්ෂි පැවතිය ද 2006 සහ 2009 අතර කාල පරිච්ඡේදයේ හමුදා මෙහෙයුම් නිසා සාමාන්‍ය ජනතා මරණ සිදුව නැතැයි ශ්‍රී ලංකා යුද හමුදාව පත් කරන ලද පරීක්ෂණ උසාවිය සඳහන් කරන බව ද එම වාර්තාව කියයි. වවුනියාව ජෝසප් කඳවුරේ ක්‍රමානුකූලව වධහිංසා පැමිණවීම සහ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ චෝදනා ගැන මෙතෙක් විමර්ශනය කර නැත. නීති සහ විමර්ශන ක්‍රියා පටිපාටිවලට දේශපාලන සහ හමුදා නිලධාරීන් ගේ මැදිහත්වීමේ සහ බාධා කිරීමේ ආරංචි පිලිබඳව ද කොමිටිය සැක සංකා මතු කර ඇත. 2008 සහ 2009 දී නාවික හමුදාවේ නිලධාරීන් දෙමළ පුද්ගලයන් 11ක් පැහැර ගෙන යෑම සහ නඩරාජා රවිරාජ් සහ ජෝසප් පරරාජසිංහම් යන දෙමළ පාර්ලිමේන්තු මංත්‍රීන් දෙදෙනා ඝාතනය කිරීම වැනි ප්‍රකට සිද්ධීන් කිපයක් පිළිබඳව දේශපාලන පලිගැනීමේ පරීක්ෂණ කොමිසමේ නිර්දේශ ගැන ද විශේෂයෙන් කනස්සල්ල පළ කර ඇත. ගැටුම් පැවති සමයේ යුද අපරාධ පිළිබඳව චෝදනා ලැබ සිටි හමුදා නිලධාරීන්ට පත්වීම් සහ නැවත නැවතත් උසස්වීම් ලබා දීමෙන් ඔවුන්ට මුක්තියක් ඇති බවට වාතාවරණයක් නිර්මාණය වීම පිළිබඳව ද විශේෂ අවධානයක් යොමුව ඇත.

---

[4] https://www.hrw.org/news/2023/05/16/still-no-justice-sri-lanka-war-anniversary
[5] https://www.hrw.org/news/2023/05/16/still-no-justice-sri-lanka-war-anniversary
[6] http://www.omp.gov.lk/contact/our-offices

ආණ්ඩුව දෙමළ සහ මුස්ලිම් ජනතාවගේ දේපොළ සහ පූජාස්ථාන බලයෙන් අත්පත් කර ගෙන ඇත.[7] මුලතිවු දිස්ත්‍රික් විනිසුරු හින්දු පූජාස්ථානයක බෞද්ධ පන්සලක් ඉදි කිරීමට විරුද්ධව නියෝගයක් ලබා දීමෙන් පසුව තනතුරෙන් ඉල්ලා අස්වී සැප්තැම්බර් මස රටින් පිටව ගියේය.[8] එම නඩු තීන්දුව නිසා ඔහුට මරණ තර්ජන එල්ල වී තිබිණ.

ජාතික සීමා ඉක්මවා කරන ලද අපරාධ පිළිබඳ සාක්ෂි පශ්චාත් කාලීනව නඩු පැවරීමේ අරමුණෙන් රැස් කිරීමට 2021 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘති යෝජනාව[9] 2024 දී නැවත අලුත් කිරීමට එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලය තීරණය කිරීමට නියමිතය. යෝජිත සත්‍යය කොමිසම නිසා කිසියම් විමර්ශනයක් කිරීමේ අවශ්‍යතාවයක් නැති බව ආණ්ඩු තේරුම් ගනු ඇතැයි ජනාධිපති රනිල් වික්‍රමසිංහ ගේ කාර්යාලය සිය බලාපොරොත්තුව පළ කෙළේය.

ප්‍රකාශනයේ සහ රැස්වීමේ නිදහස

ආණ්ඩුව සැප්තැම්බර් මස නොමග යවන, තර්ජනාත්මක, බියවද්දන හෝ කලබලයට පත් කරවන වචන මාර්ගගතව ප්‍රකාශ කිරීම වැළැක්වීමේ අදහසින් මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත ප්‍රකාශයට පත් කෙළේය. මෙය නිදහස් ප්‍රකාශනය තවදුරටත් සීමා කරනු ඇතැයි විවේචකයෝ පවසති.[10]

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිටියේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාවේ සාමකාමී රැස්වීම් විසුරුවා හැරීමට පොලිස් බලය අසීමිතව යොදා ගැනීම, විරෝධතා මර්දනය කිරීමට ත්‍රස්තවිරෝධී නීති යොදා ගැනීම සහ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට එරෙහිව මහා පරිමාණයේ විරෝධතා පැවැත්වෙන විට සාමාන්‍ය ජනතාවට සමාජ මාධ්‍යයට පිවිසීම බාධා කිරීම ඇතුළත් අදහස් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස කෙරේ දැඩි සීමාවන් පැනවීමක් සිදුවන බව සඳහන් වේ. විශේෂයෙන්ම උතුර සහ නැගෙනහිර රැස්වීමේ සහ ප්‍රකාශනයේ අයිතිවාසිකම දැඩි ලෙස සීමා කෙරේ.[11] බලධාරීන් දිගින් දිගටම ඉලක්ක කර ගන්නේ මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ සිවිල් සමාජ සංවිධානයි.

ත්‍රස්තවිරෝධි නීති

දේශීය සහ අන්තර්ජාතිකව දැනට භාවිතාවන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදු වන අයථා භාවිතය හෙළා දැකීම නිසා ආණ්ඩුව මානව අයිතිවාසිකම් ගරු කරන නව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් ඉදිරිපත් කරන බවට පොරොන්දු විය. විශේෂයෙන් යුරෝපා සංගමය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමට 2017 ලබා දුන් පොරොන්දුව ඉටු කිරීමට ලංකාවට බලපෑම් කෙළේය. මානව අයිතිවාසිකම් ඉටු කිරීමේ පොරොන්දුව මත යුරෝපා සංගමය ශ්‍රී ලාංකාවට GSP+ වැඩ සටහන යටතේ සිය වෙළඳ පොළට තීරු බදු රහිතව පිවිසීමේ සහනය ලබා දුන්නේය.

[7] https://www.hrw.org/report/2023/09/18/if-we-raise-our-voice-they-arrest-us/sri-lankas-proposed-truth-and-reconciliation

[8] https://www.colombotelegraph.com/index.php/mullaitivu-magistrate-district-judge-resigns-after-death-threats/

[9] https://www.ohchr.org/en/hr-bodies/hrc/sri-lanka-accountability/index

[10] 10 The subsequent developments of this bill are discussed in detail on this report and other reports published by INFORM

[11] 11 https://www.hrw.org/news/2023/09/18/sri-lanka-abuses-undercut-proposed-truth-commission

අලුතින් ඉදිරිපත් කර ඇති යෝජිත ප්‍රතිත්‍රස්ත පනත ශ්‍රී ලංකාවේ පොරොන්දුවලට කිසිසේත් නොගැලපෙන අතර පුරවැසියන්ගේ රැස්වීමේ සහ භාෂණයේ නිදහසට දැඩි සීමා පැනවේ. ආණ්ඩුව නව නීතිය මාර්තු මස ඉදිරිපත් කළ ද මතු වූ ප්‍රබල විරෝධය නිසා 'උපදේශන" ලබා ගැනීමට ඉවත් කර ගන්නා ලදී. නව පනතින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ වඩාත් දූෂිත වගන්ති ඒ ආකාරයෙන්ම පවත්වා ගන්නා අතර අලුතින් එවැනිම දූෂිත වගන්ති එක් ඇතැයි චෝදනා එල්ල විය.[12] එම පනත සැප්තැම්බර් මස වැඩි වෙනස්කමක් නැතිව නැවත ඉදිරිපත් කරන ලදී. ප්‍රති-ත්‍රස්ත පනතේ වෙනස් කිරීම් කිපයක් තිබුණ ද එහි යෙදුම් අපැහැදිලි නිශ්චිත අර්ථ රහිත ඒවාය. එහි අර්ථ ගැන්වීම්වලට නීති විරෝධී නොවන සාමකාමී විරෝධතා පවා ඇතුළත් වන සේ ත්‍රස්තවාදය ගැන ඇති පිළිගත් නිර්වචන කිරීම් ඉක්මවා යයි. මෙම පනතින් අදහස් කරනු ලබන බව පෙනෙන්නේ ජනාධිපතිට, පොලිසියට සහ හමුදාවට සාක්ෂි නොමැතිව පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ විශාල බලතල ලබා දීම සහ පැහැදිලි නිර්වචනය කිරීමක් නැතිව භාෂණය අපරාධයක් කිරීම සහ කිසියම් අධිකරණ ක්‍රියාවලියක් නැතිව උත්සව සහ කණ්ඩායම් තහනම් කිරීමට හැකි වීමය. නැවතත් විවේචන ඉදිරිපත්වීම නිසා ඔක්තෝබර් මස තවත් සංශෝධන ඉදිරිපත් කිරිම සඳහා පනත පාර්ලිමේන්තුවෙන් ඉවත් කර ගන්නා ලදී.[13]

කාන්තා අයිතිවාසිකම්

පහළ ආදායම් ලබන සහ අනතුරුදායක රැකියාවල නියුතු කාන්තාවෝ ආර්ථික අර්බුදය[14] සහ ඊට පෙර කොවිඩ් 19 වසංගතය නිසා බරපතල ලෙස පීඩාවට පත් වූහ.

මුස්ලිම් ප්‍රජාවේ විවාහ නියාමනය වන මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ[15] බොහෝ වගන්තිවලින් කාන්තාවන්ගේ සහ ගැහැනු ළමයින්ගේ අයිතිවාසිකම් දුර්වල කෙරේ. එක වගන්තියකින් අවම වයස තහවුරු නොකර බාල වයස්කාරයින්ට විවාහ වීමට ඉඩ සැලසේ.[16] මෙම පනත අනුව කාන්තාවන්ට කාසි උසාවියක විනිශ්චයකරුවන් විය නොහැකිය. එමනිසා කාන්තාවන්ට වඩා පිරිමින්ට දික්කසාදය පහසුවෙන් ලබා ගත හැකිය. එමෙන්ම විවාහයක් ලියාපදිංචි කිරීමට පෙර කාන්තාවගේ හෝ ගැහැනු ළමයාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය නැත. ඊට අමතරව මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත

---

12 chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/http://documents.gov.lk/files/bill/2023/3/304-2023_E.pdf

13 13 https://www.hrw.org/news/2023/04/07/sri-lanka-reject-new-counterterrorism-bill

14 https://www.thenewhumanitarian.org/photo-feature/2022/09/13/Sri-Lanka-economic-crisis-women-workers-inflation-wages

15 chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/http://www.commonlii.org/lk/legis/consol_act/mad134294.pdf

16 chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/https://www.veriteresearch.org/wp-content/uploads/2018/05/Verit%C3%A9-Brief_Muslim-Marriage-and-Divorce-Act.pdf

යටතේ ලියා පදංචි කළ බාල වයස්තාර විවාහයක් දණ්ඩ නිති සංග්‍රහය යටතේ ව්‍යවස්ථාපිත දූෂණය කිරීමක් සේ සැලකිය හැකිය. [17]

ලොව වඩාත්ම තදබල ගබ්සා නිතියක් වන ශ්‍රී ලංකාවේ 1883 දණ්ඩ නීති සංග්‍රහයේ 303 වගන්තිය[18] අනුව කාන්තාවගේ ජීවිතයට බරපතළ අනතුරක් පවතින අවස්ථාවේ හැර ගබ්සාවක් සිදු කිරීම දීර්ඝ සිර දඬුවමක් නියම කළ හැකි බරපතළ වරදකි.

එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් කොමිටිය ශ්‍රී ලංකාවේ දේශපාලනයේ කාන්තා සහභාගිත්වයේ අඩුව විශේෂයෙන් අවධාරණයට ලක් කර ඇත.

**LGBTIQ+** අයිතිවාසිකම්

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ (1883) 365 සහ 365 අ වගන්ති අනුව ස්වභාවිකත්වයට එරෙහිව ''කාම සංසර්ගයේ යෙදීම'' සහ කිසියම් අසංවර ක්‍රියාවක් වරදකි.[19] දණ්ඩ නීති සංග්‍රහයේ මෙම ප්‍රතිපාදන නිර්වචනය කර නැති නමුත් සම ලිංගික වැඩිහිටියන්[20] අතර අනුමැතියෙන් කෙරෙන ලිංගික සම්බන්ධතා පවා අපරාධ සේ සැලකේ. වැඩි දුරටත් දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය අනුව 'වෙනත් පුද්ගලයෙකු සේ පෙනී සිට වංචා කිරීම'' අපරාධයක් වන අතර පොලිසිය බොහෝ විට මෙම වගන්තිය සංක්‍රාන්ති සමාජ භාවීය පුද්ගලයන් ඉලක්ක කර ගෙන භාවිතා කරයි. අයාලයේ යන්නන් පිළිබඳ ආඥා පනතේ (1842)[21] අවසැරීමේ ප්‍රතිපාදන බොහෝ විට පොදුවේ ස්ත්‍රී පුරුෂ භාවයට නොගැලපෙන සහ **LGBTIQ+** පුද්ගලයන් බියවැද්දීමට, රඳවා තැබීමට සහ ප්‍රශ්න කිරීමට යොදා ගනී. සම ලිංගික සම්බන්ධතා අපරාධයක් කෙරෙන පුද්ගලික මංත්‍රී යෝනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති නමුත් එය තවමත් විවාදයට ගෙන නැත.

---

[17] chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/https://www.veriteresearch.org/wp-content/uploads/2018/05/Verit%C3%A9-Brief_Muslim-Marriage-and-Divorce-Act.pdf

[18] chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/https://www.veriteresearch.org/wp-content/uploads/2018/05/Verit%C3%A9-Brief_Muslim-Marriage-and-Divorce-Act.pdf

[19] https://www.icj.org/sri-lanka-ensuring-equality-and-non-discrimination-for-lesbian-gay-bisexuals-and-transgender-people/

[20] https://www.hrw.org/news/2022/03/23/un-body-condemns-sri-lankas-criminalization-same-sex-acts

[21]

[21] chrome-extension://efaidnbmnnnibpcajpcglclefindmkaj/http://hrlibrary.umn.edu/research/srilanka/statutes/Vagrants_Ordinance.pdf

# 3. නඩු යාවත්කාලීන කිරීම්

2023 ජනවාරි

සන්ඩේ ලීඩර් කතෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීමේ 14 වැනි සංවත්සරය කොළඹ සහ මඩකලපුවේ දී පවත්වන ලදී. ආණ්ඩුවට විරෝධය දක්වන්නන් පුනරුත්ථාපන කඳවුරුවලට යැවීමේ උත්සාහයක් ලෙස තදබල විරෝධයට ලක් වූ පුනරුත්ථාපන කාර්යංශ පනත මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් පුනරුත්ථාපනය සඳහාම වෙන් වූ පනතක් සේ සංශෝධන සහිතව පාර්ලිමේන්තුවෙන් සම්මත කෙරිණ. කෙසේ වුවත් ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය සහ වෙනත් සිවිල් සමාජ සංවිධාන පුනරුත්ථාපන මධ්‍යස්ථාන වදහිංසා පැමිණවීමට සහ හිරිහැර කිරීමට යොදා ගත හැකි බව පෙන්වා දෙති.

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ ත්‍රස්තවාදී චෝදනාවලින් නිදහස් කළ නමුත් වෙනත් නඩු කීපයක් සම්බන්ධයෙන් රඳවා ගන්නා ලදී. අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු පෙරමුණේ කැඳවුම්කරු ගල්වැව සිරිදම්ම හිමි ට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ පෙනී සිටීමට නියෝග කර ඇත.

හිටපු ජනාධිපති සහ එවකට ආරක්ෂක අංශවල සහ පොලිසියේ සිටි උසස් නිලධාරීන්ට පෙර දැනුම් දීම් ලැබී තිබුණ ද පාස්කු ඉරිදා ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත්වීමෙන් වින්දිතයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙළේය. වින්දිතයන්ට වන්දි වශයෙන් රු. දශලක්ෂ 310ක් ගෙවීමට නියෝග කෙරිණ. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් කොටුව මහෙස්ත්‍රාත් නිකුත් කර ඇති සිතාසි ඉවත් කරන මෙන් ඉල්ලා හිටපු ජනාධිපති සිරිසේන ගොනු කර තිබූ රිට් ආඥාවක් ලබා ගැනීමේ අයැදුම් පත ජනවාරි 31 විභාගයට ගැනීමට දින නියම කෙරිණ.

වසර දෙක හමාරකට පෙර දෙමළ රණවිරුවන් සිහිපත් කිරීම නිසා උතුරු පළාත් සභා මංත්‍රී ඇම් කේ ෂිවලිංගම්ට කොළඹ මහාධිකරණයෙන් සිතාසි නිකුත් කරන ලදී.

ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ ව්‍යාපාරයට සම්බන්ධ වූවන්ට ඇප ලබා දීම විවේචනයට ලක් කළ රාජ්‍ය ඇමති සනත් නිශාන්ත අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නීතිපති චෝදනා ගොනු කෙළේය.

2023 පෙබරවාරි

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මාස කීපයක් රඳවා ගෙන සිට නිදහස් කළ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ නිදහස් කිරීමෙන් පසුව ප්‍රකාශයක් කරමින් තමා රඳවා සිටි කාලයේ පොලිස් නිලධාරීන් කීප දෙනකුම තර්ජනය කෙළේයැයි චෝදනා කෙළේය.

2023 පෙබරවාරි 6 කොටුව මහෙස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් වසර තුනකට පෙර 2020 මාර්තු පැවැත් වූ නිහඬ විරෝධතා උද්ඝෝෂණයකට සහභාගිවීමෙන් නීති විරෝධී රැස්වීමේ චෝදනා යටතේ අත් අඩංගුවට ගෙන සිටි ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් විසි දෙනකු ගේ ඇප කොන්දේසි ඉවත් කෙළේය.

2022 ජුලි 9 වැනි දා විරෝධතා දැක් වූ පිරිස් ජනාධිපති මන්දිරයට කඩා වැදී සොයා ගන්නා ලද මුදල් ආපසු තමා වෙත භාර දෙන්නැයි හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ තම නීතිඥයන් මාර්ගයෙන් කළ ඉල්ලීම කොළඹ මහෙස්ත්‍රාත් තිලින ගමගේ ප්‍රතික්ෂේප කෙළේය.

2022 නොවැම්බර් මස ප්‍රධාන විපක්ෂය විසින් සංවිධානය කරන ලද කාන්තාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය ට විරෝධය දැක්වීමේ උද්ඝෝෂණය පිළිබඳව පවත්වන විමර්ශනයේ ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් පොලිසියට නියෝග කෙළේය. එහි දී නීති විරෝධී රැස්වීමේ චෝදනාව යටතේ කාන්තා දේශපාලකයන් 13ක් අත්අඩංගුවට ගෙන තිබිණ.

පළාත් පාලන ඡන්ද විමසීම ට එරෙහිව විශ්‍රාමික හමුදා නිලධාරියෙකු ගොනු කර තිබූ රිට් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාගයට ගත් විට ආණ්ඩුවේ අරමුදල් අත්‍යවශ්‍ය සේවා සඳහා පමණක් බැවින් මැතිවරණය සඳහා අරමුදල් නිකුත් කළ නොහැකියැයි මුදල් අමාත්‍යාංශය අධිකරණයට දැන් වූයේය. නඩුව 2023 මැයි මාසයට කල් දැමිණ.

තම නාම යෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කළ නිසා ඡන්ද විමසීම පැවැත්වීමට එරෙහිව මාතර නගර සභාවේ දේශපාලන කණ්ඩායමක් ඉදිරිපත් කළ රිට් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ප්‍රතික්ෂේප කෙරිණ. ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසරය ලබා නොදීම නිසා තම වෙබ් අඩවිය ලියාපදංචි නොකිරීමෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ජනමාධ්‍යවේදියෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇතැයි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම තීරණය කෙළේය.

2023 මාර්තු

කල් දමන ලද පළාත් පාලන ඡන්ද විමසීම අප්‍රේල් 25 පැවැත්වෙන බව මැතිවරණ කොමිසම ප්‍රකාශ කෙළේය. 2023 අයවැයෙන් පළාත් පාලන ඡන්ද විමසීම සඳහා වෙන් කරන ලද කිසියම් අරමුදලක් මුදල් අමාත්‍යාංශයෙන් රඳවා ගැනීම වළක්වන නියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නිකුත් කෙරිණ. කෙසේ වුවත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝග කළ පරිදි ප්‍රමාණවත් අරමුදල් මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් නොකරනු ඇතැයි මැතිවරණ කොමසාරිස් නිමල් පුංචිහේවා පැවසුවේය. ඡන්ද පත්‍රිකා මුද්‍රණයට ණය පදනමක් යටතේ ලබා ගත් කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය සඳහා ගෙවීම් තවත් ප්‍රමාද කරන්නේනම් සැපයුම්කරු කඩදාසි සහ උපකරණ ආපසු ඉල්ලා සිටිනු ඇතැයි මුද්‍රණයාලාධිපතිනි ගංගානි ලියනගේ පැවසුවාය. මෙය මැතිවරණය තවත් කල් දැමීමේ ප්‍රයත්නයක්යැයි සමහර වෙබ් අඩවිවල සඳහන් විය.

ශ්‍රී ලංකාවේ පොලිසිය පාවිච්චි කරන කඳුලු ගෑස් දශක දෙකකට පෙර කල් ඉකුත් ඒවා බවත් ඒවාට නිරාවරණය වීමෙන් බරපතළ ශ්වසන ආබාධා ඇතිවිය හැකි බවත් ස්වාධීන විමර්ශන වාර්තාවක සඳහන් වේ. 2022 මැයි 9 වැනි දා ගාලු මුවදොර සාමකාමී විරෝධතාකරුවන්ට ප්‍රහාරයක් එල්ල කිරීම වැළැක්වීමට අපොහොසත්වීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලා ගොනු කරන ලද රිට් පෙත්සම අභියාචනාධිකරණයෙන් ඉවත දමන ලදී.

වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහිව නීතිපති ගොනු කරන ලද අභියාචනය කොළඹ මහාධිකරණයේ විභාගයට ගන්නා ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු මුදා හැරීමට මහෙස්ත්‍රාත් උසාවියට අධිකරණ බලයක් නැතැයි ඔහු තර්ක කෙළේය.

කඳුළු ගෑස් වැදීමෙන් මිය ගිය විරෝධතාකරුවෙකු පිළිබඳ නඩු විභාගය ආරම්භ කළ අවස්ථාවේ දී යොදා ගත් කඳුළු ගෑස් පිළිබඳ වාර්තාවක් සති දෙකක් ඇතුළත ඉදිරිපත් කිරීමට පොලිසියේ මහජන සාමය සහ කළමනාකරණ කොට්ඨාශයේ අධ්‍යක්ෂක ට මහෙස්ත්‍රාත් නියෝග කෙළේය. රටේ ආර්ථික අර්බුදය ගැන පැවරෙන වගවීම නිසා හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ තවත් අයට කලින් පනවා ඇති විදෙස් සංචාරක තහනම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවත් කෙළේය. හිටපු මුදල් ඇමති රවි කරුණානායකට මහ බැංකුවේ බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ චෝදනා අභියාචනාධිකරණයෙන් ඉවත දමන ලදී. රාජ්‍ය අමාත්‍ය ඩයනා ගමගේ පුරවැසි භාවය සහ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සම්බන්ධයෙන් පවරා තිබූ නඩුව විභාගයට ගන්නා ලදී. ඇයට එරෙහිව අපමණ සාක්ෂි තිබෙන නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇය අත්අඩංගුවට ගන්නේ නැති බව පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥයා පෙන්වා දුන්නේය.

විමර්ශන කටයුතු සඳහා පොලිස් අත් අඩංගුවේ සිටින සැකකරුවන් මරණයට පත්වීම වැළැක්වීමට මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නියෝගය නොසලකා හැරියේයැයි පොලිස්පති කැඳවීමට සිතාසි නිකුත් කෙළේය.

## අප්‍රේල් 2023

2022 අප්‍රේල් මස රඹුක්කන රතුපස්වෙල විරෝධතාකරුවන්ට පොලිසියෙන් වෙඩි තැබීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ අවසාන වාර්තාව නිකුත් කෙරිණ. පොලිසිය සීමාන්විත බලය යොදා ගැනීම නිසා විරෝධතාකරුවෙකු මරණයට පත්ව තවත් දහඅට දෙනෙකුට තුවාල සිදුව ඇත. යෝජිත ප්‍රති-ත්‍රස්ත පනත පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම්වලට බාධාවක්යැයි මානව හිමිකම් කොමිසම පුවත් නිවේදනයකින් පෙන්වා දේ.

ද්විත්ව පුරවැසි භාවය නිසා රාජ්‍ය ඇමතිනි ඩයනා ගමගේ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට නුසුදුසු බව ප්‍රකාශ කිරීමට ගොනු කර ඇති පෙත්සම පිළිබඳ විනිශ්චය ජූනි මස ප්‍රකාශ කරන බව අභියාචනාධිකරණය ප්‍රකාශ කෙළේය. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ විමර්ශන කටයුතු ගැන හිටපු නීතිපති දප්පුල ද ලිවේරා කළ ප්‍රකාශයක් නිසා ඔහු ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවීමට එරෙහිව ගොනු කර තිබූ පෙත්සමක් සලකා බැලූ අභියාචනාධිකරණය ඊට එරෙහිව අන්තර්වාර නියෝගයක් නිකුත් කෙළේය. 2022 ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ හා සම්බන්ධ සිද්ධීන් කීපයක සැකකරු වශයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් නම් කිරීමෙන් හෝ අත්අඩංගුවට ගැනීමෙන් පොලිසිය වැළැක්වීමේ නියෝගයක් අභියාචනාධිකරණය ලබා දුන්නේය. නීතියෙන් පරිබාහිරව සිදු කරන ලද මිනීමැරුමක් ගැන සිදු කළ විභාගයක දී 2023 මාර්තු මස නිකුත් කළ නියෝගයට ප්‍රතිචාර වශයෙන් පොලිස් අත්අඩංගුවේ දී මරණ සිදුවීම වැළැක්වීමට පොලිසිය මාර්ගෝපදේශ සකස් කර ඇතැයි පොලිස්පති ශ්‍රේෂ්ඨාධිකරණයට දැන් වූයේය. මහර බන්ධනාගාරයේදී සිරකරුවන් 11 ක් මරා දැමීම පිළිබඳ මහෙස්ත්‍රාත් පරීක්ෂණය අවසන් කළ වැලිසර මහෙස්ත්‍රාත් අධිකරණය බන්ධනාගාර නිලධාරීන් අත්අඩංගුවට ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කෙළේය. කෙසේ වුවත් අත්අඩංගුවට ගැනීමක් සිදු නොවූ අතර නියෝගයට එරෙහිව අභියාචනාවක් කරන්නේයැයි බන්ධනාගාර දෙපාර්තමේන්තුව පැවසුවේය.

2023 මැයි

මුලතිවු මහෙස්ත්‍රාත් අධිකරණය 2019 අප්‍රේල් මස ටැමිල් ගාර්ඩියන් ජනමාධ්‍යවේදී ෂන්මුගම් තවසීලන්ට තර්ජනය කිරීම ගැන නාවික හමුදා බුද්ධි නිලධාරියෙකු ට සිතාසි නිකුත් කෙළේය.

පසුගිය වසරේ ගාලු මුවදොර විරෝධතාකරුවන්ට පහර දීම ට අදාලව පවත්වන මහෙස්ත්‍රාත් පරීක්ෂණයේ දී හිටපු අගමැති මහින්ද රාජපක්ෂ සහ තවත් තිදෙනෙකුට පනවා තිබූ සංචාර තහනම ඉවත් කිරීමට කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙන් නියෝග කෙරිණ. 2922 මැයි 9 ගාලු මුවදොර විරෝධතාකරුවන්ට පහර දීමෙන් පසුව හටගත් ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමට අපොහොසත් වූයේයැයි පොලිසියේ සහ හමුදාවේ ප්‍රධානින්ට එරෙහිව ඇමතින් සහ ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මංත්‍රීන් ඇතුළත් පාර්ශ්ව කීපයක් ගොනු කර තිබූ රිට් පෙත්සම අලුතින් පරීක්ෂණයක් පැවැත්වීමට බලධාරීන් පොරොන්දුවීමෙන් පසුව පෙත්සම්කරුවෝ ඉල්ලා අස්කර ගත්හ.

අනුමැතියකින් තොරව වන්දීකරණ සැත්කම් සිදු කෙළේයැයි ජාතිවාදී මාධ්‍යයෙන් චෝදනා කිරීම නිසා කලින් වැඩ තහනමට ලක්ව සිටි වෛද්‍ය ෂාපි ෂෙරිෆ්ඩීන් එම රෝහලේම නැවත සේවය භාර ගත්තේය.

කොළඹ දිස්ත්‍රික් අධිකරණය යූ ටියුබ් ලේඛක සහ දේශපාලන ව්ලොගර් දර්ශන හඳුන්ගොඩ ට එරෙහිව නිකුත් කර තිබූ වාරණ නියෝගය මැයි 24 දක්වා දීර්ඝ කෙළේය. රූපවාහිනී පරිශ්‍රයට බලහත්කාරයෙන් ඇතුළු වී ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කිරීම ගැන හිටපු ඇමති මර්වින් සිල්වාට පවරා තිබූ නඩු විභාගය සිද්ධිය ට වසර පහළොහකට පසුව නැවත ආරම්භ විය.

ජුනි 2023

ජාතික කම්කරු උපදේශක සභාවෙන් (NLAC )ස්ත්‍රී සාමාජිකාවන් පමණක් ඉවත් කිරීම සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යංශය සිය ප්‍රතිචාර දැක් වූයේය. ඔවුන් තම පියවර සාධාරණීය කෙළේ එම කාන්තාව ඉවත් කෙළේ මෑතක දී ක්‍රියාත්මක කළ ජාතික කම්කරු උපදේශන සභාවේ සාමාජිකයන් තෝරා ගැනීමේ නව ක්‍රියා පටිපාටිය නිසා බව පැවසීමෙනි. ඒ අනුව සභාවේ සාමාජිකත්වය සඳහා නම් කිරීම සිදු වන්නේ අමාත්‍යංශය විසින් තෝරා ගන්නා වැඩිම සාමාජිකත්වයක් ඇති වෘත්තීය සමිතිවලින් පමණි. ඒ හැර ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය වෙනස් කොට සැලකීමක් නැත.

යෝජිත විකාශන නියාමන අධිකාරිය පනත දේශපාලන වශයෙන් පත් කරන මණ්ඩලයක් හරහා මාධ්‍ය කර්මාන්තය පාලනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස ක්‍රියාකාරීන් ගේ සහ මාධ්‍ය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින අයගේ බලවත් විවේචනයට ලක් විය. පාර්ශ්වකරුවන් අතට පත් කර ඇති කෙටුම්පත් ලේඛනය පනත් කෙටුම් පතක් නොව යෝජනාවලියක් පමණක් බවත් මාධ්‍ය ආයතන ප්‍රධානින් සමග උපදේශනයක් පැවැත්වීමෙන් පසුව පනත කෙටුම්පත් කරන බවත් අධිකරණ ඇමති පැවසුවේය. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ විකාශකයන්ගේ සංසදය මාධ්‍ය ඇමතිට ලිපියක් යොමු කරමින් යෝජිත කෙටුම්පත වහාම ඉල්ලා අස්කර ගන්නා මෙන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය.

දූෂණ විරෝධී පනතේ වගන්ති 25කට වඩා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙලේය. දූෂණ විරෝධී පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ අන්තර්ජාතික මූල්‍ය

අරමුදල සමග ඇමරිකානු ඩොලර් බිලියන 2.9ක ණය මුදලක් ලබා ගැනීමට අත්සන් කළ ගිවිසුම අනුවය. එම ගිවිසුම අනුව දූෂණ පිටු දැකීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුය.

2020 කොළඹ පැවති සාමකාමී විරෝධතාවයේ දී උද්ඝෝෂකයන් හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීමෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් සහ තවත් පොලිස් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩකර ඇතැයි සඳහන් කරමින් ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම පවත්වා ගෙන යැමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර ලබා දුන්නේය.

2023 ජුලි

හිටපු ජනාධිපති සිරිසේන සහ අනෙකුත් අය 2018 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන්ට වන්දි ගෙවීමට ජනවාරියේ දී අධිකරණයෙන් නියෝග කළ අවසාන දිනය, මාස හය ඉකුත් වන විට ගෙවා තිබුණේ නියම කළ මුළු වන්දි මුදලින් මුදලින් 9% ක් පමණි.

2010 දී අතුරුදහන් කළ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ නඩුවට අදාලව ඉදිරිපත් කර ඇති දුර කතන 8 ක සාක්ෂි ඉදිරිපත් කිරීමට නීතිපති අධිකරණයේ අවසරය පැතුවේය. විත්තියේ නිතිඥයෝ ඊට විරුද්ධ වූහ.

කොළඹ මහාධිකරණයෙන් ප්‍රහසන ශිල්පිනී නටාෂා එදිරිසූරියට ඇප ලබා දුන්නේය. එම ඇප ලබා දීමේ නියෝගයට අන්තර්ජාතික නීතියේ වඩාත් පුළුල් ලක්ෂණ සැලකිල්ලට ගැනීමේ දී ICCPR වඩාත් ප්‍රගතිගාමී ආකාරයෙන් අර්ථ ගන්වා ඇත. ප්‍රහසන ශිල්පිනිය මැතක දී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පවත්වන ලද පුවත් සාකච්ඡාවේ දී අධිකරණයට අපහාසයක් වූයේදැයි පරීක්ෂණයක් පැවැත්වීමට කොළඹ මහෙස්ත්‍රාත් කළ නියෝගය සමාලෝචනයට ලක් කරන්නැයි ජනමාධ්‍යවේදී තරිඳු ජයවර්ධන ගොනු කර තිබූ පෙත්සම කොළඹ මහාධිකරණයෙන් ප්‍රතික්ෂේප කරන ලදී.

රටින් පිටව ගිය පොලිස් නිලධාරියෙකුගේ විසා බලපත්‍රය සකස් කිරීම සම්බන්ධයෙන් නොහඳුනන පුද්ගලයන් පස් දෙනකු තමාට පහර දී ලිංගිකව අතවර කෙළේයැයි නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සාවද්‍ය ප්‍රකාශයක් ලබා දීම සම්බන්ධයෙන් ස්විස් තානාපති කාර්යාලයේ හිටපු සේවිකාවක වන ගාර්නියා බැනිස්ටර් ප්‍රැන්සිස්ට වසර පහලොහක් අත් හිට වූ වසර දෙකක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම විය.

වසර තුනකට පෙර සහභාගි වූ විරෝධතාවයකට අදාල අධිකරණ නියෝගයක් අනුව අධිකරණයේ පෙනී නොසිටීම ගැන අත්අඩංගුවට ගත් ශිෂ්‍ය ක්‍රියාකාරී වසන්ත මුදලිගේ ට ඇප නියම කෙරිණ. 2022 මැයි මස ගාලු මුවදොර පැවති විරෝධතාවයට එල්ල වූ ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත්වීම නිසා ජ්‍යෝෂ්ඨ පොලිස් නිලධාරි, ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ට නියම කර තිබූ සංචාරක තහනම් ඉවත් කරන ලදී.

ජලසම්පාදන රාජ්‍ය ඇමති පාර්ලිමේන්තු මංත්‍රී සනත් නිශාන්ත අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් පවරා ඇති නඩුව විභාග කිරීමට මෙම වසරේ සැප්තැම්බර් 27 ට දින නියම විය.

පසුව ගාලු මුවදොර ආණ්ඩු විරෝධී උද්ඝෝෂණවලට තුඩු දුන් 2022 මාර්තු 31 මිරිහාන විරෝධතාවයට සහභාගිවූවන්ට පහරදීම සහ අත්අඩංගුවට ගැනීමට සහ 2022 මැයි මස ගාලු මුවදොර විරෝධතාවයට මැර

ප්‍රහාර එල්ල කිරීම වැළැක්වීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙකම රජයේ නීතිඥ මතු කළ මූලික විරෝධතා මත ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ප්‍රතික්ෂේප කෙරිණ. කෙසේ වුවද 2022 මැයි මස ගාලු මුවදොර විරෝධතාකරුවන්ට පහරදීම වැළැක්වීමට අපොහොසත් වීම ගැන ගොනු කර ඇති රිට් පෙත්සම සලකා බැලීමෙන් පසුව පොලිස්පතිට අධිකරණයේ පෙනී සිටීමට අභියාචනාධිකරණයෙන් නියෝග කෙරිණ.

ඡන්ද විමසීම් නොපවත්වා විසුරුවා හරින ලද පළාත් පාලන ආයතන නැවත කැඳවීමේ පුද්ගලික මංත්‍රී යෝජනාව ව්‍යවස්ථා විරෝධීයැයි නීතිපති අධිකරණයට දැන් වූයේය.
සංශෝධිත දූෂණ විරෝධී පනත යෝජනා කරන ලද සංශෝධන 196 ම ඇතුළත් කළ නිසා ඒකච්ඡන්දයෙන් පාර්ලිමේන්තුවෙන් සම්මත විය.

2023 අගෝස්තු

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ෂානි අබේසේකර සහ විදෙස් ගතව සිටින පොලිස් පරීක්ෂක නිශාන්ත ද සිල්වා ඇතුළු තවත් තිදෙනෙකු විමර්ශනයක් කිරීමේ දී බොරු සාක්ෂි ගොතන ලදැයි පැවරූ නඩුවෙන් නිදහස් කරන ලදී. ෂානි අබේසේකර මානව අයිතිවාසිකම් ක්‍රියාකාරිකයන් සහ ජන මාධ්‍යවේදීන්ට පහර දීම, මරා දැමීම සහ අතුරුදහන් කිරීමට අදාල ප්‍රකට සිද්ධි කීපයක් ම භාරව කටයුතු කෙළේය.

2023 ජනවාරි විරෝධතා දිනවල අත්අඩංගුවට ගෙන දින 200ක් එඳවා ගෙන සිටි ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් දෙදෙනෙකුට ඇප නියම විය. පසුව ඔවුන්ට නවක වදය සම්බන්ධ චෝදනා ඉදිරිපත් කෙරිණ.

සෞඛ්‍ය සේවකයන්ට මාධ්‍යයට ප්‍රකාශ කිරීම තහනම් කරමින් මෑතක නිකුත් කළ චක්‍රලේඛයක් පිළිබඳව වෘත්තීය සමිති සමග සාකච්ඡා කිරීමට සෞඛ්‍ය ඇමති රැස්වීමක් කැඳ වූයේය. මෙම තහනම වෘත්තීය සමිතිවලට අදාල නොවන බවට ඇමති සහතික වූ නිසා සැලසුම් කර තිබූ සංකේත වැඩ වර්ජනය නතර කරන ලදී.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත් යෝජනාව අභියෝගයට ලක් කරමින් අන්තර් සමාගම් සේවක සමිතිය ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවත දැමිණ. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාලව දේශීය ආදායම් සංශෝධන පනත පිළිබඳව වෙනත් පෙත්සමක් ගොනු කර ඇත.

අල්ලස් කොමිසම ගොනු කරන ලද නඩුවට අදාලව පාර්ලිමේන්තු මංත්‍රී විමල් විරසිංහ ඉදිරිපත් කළ මූලික විරෝධතා පිළිබඳ වාචික කරුණු ඉදිරිපත් කිරීමට ඔක්තොබර් 27 වැනි දාට දින නියම විය.

කොළඹ කොටුව මහෙස්ත්‍රාත් උසාවිය විවාදාත්මක මිග් ගනුදෙනුව නඩුවේ ප්‍රධාන සැකකරුවෙකුට පනවා තිබූ සංචාර තහනම තාවකාලිකව ඉවත් කෙළේය. මිග් ගනුදෙනුව හෙළිදරවු කිරීම 2009 දී ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීමේ ආසන්නතම හේතුවයැයි සැලකේ. අරමුල් ප්‍රමාදවීම නිසා මුලතිවු හි කොක්කුතුඩුවායි සමූහ මිනීවළේ කැනීම් කටයුතු සැප්තැම්බර් මුල දක්වා කල් තැබීමට සිදු විය.

දෙමළ ප්‍රජාවගේ අයිතිවාසිකම් සහතික නොකර ශ්‍රී ලංකාවේ ආණ්ඩුව පෙබරවාරි මස නිදහස් උත්සවය පැවැත්වීම හෙළා දැකීමට සංවිධානය කළ විරෝධතාවයකට අදාලව අගෝස්තු මස පුද්ගලයන් කිපදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

තොරතුරු දැනගැනීමේ කොමිසමෙන් නියෝගයක් නිකුත් කළ ද පසුගිය වසරේ ජනමාධ්‍යවේදී සහ මාධ්‍ය ක්‍රියාකාරික තරිඳු ජයවර්ධනට පොලීසියෙන් පහර දීම පිළිබඳ කෙරෙන විමර්ශන කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා දීමට පොලීසිය අපොහොසත් විය.

2023 සැප්තැම්බර්

රජය සතු පුවත් පතක් වන සිළුමිණ ජනමාධ්‍යවේදී පවුස් මොහොමඩ් ට සහ රජය සතු පුවත් පත්සමාගමක් වන ANCL එරෙහිව අපහාස කිරීමේ චෝදනාවක් මත ශ්‍රී ලංකා ක්‍රිකට් ලබා ගත් වාරණ නියෝගය කොළඹ දිස්ත්‍රික් අධිකරණයෙන් ඉවත් කරන ලදී.

සමාජ මාධ්‍ය විචාරකයෙකු වන රම්සි රසීක් ට එරෙහිව ඇති චෝදනා සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නැති නිසා කොළඹ මහෙස්ත්‍රාත් උසාවිය ඔහු අත්අඩංගුවට ගෙන වසර තුනකට පසු නිදොස් කොට නිදහස් කෙළේය. 2020 අප්‍රේල් මස ඔහු මුහුණු පොතේ ප්‍රකාශයට පත් කළ කරුණක් නිසා අත්අඩංගුවට ගෙන මාස පහක් ICCPR පනත යටතේ රඳවා ගන්නා ලදී. කවියෙකු වන අහ්නාෆ් ජසීම් ඉගැන් වූ පාසලේ දී අන්තවාදී අදහස් ඉගැන් වූ බව හෝ ප්‍රචාරය කළ බවට සාක්ෂිකරුවන් ප්‍රතික්ෂේප කළ නිසා ජසිම්ට එරෙහි නඩුව තව දුරටත් පවත්වා ගෙන යන්නේ ද දැනුම් දීම සඳහා නීතිපති මාස දෙකක කාලයක් ඉල්ලා සිටියේය. 2020 මැයි මස දරුඬු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් ඔහු මාස 19ක් රඳවා ගෙන 2021 දෙසැම්බර් මස ඇප මත නිදහස් කෙළේය. අන්තර් ආගමික සංහිඳියාව වෙනුවෙන් පෙනී සිටින බෞද්ධ භික්ෂුවක් වන වටරැක විජිත හිමි 2014 දී සංවිධානය කළ පුවත් පත් සාකච්ඡාවක් කඩා කප්පල් කිරීම ගැන සමාව ඉල්ලා සිටි බොදුබල සේනා හි ඥානසාර හිමි ඇතුළත් තවත් අන්තවාදී බෞද්ධ භික්ෂු කණ්ඩායමකට විජිත හිමියන්ට වන්දියක් ගෙවීමට නියම කෙරිණ.

බ්‍රිතාන්‍ය බ්ලොග් ලේඛකයෙකු වන ජ්‍රේසර් ට ආරක්ෂිතව රටින් පිටව යෑමට අවසර ලබා දෙන බවට සහතිකයක් ආණ්ඩුවෙන් ලබා ගැනීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවරයෙකු උත්සාහ ගන්නා බවට මාධ්‍ය වාර්තා පළ විය. ශ්‍රී ලංකාවේ බලධාරීන් පසුගිය වසරේ දී ජ්‍රේසර් ගේ ගමන් බලපත්‍රය අත්පත් කර ගෙන ඔහු සමාජ මාධ්‍යයේ ශ්‍රී ලංකාවේ පැවති විරෝධතා උද්ඝෝෂණ ගැන ඡායාරූප පළ කිරීම නිසා රටින් පිටුවහල් කිරීමේ නියෝගයක් නිකුත් කෙළේය.

2015 ජනාධිපති මැතිවරණ සමයේ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවකට අදාල මිනී මැරුමක ප්‍රධාන සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමට කහවත්ත පොලීසියේ නිලධාරීන්ට බලපෑම් කෙළේයැයි විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහට වසර පහක සිර දඬුවමක් නියම විය. 2022 මාර්තු මස දේශපාලකයන් ඇතුළත් සියලුම සැකකරුවන් මිනි මැරුම් නඩුවෙන් නිදහස් කෙරිණ.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ දී විශ්‍රාමික අරමුදල් යොදා ගැනීමට අදහස් කරන මතභේදයට තුඩු දුන් දේශීය ආදායම් පනත ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවෙන් සම්මත කෙරිණ. මෙම පනතට එරෙහිව ගොනු කර තිබු මූලික අයිතිවාසිකම් පෙත්සම් ගණනාවක් පසුගිය මස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉවත දමන ලදී.

සැප්තැම්බර් මස මුලතිවු හි කොක්කුතුඩුවායි හි සමූහ මිනී වළේ කරන ලද කැනීම්වලින් පුද්ගලයන් 18කට අයත් ඇටසැකිලි සොයා ගන්නා ලදී. කැනීම් කටයුතු අතර මග දී නතර කරන ලද අතර දැනට ඇති සෙයා ගැනීම් අනුව පරීක්ෂණ කණ්ඩායම උසාවියට වාර්තාවක් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මතභේදයට තුඩු දී ඇති කුරුන්දතුර්මලෙයි පුරාවිද්‍යා ස්ථානය පිළිබඳ නඩු විභාගයේ දී මුලතිවු මහෙස්ත්‍රාත් කලින් එම ස්ථානයේ නව ඉදිකිරීම්වලට ඉඩ නොදෙන ලෙස අධිකරණයෙන් ලබා දුන් නියෝගය ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම ගැන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වගකිව යුතුයැයි කීවේය.

2023 ඔක්තෝබර්

සැප්තැම්බර් මස මැද භාගයේ දී මර්දනකාරී පනත් දෙකක් ප්‍රති-ත්‍රස්ත පනත සහ මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත ගැසට් කරනු ලැබිණ. මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනතේ ව්‍යවස්ථානුකූල භාවය අභියෝගයට ලක් කරමින් පෙත්සම් 46ක්[22] ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලැබිණ. ඒ අතර සිවිල් සමාජ සංවිධාන[23] සහ ක්‍රියාකාරිකයන්, නීතිඥ එකමුතුව[24], මාධ්‍ය සංවිධාන[25], මාධ්‍ය සමාගම්[26], වෘත්තීය සමිති[27], ජනමාධ්‍යවේදීන්, කලාකරුවන් දේශපාලන පක්ෂ[28] සහ වෙනත් අය[29]ද වූහ. ශ්‍රේෂ්ඨාධිකරණය මෙම පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බව තීරණය කළ අතර එහි වගන්ති 31ක් සංශෝධනය කිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයකින් සම්මත කළ හැකි බව ද තීරණය කෙළේය. [30] එම තීරණය රහසිගතව කතානායකට භාර දී ඇති නමුත් මෙතෙක් ප්‍රකාශයට පත් කර නැත. ජනමාධ්‍යවේදීන්ගේ අන්තර්ජාතික සම්මේලනය[31], නීතිවේදීන්ගේ අන්තර්ජාතික කොමිසම[32], ප්‍රධාන සමාජ මාධ්‍ය සමාගම් සහ අන්තර්ජාල දැවැන්තයන් ඇතුළත් වන ආසියානු අන්තර්ජාල එකතුව[33] තම කණස්සල්ල පළ කරමින් නිවේදන නිකුත් කළහ. අඩුම වශයෙන් විපක්ෂයේ දේශපාලන පක්ෂ දෙකක් ප්‍රති-ත්‍රස්ත පනතට එරෙහිව පෙත්සම් ගොනු කළහ. ඉන්පෝර්ම් ද මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනතට එරෙහිව පෙත්සමක් ගොනු කෙළේය. ප්‍රති-ත්‍රස්ත පනත මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැති නිසා ශ්‍රේෂ්ඨාධිකරණය එම පෙත්සම් විභාගයට ගත්තේ නැත.

---

22 https://www.supremecourt.lk/images/documents/dailycourtlist2022/20.10.2023_2.pdf
23 INFORM, Centre for policy Alternatives, and many other organisations and individual activists
24 Bar Association of Sri Lanka (BASL), Lawyers' Collective, and many individual lawyers
25 Young Journalists Association of Sri Lanka, Sri Lanka Working Journalists Association, the Media Law Forum and individual journalists
26 MTV Channel Pvt Ltd
27 the Ceylon Teachers' Union and other trade unions
28 National People's Power, FrontLine Socialist Party, Samagi Jana Balawegaya, Freedom People's Congress

29 Socialist Youth Union, former Commissioner of HRCSL Ambika Satkunanathan, Colombo Archbishop Malcolm Cardinal Ranjith, Star Publications Pvt Ltd, Nagananda Kodituwakku, and many others
30 https://economynext.com/sri-lankas-online-safety-bill-can-be-passed-with-simple-majority-subject-to-31-amendments-138573/

31 https://economynext.com/sri-lankas-online-safety-bill-can-be-passed-with-simple-majority-subject-to-31-amendments-138573/
32 https://www.ifj.org/media-centre/news/detail/category/press-releases/article/sri-lanka-controversial-online-safety-bill-tabled

33 https://aicasia.org/download/819/

දෙමළ ජනමාධ්‍ය වේදී මයිලවඝානම් නිමලරාජන් ඝාතනය කිරීමේ 23 වැනි සංවත්සරය අනුස්මරණය කිරීමට උත්සව පවත්වන ලදී. සන්ධ්‍යා එක්නැලිගොඩ අතුරුදහන් කළ තම සැමියා ජනමාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ වෙනුවෙන් යුක්තිය ඉල්ලා ඇය ගෙන යන අරගලයේ දින 5000ක් සපිරීම වෙනුවෙන් අනුස්මරණ ප්‍රදර්ශනයක් පැවැත් වූවාය. 1987 දී ඉන්දියානු සාම සාධක හමුදාව විසින් කොකුවිල් පිරම්බඩි හි සිදුකළ ඝාතනයේ 36 වැනි සංවත්සරය යාපනයේ දී පවත්වන ලදී. මෙම සියලුම නඩු මෙතෙක් නිමා වී නැත. රජයෙන් අරමුදල් නොලැබීම නිසා මූලතිවු සමූහ මිනී වළේ කැනීම් ද කර ගෙන යා නොහැකිව ඇති බව වාර්තා විය.

විශ්‍රාමික පොලිස් නිලධාරි ෂානි අබේසේකර තමා සාවද්‍ය ලෙස අත්අඩංගුවට ගෙන සිරභාරයේ තැබීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් වන්දි ඉල්ලා ලිපියක් යැව්වේය.

අත්අඩංගුවට ගෙන දින 120ක් රඳවා ගෙන සිටි ලේඛක ශක්තික සත්කුමාර මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර එය ලබන වසරේ ජුනි 7 විභාගයට ගැනීමට නියමිතය. ඔහුට එරෙහිව වෙනත් නඩුවක් ද පවරා ඇත.

ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පැවති දිනවල ජනාධිපති මන්දිරයේ තිබී සොයා ගත් රු. දශලක්ෂ 17.85 සම්බන්ධයෙන් ගොනු කර ඇති නඩුව සාක්ෂි නොමැති නිසා ඉදිරියට පවත්වා ගෙන නොයන බව අල්ලස් හෝ දූෂණ කොමිසම කොළඹ කොටුව මහෙස්ත්‍රාත්ට දැනුම් දුන්නේය. මහබැංකුවේ හිටපු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් සහ හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංගට එරෙහිව ඇ.ඩො. දශලක්ෂ 6.5ක මුදලක් අයථා පරිහරණය සම්බන්ධයෙන් පවරා ඇති නඩුව ප්‍රමාණවත් සාක්ෂි නොමැති නිසා කොළඹ කොටුව මහෙස්ත්‍රාත් තිලින ගමගේ ඉවත දැමුවේය. පාර්ලිමේන්තු මංත්‍රී ඩයනා ගමගේ ට ද්විත්ව පුරවැසි භාවය නිසා පාර්ලිමේන්තු අසුනක් දැරිය නොහැකි බවට ගොනු කර තිබූ පෙත්සම බහුතරයේ කැමැත්ත අනුව අභියාචනාධිකරණයෙන් ප්‍රතික්ෂේප කෙරිණ.

2023 නොවැම්බර්

මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන නිසා වසර දෙකකට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ගැසට් කර ඇති සමහර රෙගුලාසි වලංගු නොවන්නේයැයි ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කෙළේය. මෙම රෙගුලාසි හරහා මතභේදයට තුඩු දුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ බලතල වඩාත් පුළුල් කළ අතර ඒවා බොහෝ විට මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, වාර්ගික සුළුතරය හා වෙනත් අය හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීමට සහ රඳවා ගැනීමට යොදා ගැනිණ. අයථා කළමනාකරණය හරහා රටේ ආර්ථිකය අර්බුදයකට යොමු කිරීමෙන් කලින් පැවති ආණ්ඩුවේ ප්‍රධාන දේශපාලකයක් කීප දෙනකු සහ උසස් රාජ්‍ය නිලධාරීන් කීප දෙනෙකු මහජන විශ්වාසය සහ නීතිය ඉදිරියේ සමානාත්මතාවය උල්ලංඝනය කර ඇතැයි ඓතිහාසික නඩු තීන්දුවක් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන්නේය.

මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනත පවතින ආකාරයෙන් සම්මත කර ගැනිමට ආණ්ඩුවට විශේෂ බහුතරයක් ලබා ගත යුතු බවත් නොඑසේ නම් සංශෝධන 31ක් ඇතුළත් කිරීමෙන් සාමාන්‍ය බහුතරයකින් සම්මත කළ හැකි බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙළේය.

දේශපාලන විචාරක මොහොමඩ් රම්සි රසීක් 2020 අප්‍රේල් මස ICCPR පනතේ 3 වගන්තිය යටතේ අත්අඩංගුවට ගෙන අනතුරුව සිරභාරයට පත් කිරීම මූලික අයිතිවාසිකම් කඩකිරීමක් බව

ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කෙළේය. වසර දහසයකට පෙර රජයේ රූපවාහිනී සංස්ථාවට හිටපු ඇමති මර්වින් සිල්වා පිරිසක් සමග කඩා වැදී සේවකයන්ට පහර දීම පිළිබඳව පවත්වන පොලිස් විමර්ශන කටයුතුවල ප්‍රගතිය අධිකරණයට වාර්තා කරන ලෙස කොළඹ මහෙස්ත්‍රාත් නියෝග කෙළේය.

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් දේශපාලකයන්ගේ සහ හමුදාවේ සම්බන්ධතාවයක් ඇතැයි බ්‍රිතාන්‍ය රූපවාහිනි නාලිකාවක් වන චැනල් 4 කළ හෙළිදරව්ව ආරක්ෂක අමාත්‍යංශයෙන් ප්‍රතික්ෂේප කර හෙළා දකින ලදී. බ්‍රිතාන්‍යයේ චැනල් 4 රූපවාහිනි නාලිකාව විකාශනය කළ වාර්තා වැඩ සටහන අනුව බෝම්බ ප්‍රහාරය සිදු කළ ත්‍රස්තවාදි කණ්ඩායම ආණ්ඩුවේ ප්‍රධාන ආධාරකරුවෙකු සහ රාජ්‍ය බුද්ධි අංශයෙයේ උසස් නිලධාරියෙකු හමුව ඇත. ඒ අනුව මෙම ප්‍රහාරය සිදු කර ඇත්තේ රටේ අනාරක්ෂිත තත්වයක් ඇති කිරීමෙන් ගෝඨාභය රාජපක්ෂට මැතිවරණය දිනා ගැනීම පහසු කිරීමට ය.

දේශපාලන මැදිහත්වීම් නිසා පාස්කු ඉරිදා ප්‍රහාරයේ විමර්ශන කටයුතුවලට බාධා පැමිණුනේයැයි කලින් විමර්ශන කටයුතු භාරව සිටි පොලිස් ප්‍රධානියා පළමු වරට පැවසුවේය. ප්‍රහාරයට මාස හයකට පසු රාජපක්ෂ, කාර්යාලය අත්පත් කර ගැනීමෙන් පසු තම පරීක්ෂණ කණ්ඩායම ඉන් ඉවත් කළ බව හිටපු නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න පැවසුවේය. නව ආණ්ඩුව තේරීපත් වූ වහාම හේතුවක් නොදක්වාම විමර්ශන කටයුතු භාරව සිටි තමා ගේ ප්‍රධාන නිලධාරියා ඉවත් කරන ලදී. නාවික හමුදාවේ කණ්ඩායමක් විසින් පැහැර ගෙන ගියේයැයි සැක කරන තරුණයන් 11 දෙනාගේ දෙමාපියෝ අතුරුදහන් කළ තම දරුවන් වෙනුවෙන් යුක්තිය ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ උද්ඝෝෂණයක් පැවැත් වූහ. නීතිපති දෙපාර්තමේන්තුව මෙම කරුණ ගැන අවධානයක් යොමු නොකිරීම නිසා වසර 15කට අධික කාලයක් තිස්සේ යුක්තිය ඉටුව නැතැයි ඔවුහු පැවසූහ. කොක්කුතුඩුවායි සමූහ මිනී වළේ දෙවන අදියරේ කැනීම් නොවැම්බර් මස අග දී ආරම්භ විය. කැනීම්වලදී මිනිස් ඇටසැකිලි 80ක් හමු විය. දෙවන අදියරේ කැනීම් 2024 මාර්තු මස 1 වැනි දින ආරම්භ වනු ඇත.

2023 දෙසැම්බර්

බිංගිරිය රූපවාහිනී ජනමාධ්‍යවේදී දිනිත් කුමාර ප්‍රවෘත්තියක් ආවරණය කරමින් සිටිය දී බිංගිරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඔහුට පහර දී මාධ්‍ය උපකරණ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් අපක්ෂපාත විමර්ශනයක් පැවැත්විය යුතුයැයි ප්‍රාදේශීය මාධ්‍ය අයිතිවාසිකම් කණ්ඩායමක් වයඹ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ට ලිපියක් ඉදිරිපත් කළහ.

වසර එක හමාරකට අධික කාලයක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන සිටි කවියෙකු මෙන්ම ගුරුවරයෙකු වන අහ්නාෆ් ජසීම් ට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනාවලින් නිදොස් කොට නිදහස් කරන ලදී.

මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පනතට එරෙහි පෙත්සම් සලකා බැළු ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරයකින් එය සම්මත කර ගැනීමට සංශෝධන 33ක් එකතු කළ යුතුයැයි දැනුම් දුන්නේය.

කුරාණයට සහ ඉස්ලාම් ආගමට අපහාස වන ප්‍රකාශයක් මාධ්‍යයට ලබා දීම ගැන බොදුබල සේනා මහ ලේකම් ගලබොඩඅත්තේ ඥානසාර හිමිට එරෙහිව ගොනු කර තිබූ නඩුව නීතිපති ගේ උපදෙස් ලබා ගෙන මාර්තු 11 නැවත කැඳවීමට කොටුව මහෙස්ත්‍රාත් තිලින ගමගේ නියෝග කෙළේය.

පාසලක විදුහල්පතිනියක් දණ ගැස්වීමෙන් හිරිහැර කිරීම පිළිබඳව ඌව මහ ඇමති චාමර සම්පත් දිසානායකට එරෙහිව ගොනු කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම දෙසැම්බර් 1 වැනි දා ඉල්ලා අස් තර ගත්තේය.

නියමිත පරිදි මාර්තු 9 වැනි දා පළාත් පාලන මැතිවරණය නොපැවැත්වීමෙන් ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇතැයි ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙසැම්බර් 13 දින පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ නැවත කැඳවනු ඇත.

වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් සහ තවත් පොලිස් නිලධාරීන් තිදෙනෙකු 2010 දී සොරකමක සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට ගත් පුද්ගලයෙකුට වධහිංසා පැමිණවීම, හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනිම සහ රඳවා ගැනීමට වරදකරුවන් බව තීරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය රු. දශලක්ෂ දෙකක් වන්දි වශයෙන් ගෙවීමට නියම කෙළේය. දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති තනතුරට පත් කිරීම සහ වැඩබලන පොලිස්පති ලෙස සේවය කිරීම වළක්වන ලෙස මූලික අයිතිවාසිකම පෙත්සම් ගණනාවක්ම ඉදිරිපත් කෙරිණ. ඊට අතිරේකව මාධ්‍ය අයිතිවාසිකම් කණ්ඩායමක් වූ තරුණ ජනමාධ්‍යවේදීන් ගේ සංගමය ඔහු වැඩ බලන පොලිස්පති තනතුරෙන් ඉවත් කරන මෙන් ජාතික පොලිස් කොමිසමෙන් ඉල්ලීමක් කෙළේය.

අල්ලස් සහ දූෂණ විමර්ශන කොමිසම පාර්ලිමේන්තු මංත්‍රී විමල් වීරවංශට එරෙහිව ගොනු කරන ලද නඩුව සලකා බැලීමෙන් පසු විමල් වීරවංශට සහ ඔහුගේ ඇපකරුවන්ට ඊට පසුවදාම අධිකරණයට ඉදිරිපත් වීමට නියෝග කෙළේය.

## 4 මාධ්‍ය සහ ජනමාධ්‍යවේදීන් මර්දනය

2023 පෙබරවාරි

අවසානයේ දී ආණ්ඩු පක්ෂයේ දේශපාලකයන්ගේ දේපොළවලට පහර දීම් මාලාවකට හේතු වූ 2022 මැයි 9 ආණ්ඩුවට හිතවත් මැර කණ්ඩායම් සාමකාමී විරෝධතාකරුවන්ට පහර දීමට අදාල වීඩියෝ පටියක් බෙදා හැරීම සම්බන්ධයෙන් යූ ටියුබ් ලේඛක සහ බ්ලොගර් දර්ශන හඳුන්ගොඩ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය දෙමළ අන්තර්ජාතික විකාශන සංස්ථාවේ ( IBC) සභාපති බාස්කරන් කන්දයියා කැඳවා ප්‍රකාශයක් ලබා දෙන ලෙස ඔහුට නියෝග කරන ලදී.

2023 මාර්තු

සියත නම් දේශීය රූපවාහිනී නාලිකාවේ දේශපාලන විග්‍රහයක් වූ සියත ටෙලිවැකියෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කර ඇති නිසා ඒ පිළිබඳව වැඩි දුර පියවර ගැනීමට නීතිපතිවරයා යොමු කරමින් යෝජනාවක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්නා ලදී. බොහෝ විට එම මාධ්‍ය ආයතනයට විරුද්ධව නීතිමය පියවර ගනු ඇත. රාවනා ලංකා නම් වෙබ් අඩවිය පවත්වා ගෙන යන වෙබ් ජනමාධ්‍යවේදී ජී පී නිශ්සංක මායාදුන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා එම වෙබ් අඩවියේ පළවන

විමර්ශනාත්මක ලිපි ගැනත් ඒවායේ මූලාශ්‍ර ගැනත් පැය තුන හමාරකට අධික කාලයක් ප්‍රශ්න කර ඇත. පොළොන්නරුව දිස්ත්‍රිකකයේ මනම්පිටිය ලංකාදීප ප්‍රාදේශීය වාර්තාකරු නිමල් ජයරත්නට දුර කතනයකින් අමතා කිසියම් සිද්ධියක් ගැන වාර්තා කරන මෙන් තර්ජනය කර ඇත.

2023 අප්‍රේල්

ස්වාධීන ජනමාධ්‍යවේදියෙකු සහ ක්‍රියාකාරිකයෙකු වන රාමචන්ද්‍රන් සනත් ශ්‍රී ලංකා පොලිසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවන ලදී. රජය සතු ස්වාධීන රූපවාහිනී ජාලයේ ජනමාධ්‍යවේදිනියක් වන ඊෂාරා දේවේන්ද්‍ර තම මුහුණු පොතේ සටහනක් තබමින් තමා  ලක් වූ ලිංගික හිරිහැර ගැන කළමනාකාරිත්වයට කරන ලද පැමිණිලි පිළිබඳව පියවර නොගැනීම නිසා සේවයෙන් ඉල්ලා අස්වන බව පැවසුවාය.  කොළඹ දිස්ත්‍රික් අධිකරණය දේශ්‍යා යූ ටියුබ් නාලිකාවට සහ යූ ටියුබ් ලේඛක දර්හන හඳුන්ගොඩට එරෙහිව 2023 අප්‍රේල් 26 සිට මැයි 10 දක්වා බලපාන වාරණ නියෝගයක් නිකුත් කෙළේය. ඒ ඔහු එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ පිපිරීමෙන් සිදු වූ සාගර විනාශය ගැන සාවද්‍ය තොරතුරු වාර්තා පළ කෙළේයැයි නීතිපති නඩුවක් ගොනු කර ඇති නිසාය. 2019 පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරය ට අදාලව හිටපු නීතිපති දප්පුල ද ලිවේරා සමග පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවක් සම්බන්ධයෙන් නිව්ස්පර්ස්ට් ජනමාධ්‍ය වේදී සුල්පික් පර්සාන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවන ලදී.

2023 ජූලි

කොළඹ පැවති වෘත්තීය සමිති විරෝධතාවයක් ආවරණය කරමින් සිටිය දී ජනමාධ්‍යවේදී සහ මාධ්‍ය ක්‍රියාකාරික තරිඳු උඩුවරගෙදරට පොලීසියෙන් පහර දී අත්අඩංගුවට ගෙන ඇත. යූ ටියුබ් ලේඛක සහ ජනමාධ්‍යවේදී දර්ශන හඳුන්ගොඩ ගේ ලිපි ප්‍රකාශයට පත්  කරන යූ ටියුබ් නාලිකාවට ඔහුගේ ඇති සම්බන්ධතාවය විමර්ශනය කිරීමට කොළඹ නාරාහේන්පිට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාශයට කැඳවන ලදී. බුද්ධාගමට අපහාසයක් වන ප්‍රකාශයක් කෙළේයැයි කියන ප්‍රහසන ශිල්පිනී නටාෂා එදිරිසූරියගේ සංදර්ශනයක් ඉදිරිපත් කරන ලදැයි චෝදනා ඉදිරිපත්ව ඇත්තේ ද මෙම යූ ටියුබ් නාලිකාවටයි. ඔහුගේ විද්‍යුත් උපකරණ ද ඔහුට විරුද්ධව පැවැත්වෙන විමර්ශන කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන්නැයි මහෙස්ත්‍රාත් උසාවියෙන් නියෝග කෙරිණ.  2021 මැයි මස[34] ශ්‍රී ලංකාවේ සාගර කලාපයේ ගිලී ගිය එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ අයිතිකාර සමාගමට එරෙහිව නඩු ගොනු කිරීම ප්‍රමාද කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කීප දෙනෙකු කටයුතු කරන්නේයැයි චෝදනා කෙරෙන වීඩියෝ පටියක් ප්‍රකාශ කිරීම ගැන ද ඔහු විමර්ශනයට ලක්ව සිටී.  වෙනත් සිද්ධියක් සම්බන්ධයෙන් මෙම යූ ටියුබ් ලේඛකයා අපහාස ළේයැයි චෝදනාවක් කොළඹ නගර සභාවේ පුරපති ද ඉදිරිපත් කර ඇත. ලංකාදීප පුවත් පතේ ප්‍රාදේශීය ජනමාධ්‍ය වේදියෙකුට හඳුනා නොගත් පුද්ගලයන් දෙදෙනෙකු ඔහුගේ කාර්යාලය තුළදීම පහර දී ඇත. ඊට දින කිපයකට පෙර හඳුනා නොගත් පුද්ගලයෙකු ඔහුගේ කාර්යාලයට කඩා වැදී ඇතැයි ඔහු පොලීසියට පැමිණිල්ලක් කෙළේය. පොලීසිය මෙම සිද්ධිය ගැන පරීක්ෂණ කිරීමට පැමිණි විට පිරිසක් පැමිණ එය වීඩියෝ ගත කර ඇත. ජනමාධ්‍ය වේදියා ඔවුන්ගේ අනන්‍යතාවය ගැන ප්‍රශ්න කළ විට ඔහුට පහර දී ඇත.[35]

---

[34] https://www.youtube.com/watch?v=VgtVo8umlac

[35] 35 කුලියාපිටිය ප්‍රාදේශීය මාධ්‍යවේදියාට පහරදීලා



මාධ්‍ය අයිතිවාසිකම් ක්‍රියාකාරික සහ ජනමාධ්‍යවේදී තරිඳු උඩුවරගෙදර වෘත්තීය සමිති එකතුවෙන් 2023 ජුලි 26 දින කොළඹ සංවිධානය කළ විරෝධතාවයක් වාර්තා කිරීමේ දී පොලිසිය පහර දී අත්අඩංගුවට ගනු ලැබිණ. ඡයාරූප අනුග්‍රහය: : the leader

2023 අගෝස්තු

ආණ්ඩුවෙන් නිකුත් කළ හැඳුනුම් පත ඉදිරිපත් කිරීමට හෝ මාර්ගගත ප්‍රකාශනයක වැඩ කරන බව තහවුරු කිරීමට අපොහොසත් වූ හෝ ජනමාධ්‍ය වේදීන්ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ෂානි අබේසේකරට එරෙහිව පැවැත්වෙන නඩු විභාගය වාර්තා කිරීමට ගම්පහ උසාවි පරිශ්‍රයට පිවිසීමට එහි සේවයේ යෙදී සිටි පොලිස් නිලධාරියෙකු වැළැක්වූයේය. ජනමාධ්‍යවේදී  සුනන්ද දේශප්‍රියට ජනාධිපති ගේ වෙබ් අඩවියට පිවිසීම වළක්වා ඇතැයි ඔහු ට්විටර් සටහනක් තබා ඇත. තවත් පිරිසක් සමග ජනමාධ්‍යවේදීන් තිදෙනෙකු බලහත්කාරයෙන් රඳවා ගෙන ඔවුන්ගේ කැමරාවල තිබූ ඡායාරූප මකා දැමීමට බෞද්ධ භික්ෂුවකගේ නායකත්වයෙන් යුත් පිරිසක් බල කළහ. සිරස නලිකාව ආණ්ඩුවට එරෙහිව දේශපාලන කුමන්ත්‍රණයක යෙදී සිටින නිසා ඒ ගැන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට ආණ්ඩු පක්ෂයේ මංත්‍රීන් තීරණය කළ බව මාධ්‍ය වාර්තාවල පළවිය.

2023 සැප්තැම්බර්

කොක්කුතුඩුවායි සමූහ මිනී වළ කැනීම් කරන තෙවැනි දින එම ස්ථානයේ රැඳී සිටිමින් සම්මුඛ සාකච්ඡා පැවැත් වූ ජනමාධ්‍ය වේදීන් දෙදෙනෙකුට කැනීම් කටයුතු කරමින් පවතින විට එම ස්ථානයෙන් බැහැරව

සිටින ලෙස පොලිසියෙන් නියෝග කෙළේය. එහෙත් සිවිල් ඇඳුමෙන් සිටි බුද්ධි අංශයේ නිලධාරීන්ට එම ස්ථානයේ ඡායාරූප ගැනීමට බාධාවක් නොවීය.

2023 ඔක්තෝබර්

අන්තර්ජාතික ඡායාරූප ජනමාධ්‍යවේදියෙකුට ඉරනායි තිවු දූපතට පිවිසීමට ශ්‍රී ලංකා හමුදාවෙන් අවසර දුන්නේ නැත. ආණ්ඩුවේ ඇමතිවරයෙකු කරන ලද පැමිණිල්ලක් අනුව නෙත් එෆ්එම් ප්‍රවෘත්ති අංශයේ ප්‍රධානි ඇතුළත් ජනමාධ්‍යවේදීන් සිවු දෙනෙකු පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව ඉදිරියට කැඳවා ප්‍රශ්න කරන ලදී. ජනාධිපති විවේචනය කරමින් විපක්ෂ නායකයා කළ ප්‍රකාශයක් උපුටා දැක්වීම නිසා රජය සතු සමාගමක් වන එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කලමනාකාරිත්වය එහි දිනපතා පත්‍රයක කතුවරයාට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත. මඩකලපුවේ ජනමාධ්‍ය වේදීන් දෙදෙනෙකු කිරි හරක් ගොවීන්ගේ උද්ඝෝෂණයක් විසුරුවා හැරීමේ දී සිදු වූ පොලිස් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම නිසා පැය දෙකකට අධික කාලයක් පොලීසිය ඔවුන්ගෙන් ප්‍රශ්න කරනු ලැබිණ.

2023 නොවැම්බර්

2020 මහාවීර් නාල් දිනයේ පළ කරන ලද ලිපියක් සම්බන්ධයෙන් යාපනයේ උදයන් පත්‍රයේ කතෘ මණ්ඩල සාමාජික සහ ජනමාධ්‍යවේදී දිලිප් අමුතන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවන ලදී. රජයේ රූපවාහිනී සංස්ථාවේ කුරුණෑගල ප්‍රාදේශීය වාර්තාකරු ට බිංගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීහු තදබල සේ පහර දී අත්අඩංගුවට ගත්හ. දේශීය සහ විදේශීය ජනමාධ්‍ය වේදීන් පිරිසක් පොලිසියෙන් මාර්ග බාධකයක දී රඳවා ගෙන පැය දෙකකට අධික කාලයක් ප්‍රශ්න කොට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති හැඳුනුම් පත්, ඔවුන්ගේ නිවෙස්වල ලිපිනයන් සහ වැඩ කරන ස්ථානයේ ලිපිනයන් සටහන් කර ගෙන ඇත.

2023 දෙසැම්බර්

36 හැවිරිදි මාධ්‍ය ඡායාරූප ශිල්පියෙකු වන මහේෂ් ගුණසිංහ වේයන්ගොඩ කටුවගස්ගොඩ ප්‍රදේශයේ හෝටලයක දී මරා දමා ඇත. ජනමාධ්‍යවේදියෙකු සහ යාපනය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපති රාසරත්නම් දර්ශන් ගෙන් 2022 මැයි මස දෙමළ ජනඝාතන අනුස්මරණය වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ පැවති අනුස්මරණ උත්සවයක දී වාදනය කළ ගීත තෝරා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාවේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය පැය තුනකට අධික කාලයක් ප්‍රශ්න කරන ලදී. **IBC** මඩකලපුව දෙමළ මාධ්‍ය ජනමාධ්‍යවේදී ලෙචුමානන් දේවප්‍රදීපන් වාලච්චේනෙයි පොලීසියට කැඳවා ඇත. ඔහු නැගෙනහිර පළාතේ සුසාන භූමියක පැවති දෙමළ රණවිරු අනුස්මරණ උත්සවයක් වාර්තා කළ බව සඳයන් වේ. දේවප්‍රදීපන් පොලිසියට පැමිණි මොටර් සයිකලයේ ලියා පදිංචි සහතිකය ගෙන එන ලෙස දන්වන ලදී. නොවැම්බර් 28 මඩකලපුව තරාවි සුසාන භූමියේ පැවති දෙමළ රණවිරු අනුස්මරණ උත්සවය ගැන ද ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී.

# 5. රැස්වීමේ නිදහස මර්දනය

2023 ජනවාරි

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය සංවිධානය කළ විරෝධතා පා ගමනකට කොළඹ ගාලු මුවදොර පිටියට ඇතුළුවීම වළක්වාලන නියෝගයක් කොළඹ කොටුව මහේත්‍රාත් නිකුත් කෙළේය. එම විරෝධතාවයට පොලිසියෙන් කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කෙළේය. ශිෂ්‍ය නායක වසන්ත මුදලිගේ නිදහස් කිරීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඉවත් කිරීම, විදුලිය, ගෑස් සහ ඉන්ධන මිල අඩු කිරීම යන ඉල්ලීම් මුල් කර ගෙන අන්තර් විශ්වවිද්‍යාල බල මණ්ඩලය විරෝධතාවයක් සංවිධානය කෙළේය.[36] ජනාධිපති රනිල් වික්‍රමසිංහ 2023 ජනවාරි 15 යාපනයේ සංචාරයක යෙදෙමින් නල්ලූර් සිවම් කෝවිලේ පූජාවකට සහභාගි වූයේය. මේ අතරතුර අතුරුදහන් වූවන්ගේ පවුල් සහ යාපනයේ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ නල්ලූර් හි යාපනය විශ්වවිද්‍යාලයේ සිට උත්සවය පැවැත් වෙන ස්ථානය දක්වා විරෝධතා පා ගමනින් ආහ. එම විරෝධතාවයේ දීම ප්‍රමුඛ සිවිල් සමාජ නායකයෙකු වන වෙලන් ස්වාමිගල් පොලිස් රාජකාරියට බාධා කිරීම සම්බන්ධයෙන් ජනවාරි 18 දින පොලිසියෙන් අත්අඩංගුවට ගෙන ඇත. අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ සංවිධානයේ අම්පාර දිස්ත්‍රික් සභාපති තම්බිරාසා සෙල්වරානි අතුරුදහන් වූවන් සඳහා යුක්තිය සහ අපරාධ පිළිබඳව අන්තර්ජාතික විමර්ශනයක් ඉල්ලා 2023 ජනවාරි 30 විරෝධතාවයක් පැවැත් වූවාය. ඔවුහු ආණ්ඩුවේ වන්දි මුදල වන රු. 200,000 ( $ 550) මුදලද ප්‍රතික්ෂේප කළහ. ඇය පොතුවිල් මහෙස්ත්‍රාත් උසාවියට[37] [38] [39] කැඳවනු ලැබිණ. 2022 නොවැම්බර් මුලියාවලෙයි පොලිසිය මුලියවලෙයි තියිලුම් ඊළාම් සුසාන භූමියේ පැවති මහාවීර් නාල් උත්සවය ගැන ප්‍රශ්න කිරීමට දෙමළ ජාතිකයන් හය දෙනෙකු කැඳවා ඔවුන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. තමිල් ඊළාම් විමුක්ති කොටි සංවිධානයට[40] සම්බන්ධයැයි සැක කෙරෙන චිත්‍ර ඇතුළත් සුසාන භූමියට පිවිසෙන ස්ථානයේ ඉදි කර තිබූ සැරසිලි ගැන ඔවුන්ගෙන් ප්‍රශ්න කර ඇත.

2023 පෙබරවාරි

රාජ්‍ය නිදහස් දින උත්සවවලට එරෙහිව පැවති නිහඬ විරෝධතාවයක් පොලීසිය ජල ප්‍රහාර එල්ල කොට විසිරුවා හරින ලදී. මෙම සිද්ධිය ගැන පසුව විමර්ශනයක් කළ මානව හිමිකම් කොමිසම හඳුනා නොගත් කණ්ඩායමක් පැමිණ කලබල ඇති කිරීමෙන් පසු පොලිසිය සාමකාමී විරෝධතාකරුවන් විසුරුවා හැරීමට කඳුළු ගෑස් යොදා ගෙන ඇතැයි පැවසුවේය.[41] යාපනය නගරය හරහා ගමන් කරමින් තිබූ නිදහස් දින උත්සවවලට විරෝධය දැක්වීමේ පෙළපාලියක් වැළැක්වීමට පොලීසිය අවස්ථා කීපයක දීම උත්සාහ කෙළේය. ප්‍රධාන වශයෙන් මැතිවරණය කල් නොදමන ලෙස ඉල්ලා විපක්ෂයේ ප්‍රධාන පක්ෂ දෙක වන ජාතික ජන බලවේගය සහ සමගි ජනබලවේගය සංවිධානය කළ විරෝධතාවයක් පොලීසියෙන් කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා විසිරුවා හරින ලදී. ජාතික ජන බලවේගයේ විරෝධතාවයේ දී 29 දෙනෙකුට

---

36 36 https://www.newsfirst.lk/2023/01/16/iusf-protest-tear-gassed-twice-in-colombo/

37 37 https://www.newsfirst.lk/2023/01/16/iusf-protest-tear-gassed-twice-in-colombo/

38 https://www.newsfirst.lk/2023/01/16/iusf-protest-tear-gassed-twice-in-colombo/
39 39 https://english.theleader.lk/news/3547-ampara-activist-summoned-before-courts
40 40 https://english.theleader.lk/news/3547-ampara-activist-summoned-before-courts
41 41 https://www.newsfirst.lk/2023/02/05/hrcsl-probes-attack-on-peaceful-protestors-in-maradana-on-eve-of-independence-day/

තුවාල සිදු වූ අතර පුද්ගලයෙකු මිය ගියේය. ජනාධිපති රනිල් වික්‍රමසිංගේ යාපනය සංචාරයට විරෝධය දැක් වූ දෙමළ ජනතා ජාතික පෙරමුණේ පාර්ලිමේන්තු මංත්‍රී සෙල්වරාජා කජේන්ද්‍රන් සහ ඔවුන්ගේ නිති උපදේශක නිතිඥ කනගරත්නම් සුගේෂ් සමග විරෝධතාකරුවන් 17ක් අත්අඩංගුවට ගන්නා ලදී. 2022 දෙසැම්බර් සිට වසා දමා ඇති බෞද්ධ සහ පාලි විශ්වවිද්‍යාලය විවෘත කිරීමට බල කෙරෙමින් අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බලමණ්ඩලය සංවිධානය කළ විරෝධතාවයක් පොලීසියෙන් ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් යොදා විසිරුවා හරින ලදී. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට විරුද්ධව වෙනත් ජාතිවාදී භික්ෂු කණ්ඩායමක් පැවැත් වූ විරෝධතාවයකට පොලීසියෙන් බාධා කෙළේය. ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිය සමාලෝචනයට ලක් කරන ලෙස ඉල්ලා බැංකු, සෞඛ්‍ය, වරාය හා බලශක්ති අංශවල සේවකයන් සංවිධානය කළ විරෝධතාවයකට එරෙහිව අධිකරණ නියෝගයක් නිකුත් කෙරිණ.

2023 මාර්තු

මහනුවර ගෝඨා ගෝ ගම ක්‍රියාකාරිකයෙකු වූ ධනන්ජය රත්නායක පසුගිය වසරේ ඇඳිරි නීතිය උල්ලංඝනය කිරීම සහ නීති විරෝධී රැස්වීමකට සහභාගිවීම යන චෝදනා යටතේ පොලිසියෙන් අත්අඩංගුවට ගත්තේය. වසර හයක් තිස්සේ තම කඳවුර වශයෙන් යොදා ගත් මඩුවකට අනවසරයෙන් විදුලිය ලබා ගත්තේය යන චෝදනාව යටතේ අතුරුදහන් වූවන්ගේ ඥාතීන්ගේ සංගමයේ ප්‍රධානි කාසිපිල්ලෙයි ජයවනිතා පොලිසියෙන් අත්අඩංගුවට ගත්තේය. පොලීසිය පසුගිය සතියේ විරෝධතාකරුවන් විසුරුවා හැරීමට කල් ඉකුත් වූ කඳුළු ගෑස් සහ අපවිත්‍ර ජලය යොදා ගත් බවට තමන්ට විශ්වාස කටයුතු තොරතුරු ලැබී ඇතැයි විපක්ෂයේ දේශපාලන පක්ෂයක් වන ජාතික ජන බලවේගය නියෝජනය කරන නිතිඥයෝ පැවසූහ. ඉන් මරණ තුනක් සහ සෞඛ්‍ය ගැටලු මතුව ඇතැයි ඔවුහු කීහ. එම කඳුළු ගෑස් පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙස ඔවුහු තොරතුරු ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රයකින් ඉල්ලුම් කළහ. අන්තර්විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය කොළඹ පැවැත්වීමට නියමිත විරෝධතාවයක ට එරෙහිව වාරණ නියෝගයක් පොලීසිය කොටුව පොලීසියෙන් ලබා ගත්තේය. එම විරෝධතාවය කොළඹ විශ්වවිද්‍යාලය පසු කරමින් යන විට පොලීසිය කඳුළු ගෑස් සහ ජලප්‍රහාර එල්ල කොට විසුරුවා හැරියේය. පොලීසිය විශ්වවිද්‍යාල පරිශ්‍රයට ඇතුළුව කඳුළු ගෑස් ගැසීම නිසා එහි අධ්‍යාපන කටයුතුවලට ද බාධා පැමිණුනි. කඳුළු ගෑස් වැදීමෙන් විශ්වවිද්‍යාලයේ ආරක්ෂක නිලධාරියෙකු වන ප්‍රියන්ත වන්නිනායක මිය ගියේය. මාර්තු 7 වැනි දා කොළඹ පැවති විශ්වවිද්‍යාල ශිෂ්‍ය විරෝධතාවයක් මර්දනය කිරීමට හමුදාව ලී සහ යකඩ පොළු යොදා ගත් බව ද දක්නට ලැබිණ. සිද්ධිය ගැන විමර්ශනයක් පැවැත් වූ බව පැවසූ බ්‍රිගේඩියර් රවි හේරත් ශ්‍රී ලංකා යුද හමුදාව පිරිස් විසිරුවා හැරීමට සම්බන්ධ නැතැයි කීවේය. ශාස්ත්‍රඥයන් සහ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල පරිශ්‍රයට පොලිසිය බලහත්කාරයෙන් ඇතුළුවීමට එරෙහිව නිතිමය පියවර ගතයුතුයැයි ඉල්ලා සිටිය නමුත් පොලීසිය එම පියවර හේතු යුක්ති කෙළේය. එම සිද්ධියට විරෝධය දැක්වීමට පසුදින කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් පැවැත් වූ විරෝධයක් විසිරුවා හැරීමට ද පොලිසියෙන් කඳුළු ගෑස් ප්‍රහාර එල්ලවිය. කැළණිය විශ්විද්‍යාලයේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාල පරිශ්‍රය ආසන්නයේ පැවැත් වූ විරෝධතාවයක් විසිරුවා හැරීමට ද කඳුළු ගෑස් සහ ජලප්‍රහාර එල්ල කරන ලදී. විරෝධතාකරුවන් නම දෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී. අරගලයේ පළමු සංවත්සරය සැමරීමට කොළඹ අසළ නුගේගොඩ මිරිහාන ප්‍රදේශයේ ජුබිලිකණුවේ මාර්තු 31 පැවැත්වීමට සූදානම් කළ විරෝධතාවය ද පොලිසියෙන් කඩා කප්පල් කරන ලදී. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ද එහි ඉල්ලීමක් විය. ක්‍රම ක්‍රමයෙන් ගොඩ නැගෙමින් පවතින ආර්ථිකය කඩා කප්පල් කිරීමට විරෝධතාකරුවන් උත්සාහ කරන නිසා ජනතාව ඉක්මණින්ම ඔවුන්ට පහර දෙනු ඇතැයි සංචාරක රාජ්‍ය ඇමති ඩයනා ගමගේ පැවසුවාය.

2023 අප්‍රේල්

අරගලයේ සංවත්සරය වන අප්‍රේල් 9 වැනි දා සැමරීමට අන්තර් ආගමික සංවිධානය ගාළු මුවදොර සූදානම් කළ ඉෆ්තාර් උත්සවයකට මුස්ලිම් නොවන අය සහභාගිවීම වැළැක්වීමට පොලිසිය උත්සාහ කෙළේය. ගාලු මුවදොර පිටියේ අරගලයේ සංවත්සරය පැවැත්වීමට ඉඩ දුන්නේ නැත. වගා බිම් ප්‍රදේශයක බුදුරුවක් තැබීමට විරෝධය දැක් වූ ගොවීන්ට බෞද්ධ භික්ෂුවකගේ ආරක්ෂක භටයන් තර්ජනය කෙළේයැයි වාර්තා වේ. පුද්ගලීකරණයට එරෙහිව අර්ධ රාජ්‍ය විදුලි සංදේශන සමාගමක් වන ටෙලිකොම් වෘත්තීය සමිති සංවිධානය කළ විරෝධතාවයක් පොලිසියෙන් කඩාකප්පල් කරන ලදී. ශිෂ්‍ය ක්‍රියාකාරිකයන් නිදහස් කරන ලෙස ඉල්ලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ඉදිරියේ උද්ඝෝෂණය කළ ශිෂ්‍යයන් විසිරුවා හැරීමට පොලිසිය කඳුළු ගෑස් සහ ජලප්‍රහාර යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සිද්ධිය ගැන පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පොලිස්පතිට දන්වන බව පැවසුවේය.

2023 මැයි

2022 ජනතා උද්ඝෝෂණ සමයේ කොළඹ ගාලු මුවදොර ආණ්ඩු විරෝධී සාමකාමී විරෝධතාකරුවන්ට පහර දුන් 2022 මැයි 9 දින අනුස්මරණය කිරීම සඳහා පැවැත්වීමට සැලසුම් කළ සංවත්සර උත්සවය වළක්වාලමින් කොළඹ කොටුව මහෙස්ත්‍රාත් වාරණ නියෝගයක් නිකුත් කෙළේය. මැයි 9 ප්‍රහාරයේ වින්දිතයෙකු මෙන්ම එම වසරේම පහර කෑමට ලක්ව අත්අඩංගුවට පත්ව සිටි අරගලයේ විරෝධතාකාරිණියක් වන මොරීන් නූර් නම් මුස්ලිම් කාන්තාව යුක්තිය ඉල්ලා පෙළපාලියේ ගමන් කරන විට පොලිසියෙන් අත්අඩංගුවට ගෙන ඇත. බෞද්ධ භික්ෂූන්ගේ නායකත්වයෙන් යුත් අන්ත ජාතිවාදී සිංහල බෞද්ධ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ පළමු අදියරේ දී මිය ගිය අයට ගරු කිරීම සඳහා කොළඹ පැවති උත්සවයක් කඩාකප්පල් කිරීමට උත්සාහ කළහ. පොලිසිය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයින් මැයි 16 සංවිධානය කළ විරෝධතාවයක් තඩාකප්පල් කෙළේය. මැයි 18 කැළණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සැලසුම් කළ උද්ඝෝෂණයක් ද, මැයි 23 වැනි දා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සංවිධානය කළ උද්ඝෝෂණයක් ද පොලිසියෙන් කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීමෙන් විසුරුවා හරින ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පැවැත්වීමට සැලසුම් කර ඇතැයි කියන රැස්වීමක් ගැන බුද්ධි තොරතුරු ලැබීම නිසා විශ්වවිද්‍යාල පරිශ්‍රය අවට පොලිසිය සහ හමුදාව විශාල වශයෙන් යොදවා තිබිණ.

2023 ජූනි

ජූනි 4 වැනි දා කොළඹ පැවති නිදහසේ ආඩම්බරය නම් ( Pride of Freedom Parade )පෙළපාලියේ සංවිධායකයන් ගැන විමර්ශනය කිරීමට කලින් තිබූ සැලසුම් ආණ්ඩුව අතහැර දැමුවේයැයි වාර්තා වේ. ජූනි 18 වැනි දා පැවති තවත් ආඩම්බර පා ගමණක් වැළැක්වීමට ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු සහ දේශපාලකයෙකු උත්සාහ ගෙන ඇතැයි වාර්තා වේ. මෙම අභියෝග අතර සමහර ආඩම්බරයේ උත්සවවලින් ශ්වේතරක්ත සේදීම සහ ආණ්ඩු විරෝධී හැඟීම් බැහැර කිරීමේ උත්සාහයක් පවතින බව ද දක්නට ලැබිණ. ජාතික ජනබල වේගයේ සාමාජිකයන් ජාතික මැතිවරණ කොමිසම ඉදිරියේ පැවැත්වීමට

සංවිධානය කළ විරෝධතාවයකට වාරණ නියෝගයක් අධිකරණයෙන් නිකුත් කෙරිණ. ජුනි 7 වැනි දා අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය මෙහෙය වූ පෙළපාලියක් කොළඹ අසළ නගරයක් වූ නුගේගොඩ පසු කරන විට පොලීසියෙන් කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කොට විසිරුවා හරින ලදී. දින කීපයකට පෙර සිවිල් ඇඳුමෙන් සිටි රාජ්‍ය බුද්ධි නිලධාරීන්ට තම අනන්‍යතාවය හෙළි කිරීමට බල කිරීමෙන් පොලීසියේ කටයුතුවලට බාධා කරන ලදැයි පාර්ලිමේන්තු මංත්‍රී සහ දෙමළ ජනතා ජාතික පෙරමුණේ (TNPF) නායක ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් අත්අඩංගුවට ගන්නා ලදී. පාර්ලිමේන්තු රැස්වීමට සහභාගිවීමට කොළඹ පැමිණ සිටිය දී අත්අඩංගුවට ගත් ඔහු ප්‍රකාශයක් සටහන් කර ගැනිමට යාපනයට ගෙන ගොස් ඇත.  අවස්ථා දෙකක දී මෙම සිද්ධිය සම්බන්ධයෙන්ම කාන්තාවන් තිදෙනෙකු ඇතුළත් දෙමළ ජනතා ජාතික පෙරමුණේ සාමාජිකයන් සිවු දෙනෙකු පොලීසියෙන් සිරභාරයට ගෙන ඇත.

2023 ජුලි

1983 කළු ජූලිය, දෙමළ ජන ඝාතනය සිහිපත් කිරීමේ නිහඬ විරෝධතාවයක් සිංහල ජාතිවාදීන් විසින් කඩාකප්පල් කරන ලදී. කළු ජූලිය සැමරීමට කොළඹ පැවති තවත් විරෝධතාවයක් විසිරුවා හැරීමට පොලිසිය කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා ගන්නා ලදී. යෝජිත කම්කරු නීති සංශෝධන පනත සහ විශ්‍රාම අරමුදල් යොදා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ සටහනට විරෝධය දැක්වීමට ඒකාබද්ධ වෘත්තීය සමිති පෙරමුණ සංවිධානය කළ විරෝධතාවය විසිරුවා හැරීමට ද කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා ගන්නා ලදී. වෘත්තීය සමිති මෙහෙය වූ උද්ඝෝෂණ තුනක් ඉහතින් සඳහන් කළ විරෝධතාවය ද ඇතුළත්, තහනම් කිරීමට අධිකරණ නියෝග ලබා ගෙන තිබිණ. 2022 ආණ්ඩු විරෝධී අරගල භූමියට ආණ්ඩුවට හිතවත් මැර පිරිස් කඩා වැදී පහර දීමේ පළමු සංවත්සරය සැමරීමට ඒක පුද්ගල විරෝධතාවයක් පැවැත් වූ මොරීන් නූර් අත්අඩංගුවට ගැනීමෙන් පොලීසිය තම මූලික අයිතිවාසිකම් කඩකර ඇතැයි  ඇය ගොනු කළ පෙත්සම පවත්වා ගෙන යැමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර ලබා දුන්නේය. ශ්‍රේෂ්ඨාධිකරන නියෝගය ලැබී පැය කීපයකට පසුව ඇයට ජුලි 25 වැනි දා කලින් විස්තර සඳහන් නොකළ විමර්ශනයක් සඳහා තම කාර්යාලයට පැමිණෙන්නැයි ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ කොට්ඨාශයට ඇයට දන්වා ඇත.

2023 අගෝස්තු

ප්‍රධාන වශයෙන් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමට සහ වෙනත් කරුණු ගැන කොළඹ පැවැත්වීමට සැලසුම් කළ විරෝධතාවලට එරෙහිව අධිකරණ නියෝග හතරක් ලබා ගෙන තිබිණ. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය අගෝස්තු 10 පැවැත් වූ උද්ඝෝෂණයට එරෙහිව වාරණ නියෝග දෙකක් ලබා ගෙන තිබිණ. පොලීසිය කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර යොදා ගනිමින් විරෝධතාවය විසිරුවා හැරි අතර විරෝධතා දැක් වූ 22ක් අත්අඩංගුවට ගන්නා ලදී. ඊට පසු දින නීති සම්පාදකයින් කණ්ඩායමක් පැවැත්වීමට නියමිත විරෝධතාවයකට එරෙහිව ද වාරණ නියෝගයක් ලබා ගන්නා ලදී. වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන් කණ්ඩායමක් පැවැත්විමට නියම කර ගෙන තිබූ උද්ඝෝෂණයකට එරෙහිව ද වාරණ නියෝග නිකුත් කර තිබිණ. සමහර අවස්ථාවල පාර දෙපස සිට විරෝධය දැක්වීමට පොලිසියෙන් ඉඩ ලැබුණ ද පෙළපාලි යැමෙන් වළක්වන ලදී. මතභේදයට තුඩු දී ඇති කුරුන්දමලෙයි පුරා විද්‍යා ස්ථානයේ පැවැත්වෙන හින්දු

ආගමික පුද පූජා තහනම් කිරීමේ නියෝගයක් ලබා ගැනීමට පොලිසිය කළ ඉල්ලීම අධිකරණයෙන් ප්‍රතික්ෂේප කිරීම නිසා සිංහල ජාතිවාදී කණ්ඩායමක් එය කඩාකප්පල් කිරීමට උත්සාහ කළහ.

2023 සැප්තැම්බර්

1987 සැප්තැම්බර් මස උපවාසයකින් මිය ගිය දෙමළ කැරලි නායක තිලීපන් ගේ 32 වැනි අනුස්මරණය වෙනුවෙන් ඉදි කර තිබූ පාවෙන සැරසිලි සිංහල ජාතිවාදී කණ්ඩායමක් විසින් විනාශ කර දමන ලදී. ප්‍රහාරය සම්බන්ධයෙන් පොලිසිය පුද්ගලයන් හය දෙනෙකු අත්අඩංගුවට ගත්තේය. එම පාවෙන අනුස්මරණ සැරසිල්ල උතුර සහ නැගෙනහිර පළාත් හරහා සංචාරය කිරීම වැළැක්වීමට පොලිසිය අයැදුම් කළ වාරණ නියෝග ගණනාවක්ම අධිකරණයෙන් ප්‍රතික්ෂේප කෙරිණ. අනුස්මරණ සැරසිල්ලට එරෙහි වෛරය දනවන පෝස්ටර් මන්නාරමේ දක්නට ලැබිණ. ක්‍රිස්තියානි සහෝදරත්ව ව්‍යාපාරය කොළඹ තිලීපන් අනුස්මරණ උත්සවයක් පැවැත්වීමට උත්සාහ කළ නමුත් ඊට එරෙහිව වාරණ නියෝග දෙකක් නිකුත් කෙරිණ. එම උත්සවයට සහභාගි වන්නන්ට පහර දෙන බවට තර්ජනය කළ පෝස්ටර් සමාජ මාධ්‍යයේ හුවමාරු විය. පේරාදෙණිය ශිෂ්‍ය සංගමය සංවිධානය කළ උද්ඝෝෂණයක් පොලීසියෙන් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කොට විසිරුවා හරින ලදී. නැගෙනහිර පළාතේ රජයේ අනුග්‍රහයෙන් කෙරෙන ඉඩම් අල්ලා ගැනීම්වලට එරෙහිව පෙනී සිටින දෙමළ ක්‍රියාකාරිකයෙකු වන බල්රාජ් රාජ්කුමාර්ට ත්‍රිකුණාමලය පොලිසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවා දීර්ඝ ලෙස ප්‍රශ්න කර තිබිණ.

2023 ඔක්තෝබර්

මුලතිවු දිස්ත්‍රික් විනිසුරු ටී සරවණරාජා මුහුණ දී ඇතැයි කියන තර්ජන පිළිබඳව පරීක්ෂණයක් ඉල්ලා උතුරු පළාතේ නීතිඥයන් සංවිධානය කළ විරෝධතාවයක් පොලිස් නිලධාරීන් විසින් ඡායාරූප ගත කරන ලදී. පොලීසිය කිරි ගොවීන්ගේ විරෝධතාවයක් ඔවුන්ට පහර දී විසිරුවා හරින ලදී. තම පාරම්පරික තණ බිම් අත්පත් කර ගැනීමට එරෙහිව දින 24ක් නොකඩවා උද්ඝෝෂණයක යෙදෙන කිරි ගොවීන් කණ්ඩායමකට එරෙහිව වාරණ නියෝගයක් නිකුත් කර ඇත. ප්‍රදේශයේ අලුතින් බෞද්ධ පන්සලක් ඉදි කිරීමට එරෙහිව විරෝධතාවයක් සංවිධානය කළ අට දෙනෙකුට ත්‍රිකුණාමලය මහෙස්ත්‍රාත් වාරණ නියෝගයක් නිකුත් කෙළේය. අසල්වැසි අම්පාර දිස්ත්‍රික්කයේ සිට මෙම විරෝධතාවයට සහාය දැක්වීමට පැමිණි දෙමළ පවුල් ගණනාවක් මඩකලපුවේ රඳවා ගෙන ඔවුන් විරෝධතාවයට එක්වීම වැළැක්වීමට පැය තුනකට අධික කාලයක් ප්‍රශ්න කර ඇත. කොළඹ ගුරු සංගම්  ගණනාවක් සහ මහනුවර සහ පේරාදෙණියේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් පැවැත් වූ උද්ඝෝෂණවලට පොලීසියෙන් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරන ලදී.

2023 නොවැම්බර්

මයිලතමාඩු කිරි ගොවීන්ගේ විරෝධතාවයකට සහාගි වී ආපසු යාපනයට යමින් සිටි යාපනය විශ්වවිද්‍යාලයේ සිසුන් පිරිසක් සෙන්තිවේල් පොලීසිය මගින් අත්අඩංගුවට ගන්නා ලදී. සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන් සංවිධානය කළ විරෝධතාවයකට පොලීසියෙන් බාධා පැමිණවීය. ඔවුන්ගෙන් 21 දෙනෙකු අත්අඩංගුවට ගනු ලැබිණ. විදුලි ගාස්තු වැඩි කිරීමට විරෝධය දැක් වූ ගම්පහ හොරගස්මුල්ලේ පිරිසක් පොලීසියෙන් විසිරුවා හරින ලදී. ඉන් හය දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

විදුලි ගාස්තු වැඩි කිරීමට එරෙහිව පැවැත් වූ විරෝධතාවයක් ජනාධිපති කාර්යාලය, ජනාධිපති නිවස සහ මුදල් අමාත්‍යාංශයේ පරිශ්‍රයට පිවිසීම වළක්වමින් වාරණ නියෝගයක් කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙන් නිකුත් කෙළේය. මහාවීර් නාල් අනුස්මරණය වෙනුවෙන් නැගෙනහිර පළාතේ පැවති උත්සව කීපයකට පොලීසියෙන් බාධා පැමිණවීමෙන් සිද්ධීන් කීපයක් වාර්තා විය. සන්නද්ධ ගැටුම් අවසන් වීමෙන් පසුව එල්ටීටීඊ සුසාන භූමියක කඩා බිඳ දමා තිබුණු ස්මාරක ප්‍රදේශයේ තරුණයින් කණ්ඩායමක් නැවත ගොඩ නගා අනුස්මරණ උත්සවයට සූදානම් කිර තිබුණ ද නොහඳුනන පිරිසක් එය නැවත කඩා දමා තිබිණ. සිවිල් යුද සමයේ මිය ගිය දෙමළ අය වෙනුවෙන් ඉදි තිබු සුසාන භූමියක පැවැත් වූ මහාවීර් නාල් උත්සවයකට දෙමළ සිවිල් ජනතාව සහභාගිවීම පොලිසියෙන් වළක්වන ලදී. තවත් සිද්ධියක දී නොවැම්බර් 27 වැනි දින වාලච්චේනෙයි පොලිසිය මඩකලපුවේ මහාවීර් නාල් උත්සවය වෙනුවෙන් ඉදි කළ සැරසිලි බලහත්කාරයෙන් ඉවත් කරන ලදී. එය ඉවත් කරන ලද්දේ උසාවි නියෝගයක් අනුව බව පොලිසිය පවසයි. මුතූර් හි පැවැත්වෙන මහාවීර් නාල් උත්සවයකට සහභාගිවීමට යමින් සිටි දෙමළ කණ්ඩායමක් සම්බූර් පොලිස් ස්ථානය ඉදිරිපිට දී නවත්වන ලදී. වාලච්චේනෙයි පොලීසිය පදිංචිකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට ගෙන උත්සවය සඳහා යොදා ගත් ශබ්ද විකාශය යන්ත්‍රය සහ විදුලි ජනක යන්ත්‍රය අත්අඩංගුවට ගෙන ඇත.

2023 දෙසැම්බර්

පොලීසිය පාර්ලිමේන්තුව අසළ පැවති උද්ඝෝෂණයක් කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර එල්ල කිරීමෙන් විසිරුවා හරින ලදී. එය ජාතික ජන බලවේගයේ කාන්තා අංශය සංවිධානය කර තිබුණේ වැඩිවන ජීවන වියදම, වැඩිවන බදු බර සහ තවත් කරුණු ගණනාවක් මුල් කර ගෙන ය. 1984 දී මුලතිවු දිස්ත්‍රිකකයේ ඔඩ්ඩුසුඩාන් හි එතියමලෙයි ගමේ දෙමළ සිවිල් වැසියන් 32 ක් ඝාතනය කිරීමේ 39 වැනි සංවත්සරය සැමරීමට සංවිධානය කර තිබූ උත්සවයකට පොලීසියෙන් බාධා පමුණුවන ලදී. ශබ්ද විකාහන යන්ත්‍ර සඳහා බලපත්‍ර ලබා ගෙන නැති නිසා උත්සවය නතර කරන මෙන් පොලීසිය සංවිධායකයන් ට නියෝග කෙළේය. මධ්‍යම අධිවේගී මාර්ගය ඉදි කිරීම නිසා නිවාස අහිමි වූ පවුල් 600 කට ආසන්න සංඛ්‍යාවක් කුරුණෑගල ගැට්ටුවාන පිවිසුම අසළ සත්‍යාග්‍රහයක් පැවැත් වූහ. විරෝධතාකරුවන් අව්වෙන් වැස්සෙන් ආවරණය වීමට මඩුවක් ඉදි කිරීමට සූදානම් වුවද ඒ සඳහා ගෙනෙන ලද සියලුම දේ පොලීසිය සිය භාරයට ගත්තේය.

# 6. ප්‍රකාශනයේ නිදහස මර්දනය

2023 මැයි

ශ්‍රී ලංකාවේ වේදිකා ප්‍රහසන ශිල්පීන් කීප දෙනාගෙන් කෙනෙකු වන නටාෂා එදිරිසූරිය බුද්ධාගමට අපහාස කෙළේයැයි **ICCPR** පනත සහ වෙනත් නිති යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලදී. එම සිද්ධියටම අදාලව **SL.VLOG** හිමිකරු බෲනෝ දිවාකර ද සිරභාරයට ගන්නා ලදී. එම ප්‍රහසන සන්දර්ශනයට පැමිණි අයගෙන් ද ප්‍රශ්න කොට ප්‍රකාශන ලබා ගත යුතුයැයි පොලිස් ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිහාල් තල්දූවගේ පැවසුවේය. එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍ර විනාශයේ වින්දිතයන්ට වන්දි ගෙවීම පිළිබඳව ප්‍රකාශයට පත් කළ වීඩියෝ පටියක් ගැන ප්‍රකාශයක් ලබා ගැනීමට යූ ටියුබ් ලේඛක දර්ශන හඳුන්ගොඩ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවූයේය.




බුද්ගමට අපහාස කෙළේයැයි ප්‍රහසන ශිල්පිනී සහ ක්‍රියාකාරිකා නටාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගනු ලැබිණ. බෞද්ධ භික්ෂුවක් පැමිණිලි කීපයක් ඉදිරිපත් කිරීමෙන් පසු පොලීසිය ඇයට ICCPR පනත යටතේ චෝදනා ඉදිරිපත් කර ඇත.

2023 ජුනි

දෙමළ ජාතික ජනතා පෙරමුණේ නායක ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් ට එරෙහිව රාජ්‍ය බුද්ධි අංශවලින් ඇතැයි කියන තර්ජන පිළිබඳව වීඩියෝ පටියක් සකස් කිරීම ගැන නිදහස් ජනමාධ්‍යවේදීන් වන ප්‍රදීපන් තම්බිතුරෙයි සහ ධර්මලිංගම් කිලිනොච්චියේ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ විශේෂ අපරාධ කාර්යාලයට කැඳවා ඇත. ඔවුන් වීඩියෝ පටිය ලබා ගත්තේ කෙසේද, ප්‍රවෘත්තිය සඳහා තොරතුරු ලබා ගත්තේ කෙසේද යන්න ගැන දිගින් දිගටම ප්‍රශ්න කර ඇත. කොළඹ අවට පැවති ශිෂ්‍ය විරෝධතාවයක් වාර්තා කිරීමේ දී අල් ජසිරා වාර්තාකාරිණිය මිනෙලි පර්නැන්ඩස් ට ජල ප්‍රහාරයක් වැදී ඇත. වේදිකා ප්‍රහසන ශිල්පිනි නටාෂා එදිරිසූරිය සිරභාරයට ගැනීම හෙළා දකිමින් පැවැත් වූ පුවත් පත් සාකච්ඡාවේ දී උසාවියට අපහාස කරන ලද්දේයැයි චෝදනාව යටතේ ජනමාධ්‍යවේදී සහ මානව අයිතාවාසිකම් ක්‍රියාකාරික තරිඳු උඩුවරගෙදර පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කර ඇත. 2022 ජනතා අරගලයේ ක්‍රියාකාරී සාමාජික සහ සමාජ මාධ්‍ය ක්‍රියාකාරික පියත් නිකේශල 2022 ජුලි මස අගමැති රනිල් වික්‍රමසිංහ ගේ නිවස විරෝධතාකරුවන් විසින් ගිනි තැබීම සජීවී ව විකාශනය කිරීම සම්බන්ධයෙන් ජුනි 26 වැනි දා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අත්අඩංගුවට ලන්නා ලදී.

හමුදාව අපහාසයට ලක් කෙරෙන වීඩියෝ පටියක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ජනමාධ්‍යවේදී ප්‍රසාද් වැලිකුඹුර පරිගණක අපරාධ කොට්ඨාශයට කැඳවා ඇත.

## 7. ක්‍රියාකාරිකයන් සහ තොරතුරු හෙළිකරන්නන් මර්දනය

2023 මැයි

ජනතා අරගල ව්‍යාපාරයේ ප්‍රබල ක්‍රියාකාරිකයෙකු වූ පියත් නිකේශලට ප්‍රාදේශීය දේශපාලකයෙකුගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් පහර දුන්හ. පසුව ඔහු ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටිය දී අත්අඩංගුවට ගෙන ඇත. මඩකලපුව AHAM මානුෂීය සම්පත් කේන්ද්‍රයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන පද්මනාදන් සිරෝජන් මඩකලපුව නාරිපුත්තෝටම් හි පැවති අනුස්මරණ උත්සවයක දී 'දෙමළ ජනඝාතන අනුස්මරණ දිනය'' යන්න සඳහන් බැනරයක් ප්‍රදර්ශනය කිරීම නිසා පොලිසියෙන් අත්අඩංගුවට ගෙන ඇත. මානව අයිතිවාසිකම් නීතිඥ සහ ක්‍රියාකාරික ප්‍රියලාල් සිරිසේන ට මැයි 25 වැනි දා හඳුනා නොගත් ඇමතුමකින් මරණ තර්ජන එල්ල කර ඇත. කොළඹ සමාජ ක්‍රියාකාරකයෙකු වන සුජීත් අන්නමලෙයි බුද්ධාගම සහ සංස්කෘතිය විනාශ කිරීමේ න්‍යාය පතුයේ කොටස්කරුවෙක්යැයි චෝදනා කරමින් බලන්ගොඩ කස්සප නම් භික්ෂුවක් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීමෙන් පසු ඔහු අත්අඩංගුවට ගන්නා ලෙස සුජීත් අන්නමලෙයි පොලිසියෙන් ඉල්ලීමක් කෙළේය.

2023 අගෝස්තු

හම්බන්තොට මයුරපුර ගොවි නායකයෙකු සහ ක්‍රියාකාරිකයෙකු ට පහර දීමෙන් ලත් තුවාල නිසා රෝහල් ගත කිරීමට සිදු විය. මෙවැනි සිද්ධියක් ජූලි මාසයේ දි ද සිදු වූ නිසා විරෝධතාවය දැක් වූ ගොවීහු ඒ සිද්ධීන් දෙක ගැනම වහාම පරීක්ෂණයක් පවත්වන මෙන් ඉල්ලා සිටියහ. මඩකලපුව දිස්ත්‍රික්කයේ අතුරුදහන් කළ අයගේ ඥාතින්ගේ සංගමයේ සම්බන්ධීකාරක අමලනායගි ට අපහාස වන ආකාරයේ පෝස්ටර් මඩකලපුව නගරයේ තැනින් තැන ප්‍රදර්ශනය කර තිබිණ.

2023 නොවැම්බර්

ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ නායක එන් නගුලේස් මහාවිර් නාල් උත්සවයට සහභාගි වී කළ ප්‍රකාශයක් ගැන විමර්ශනය කිරීමට ඔහු පොලිසියට රැගෙන ගොස් ඇත.

## 8. මර්දනකාරි නීති සහ ප්‍රතිපත්ති පියවර

2023 ජනවාරි

ජනවාරි මස ජනාධිපති රනිල් වික්‍රමසිංහ ජනාධිපති කාර්යාලයේ දී මාධ්‍ය ආයතන ප්‍රධානින් සමග පැවැත් වූ සාකච්ඡාවක දී සිංගප්පූරුවේ අංක 2016 තොරතුරු සන්නිවේදන මාධ්‍ය සංවර්ධන අධිකාරියට ( IMDA ) සමාන ආයතනයක් හරහා සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය නියාමනය කිරීමට නව පනතක් ඉදිරිපත් කරන බව පැවසුවේය.[42] සිංගප්පූරුවේ මාර්ගගත බොරු ප්‍රකාශවලින් ආරක්ෂා කිරීමේ සහ පාලනය කිරීමේ පනත (POFMA) සහ තොරතුරු සන්නිවේදන මාධ්‍ය සංවර්ධන අධිකාරිය ( IMDA ) විසම්මුතිය නිහඬ කිරීමට සහ ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට යොදා ගෙන ඇතැයි නොයෙකුත් මානව අයිතිවාසිකම් වාර්තා පෙන්වා දේ.[43] කලින් පැවති ආණ්ඩුවට එරෙහි විරෝධතාවය උත්සන්න වී ආණ්ඩුව බිඳ වැටුණ නිසා යෝජිත පනත ඉදිරිපත් කෙළේ නැත. කෙසේ වුවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ නව පනත 2024 දී ගෙන ඒමට සමත් වූයේය. 2023[44] ජනවාරි[45] මස විදුලි බලය සැපයීම, පෙට්‍රොලියම් සහ ඉන්ධන බෙදා හැරීම සහ සෞඛ්‍ය සේවයේ සියලු අංශ අත්‍යවශ්‍ය සේවා බව ප්‍රකාශ කරමින් ගැසට් නිවේදන දෙකක් නිකුත් කෙළේය. [46] වෘත්තීය සමිති ක්‍රියා මාර්ග අධෛර්ය කිරීමට සහ වැළැක්වීමට අත්‍යවශ්‍ය ඒවා සේවා ලෙස ගැසට් කිරීම ශ්‍රී ලංකාවේ සුපුරුදු ක්‍රියා මාර්ගයකි. සියලුම සන්නද්ධ සේවා සාමාජිකයන් සේවයට කැඳවමින් මාසික ගැසට් පත්‍රය ජනවාරි 20 වැනි දා නිකුත් කෙරිණ. ඒ අනුව හමුදාව සිවිල් කටයුතුවල යෙදවිය හැකිය. එම ගැසට් නිවේදනය ජනාධිපති නිකුත් කරන ලද්දේ මහජන ආරක්ෂක පනත යටතේ ය. (පරිච්ඡේදය 40) [47]

මාර්තු

දැනට පවතින 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ දරදඬු පනත වෙනුවට යෝජිත ප්‍රති-ත්‍රස්ත පනතක් 2023 මාර්තු 17 ගැසට් කරන ලදී. මෙම පනතින් විසම්මුතිය මර්දනය කිරීමට, ප්‍රකාශනයේ නිදහස සීමා කිරීමට සහ වෙනත් මානව අයිතිවාසිකම් මර්දනයට අවස්ථාව ලැබෙනු ඇතැයි මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීහු පෙන්වා දෙති. 2022 ආණ්ඩු විරෝධී අරගලයට අරමුදල් ලබා දුන්, සහාය දුන් සහ දිරිගැන් වූ අය ගැන විමර්ශනය කිරීමට ජනාධිපති කොමිසමක් පත් කිරීමට රජයේ අවධානය යොමුව ඇතැයි අරුණ පුවත් පත වාර්තා කෙළේය. පෙර මාසවල මෙන් මහජන සාමය පවත්වා ගෙන යෑමට ජනාධිපති විසින් සන්නද්ධ සේවා කැඳවීම සිදු වෙමින් පවතින නග්න හමුදාකරණයේ ලකුණකි. විදුලි බලය සැපයීම, පෙට්‍රොලියම් සහ ඉන්ධන බෙදා හැරීම සහ සෞඛ්‍ය සේවයේ සියලු අංශ අත්‍යවශ්‍ය සේවා බව ප්‍රකාශ කරමින් ගැසට්

---

[42] 42 http://www.adaderana.lk/news/87400/sri-lanka-to-introduce-new-laws-to-regulate-social-media

[43] 43 https://monitor.civicus.org/updates/2022/12/20/singapore-authorities-continues-its-use-restrictive-laws-harass-critics-and-activists-and-stifle-protests/

[44] 44 http://www.adaderana.lk/news/87400/sri-lanka-to-introduce-new-laws-to-regulate-social-media

[45] 45 https://monitor.civicus.org/updates/2022/12/20/singapore-authorities-continues-its-use-restrictive-laws-harass-critics-and-activists-and-stifle-protests/

[46] 46 https://monitor.civicus.org/updates/2022/12/20/singapore-authorities-continues-its-use-restrictive-laws-harass-critics-and-activists-and-stifle-protests/

[47] https://www.newswire.lk/2023/01/03/extraordinary-gazette-issued-declaring-three-sectors-as-essential-services/

නිවේදන දෙකක් නිකුත් කෙළේය මෙම දරදඬු නීති අනුව වසර 2 සිට 5 දක්වා සිරගත කිරීම, දේපොළ රාජසන්තක කිරීම, වෘත්තීය සමිති ක්‍රියා මාර්ගවල යෙදෙන අයගේ වෘත්තීය ලියාපදිංචිය අහෝසි කිරීම ට හැකිය. මෙම නීති මෙවැනි පරිමාණයකින් මෑත කාලයේ යොදා ගෙන නැති නමුත් අසාධාරණ විරෝධතාවල යෙදෙන වෘත්තීය සමිති නායකයන් ගේ දේපොළ රාජසන්තක කරන බවට එක්සත් ජාතික පක්ෂයේ සභාපති වජිර අබේවර්ධන තර්ජනය කෙළේය. ජනාධිපති පාසලක පැවති උත්සවයක් අමතමින් ගුරුවරුන්ගේ වෘත්තීය සමිති කටයුතු පාලනය කිරීමට පාසල් අධ්‍යාපනය අත්‍යාවශ්‍ය සේවාවක් බවට පත් කෙරෙන නව නීතියක් හඳුන්වා දීමට තමා අදහස් කරන බව පැවසුවේය.

2023 අප්‍රේල්

වරාය අධිකාරිය ගාලු මුවදොර ප්‍රදේශය සමාජ වගකීමේ ව්‍යාපෘතියක් සේ භාර ගෙන ඇති නිසා අනාගතයේ දී ගාලු මුවදොර විරෝධතා ව්‍යාපාරවලට ඉඩ නොලැබෙන බව කැබිනට් ප්‍රකාශක බන්දුල ගුණවර්ධන පැවසුවේය. මාසික ගැසට් නිවේදනයකින් මහජන සාමය පවත්වා ගැනීමට හමුදාව කැඳවීමෙන් හමුදාකරණ නැවත වරක් සංඥා විය. විදුලි බලය සැපයීම, පෙට්‍රෝලියම් සහ ඉන්ධන බෙදා හැරීම සහ සෞඛ්‍ය සේවයේ සියලු අංශ අත්‍යාවශ්‍ය සේවා බව ප්‍රකාශ කරමින් ගැසට් නිවේදන දෙකක් නිකුත් කෙළේය වෘත්තීය සමිති ක්‍රියා මාර්ග අධෛර්ය කිරීමට සහ වැළැක්වීමට ඒවා අත්‍යාවශ්‍ය සේවා ලෙස ගැසට් කිරීම ශ්‍රී ලංකාවේ සුපුරුදු ක්‍රියා මාර්ගයකි. රෝහල්වල සහ සෞඛ්‍ය ආයතනවල කළු කොඩි එසවීම රෝගීන් ගේ මානසික සෞඛ්‍යයට අහිතකර සේ බලපාන්නේයැයි පවසමින් තහනම් කිරීමේ චක්‍ර ලේඛයක් සෞඛ්‍ය අමාත්‍යංශයෙන් නිකුත් කෙරිණ.

2023 මැයි

යෝජිත විකාශන නියාමන කොමිසම පනත ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන තුළ බිය ඇති කිරීමේ ප්‍රයත්නයක් ලෙස විපක්ෂය චෝදනා කරයි. යෝජිත නියාමන කොමිසමට ජනමාධ්‍යවේදීන් සිරගත කිරීමට නීතිමය පියවර ගැනීම, දඩ මුදල් නියම කිරීම, බලපත්‍ර අවලංගු කිරීම සහ මාධ්‍ය ආයතනවලට සහ ජනමාධ්‍යවේදීන්ට එරෙහි වෙනත් පියවර ගැනිමට බලතල ඇත. විදුලි බලය සැපයීම, පෙට්‍රෝලියම් සහ ඉන්ධන බෙදා හැරීම සහ සෞඛ්‍ය සේවයේ සියලු අංශ අත්‍යාවශ්‍ය සේවා බව ප්‍රකාශ කරමින් ගැසට් නිවේදන දෙකක් නිකුත් කෙළේය වෘත්තීය සමිති ක්‍රියා මාර්ග අධෛර්ය කිරීමට සහ වැළැක්වීමට අත්‍යාවශ්‍ය සේවා ලෙස ගැසට් කිරීම ශ්‍රී ලංකාවේ සුපුරුදු ක්‍රියා මාර්ගයකි. නැවත වරක් මහජන ආරක්ෂක පනත යටතේ සන්නද්ධ හමුදා කැඳවීමේ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. ඒ අනුව හමුදාවට සිවිල් කටයුතුවලට මැදිහත් වීමට අතිරේක බලතල හිමි වේ.

2023 ජූනි

ජූනි 27 අධිකරණය, විනිශ්චය සභාව හෝ ආයතනයකට අපහාස කිරීම පිළිබඳ පනත ගැසට් කරන ලදී. යෝජිත පනත ප්‍රකාශ කිරීමේ සහ වෙනත් අයිතිවාසිකම් කෙරේ බරපතළ බලපෑම් ඇති කරවයි. ශ්‍රී ලංකාවේ අධිකරණ සේවා සංගමය ජනාධිපති වෙත ලිපියක් යවමින් මෑතක දී කර ඇති අධිකරණ පත්වීම්වලින් අධිකරණයේ ස්වාධීනත්වයට සහ අධිකරණය කෙරේ ඇති මහජන විශ්වාසයට පටහැනි වන නිසා තම අසතුට පළ කෙළේය. හමුදාකරණය වීමේ ප්‍රවනතා දිගටම පවතින බව පෙන්වමින් මහජන සාමය පවත්වා ගැනීමට සන්නද්ධ හමුදා කැඳවීමේ ගැසට් පත්‍රය නිකුත් කෙරිණ. විදුලි බලය සැපයීම,

පෙට්‍රෝලියම් සහ ඉන්ධන බෙදා හැරීම සහ සෞඛ්‍ය සේවයේ සියලු අංශ අත්‍යවශ්‍ය සේවා බව ප්‍රකාශ කරමින් තවත් ගැසට් නිවේදනයක් නිකුත් කෙළේය.

2023 ජූලි

සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයක් අනුව එහි සේවකයන්ට තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය නැතිව මාධ්‍යයට අදහස් පළ කිරීම තහනම් කර ඇත. රටේ බරපතළ ළමා මන්දපෝෂණ තත්වයක් පවතින බව හෙළි කිරිම නිසා වෛද්‍ය චමල් සන්ජීව ගේ වැඩ තහනම කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත් බවද එම චක්‍ර ලේඛයේ සඳහන් වේ. හමුදාකරණය වීමේ ප්‍රවනතා දිගටම පවතින බව පෙන්වමින් මහජන සාමය පවත්වා ගැනීමට සන්නද්ධ හමුදා කැඳවීමේ ගැසට් පත්‍රයක් ජනාධිපති නිකුත් කෙළේය.

2023 අගෝස්තු

කලින් මාසවල මෙන් හමුදාකරණය දිගටම සිදුවන බව පෙන්වමින් සන්නද්ධ හමුදා කැඳවමින් මාසිත ගැසට් නිවේදනය නිකුත් කෙළේය. කම්කරු වැඩ වර්ජන වළක්වාලිමට සහ අධෛර්යමත් කිරීමට ආණ්ඩුවේ සේවා ගණනාවක් අත්‍යවශ්‍ය සේවා බවට පත් කරමින් තවත් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී.

2023 සැප්තැම්බර්

මර්දනකාරී නීති කෙටුම් පත් දෙකක් වන ප්‍රති-ත්‍රස්ත පනත සහ මාර්ගත ආරක්ෂාව පිළිබඳ පනත සැප්තැම්බර් මැද භාගයේ දී ගැසට් කරන ලදී. මර්දනකාරී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට ගෙන එන ප්‍රති-ත්‍රස්ත පනතේ අපැහැදිලි, පුළුල් අර්ථ ඇති යෙදුම් ඇතුළත් වන අතර දීර්ඝ කාලයක් රක්ෂිත බන්ධනාගාර ගත කිරීම ඇතුළත් චෝදනා නැතිව දීර්ඝ කාලයක් රඳවා ගැනීම, විධායක ජනාධිපතිට අසීමිත බලතල ලබා දීම, සහ පොලිස් බලතල පුළුල් කිරීම ඇතුළත් ය. මාර්ගගත ආළුක්ෂාව පිළිබඳ පනතේද අපැහැදිලි යෙදුම් ඇතුළත් වන අතර දඩුවම් දිය හැකි වරද නම් කර ඇත්තේ පුළුල් අර්ථ ගෙන දෙන ආකාරයට ය. අනවශ්‍ය සහ ප්‍රමාණය ඉක්මවා යන දඩුවම් නියම කළ හැකි අතර විධායක ජනාධිපති විසින් සුවිශේෂීව පත් කරන පුළුල් බලතල සහිත කොමිසන් සභාවක් ද ඇත. එමනිසා එහි ස්වාධීන ක්‍රියාකාරිත්වයේ දි ගැටලු මතු විය හැකිය. දේශීය සහ අන්තර්ජාතිකව සිවිල් සමාජ සංවිධාන විසින් හෙළා දැක ඇති එම පනත් දෙකම වහාම ඉල්ලා අස් කර ගන්නා මෙන් බල කෙරේ. දුම්රිය සේවකයින් වැඩ වර්ජනයක් දියත් කර ඇති නිසා සියලු ප්‍රවාහන සේවා අත්‍යවශ්‍ය සේවා බව දක්වා ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත. සේවයට වාර්තා කිරීමට අපොහොසත් වුවහොත් ඔවුන් ගේ සේවය අත්හිටුවන බවට අනතුරු හඟවන නිවේදනයක් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් නිකුත්කර ඇත. තවත් ගැසට් නිවේදනයකින් විදුලිය, පෙට්‍රෝලියම් සහ සෞඛ්‍ය සේවා අත්‍යවශ්‍ය බව දක්වා දක්වා ඇත. කලින් මාසවල මෙන් හමුදාකරණය දිගටම සිදුවන බවත් සිවිල් අවකාශය වඩාත් පටු වන බවත් පෙන්වමින් සන්නද්ධ හමුදා කැඳවමින් මාසික ගැසට් නිවේදනය නිකුත් කෙළේය

2023 ඔක්තෝබර්

රටේ හමුදාකරණය නොකඩවා සිදුවෙන බව දක්වමින් ජනාධිපති සන්නද්ධ සේවා කැඳවමින් මාසික ගැසට් නිවේදනය නිකුත් කෙළේය. තවත් ගැසට් නිවේදනයකින් විදුලිය, පෙට්‍රෝලියම් සහ සෞඛ්‍ය සේවා අත්‍යවශ්‍ය සේවා බව දක්වා දක්වා ඇත. 2022 අප්‍රේල් මස මහජන විරෝධතාවයක් පවතින විට රඹුක්කන උද්ඝෝෂකයන්ට පොලිසියෙන් වෙඩි තැබීම නිසා ඔවුන්ට එරෙහිව නීති පියවර ගැනීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම කළ නිර්දේශය හෙළා දකිමින් ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු අංශීය අධීක්ෂණ කොමිටිය ආරක්ෂක රාජ්‍ය ඇමමති වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත.

2023 නොවැම්බර්

තැපැල් සේවකයින් වෘත්තීය ක්‍රියා මාර්ගයක් ගෙන ඇති නිසා තැපැල් සේවාව අත්‍යවශ්‍ය සේවයක් බවට නම් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත. අත්‍යවශ්‍ය සේවා බවට ප්‍රකාශයට පත් කිරීම සාමාන්‍යයෙන් වෘත්තිය ක්‍රියා මාර්ග ගැනීමෙන් සේවකයන් වැළක්වීමට සහ බියගැන්වීමට යොදා ගනී. නොවැම්බර් 8, 9, සහ 10 සියලු තැපැල් සේවකයන්ගේ නිවාඩු අවලංගු කර ඇත. මෙම පියවර ගෙන ඇත්තේ නුවරඑළිය සහ මහනුවර තැපැල් කාර්යාල විකිණීමට එරෙහිව තැපැල් සේවකයන් විරෝධතාවයක් ආරම්භ කිරීම නිසා ය. විදුලිය සැපයුම හා පෙට්‍රෝලියම් සහ ඉන්ධන නිෂ්පාදන සැපයුම සහ බෙදා හැරීම හා සම්බන්ධ සියලු සේවා අත්‍යවශ්‍ය බවට පත් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත. සන්නද්ධ හමුදාවලට සිවිල් කටයුතුවලට මැදිහත්වීමට ඉඩ සැලසෙන මහජන ආරක්ෂක පනත යටතේ මාසික ගැසට් නිවේදනය නැවතත් නිකුත් කරන ලදී. ජාතික එකමුතුව සහ සංහිඳියාව පනත යටතේ නව කාර්යාලයක් විවෘත කිරීම සම්බන්ධයෙන් ජාතික සාම මණ්ඩලය නිවේදනයක් නිකුත් කෙළේය. ප්‍රජා මූලික සංවිධාන ඇතුළත් ප්‍රාදේශීය සංවිධාන පවත්වන සාම සහ සංහිඳියා වැඩ සටහන් අධීක්ෂණයට සහ පහසුකරණයට ONUR කාර්යාලපට ලබා දී ඇති බලතල පිළිබඳව සිය කණස්සල්ල පළ කරමින් ජාතික සාම මණ්ඩලය නිවේදනයක් නිකුත් කර ඇත.

# 9. රාජ්‍ය නිලධාරීන් මර්දනය

2023 අප්‍රේල්

තමාට ලැබී ඇති සාක්ෂි සලකා බැලීමේ දී පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පිටුපස මහා කුමන්ත්‍රණයක් පැවතුණේයැයි හිටපු නීතිපති දප්පුල ද ලිවේරා 2022 දී කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් කටඋත්තරයක් ලබා ගැනීමට ඔහු පොලිසියේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට කැඳවීය. මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරුන් තිදෙනෙකු එහි සභාපතිනිය විශ්‍රාමික විනිසුරු රෝහිනී මාරසිංහ අනෙකුත් සාමාජිකයන්ගේ අදහස් නොවිමසා තම කැමැත්ත අනුව ක්‍රියා කරන්නෙයැයි ජනාධිපතිට පැමිණිලි කොට ඔහු සමග සාකච්ඡාවකට අවසර ඉල්ලා ලිපියක් යවා ඇත. කෙසේ වුවත් සභාපතිනිය ට එරෙහිව ඔවුන්ගේ විවේචනය වූයේ පරීක්ෂණවලට ඉහළ මට්ටමේ දේශපාලකයන් සහ රාජ්‍ය නිලධාරීන් කැඳවීම නිසා ආණ්ඩුවට පක්ෂපාතී සහ දේශපාලන වුවමනාව නිසා ය. වාමාංශික දේශපාලන පක්ෂයක් වන ජාතික ජන බලවේගය සංවිධානය කළ විරෝධතාවයකට සහභාගිවීම නිසා පොලිස් නිලධාරියෙකු ගේ වැඩ තහනම් කර ඇත. සේවයෙන් නිවාඩු ලබා ගත් ඔහු විරෝධතාවයට සහභාගි වූයේ සිවිල් ඇඳුමෙනි.

2023 මැයි

මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධයැයි කියන හඳුනා නොගත් පුද්ගලයන් තිදෙනෙකු කොළඹ නව මැගසින් බන්ධනාගාරයේ නිලධාරියෙකුට ඔහුගේ මීනුවන්ගොඩ නිවසට ගොස් පහර දී මරණ බවට තර්ජනය කර ඇත. බන්ධනාගාර පරිශ්‍රය තුළ මත්ද්‍රව්‍ය වෙළඳාමට මැදිහත් නොවන්නැයි ඔහුට තර්ජනය කර ඇත. මැයි 24 මහජන උපයෝගිතා කොමිසමේ සභාපති ජනක රත්නායක එම තනතුරෙන් ඉවත් කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවෙන් සම්මත කෙරිණ.

2023අගෝස්තු

බෞද්ධ භික්ෂූන් කණ්ඩායමක් නව පන්සලක් තැනීමට අනුමැතිය ලබා දෙන ඉල්ලා මඩකලපුව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලයේ ආණ්ඩුවේ නිලධාරීන්ට තර්ජනය කළහ. විවාදයට ලක්ව ඇති කුරුන්තමලෙයි පුරාවිද්‍යා ස්ථානයේ පුද පූජා පැවැත්වීමට හින්දූන්ට අවසර දුන් මහෙස්ත්‍රාත්වරයා මාරු කරන ලෙස දැඩි ජාතිවාදීයෙකු වන පාර්ලිමේන්තු මංත්‍රී සරත් වීරසේකර පාර්ලිමේන්තුවේ දී ඉල්ලා සිටියේය.

2023 ඔක්තෝබර්

මහජන උපයෝගිතා ගාස්තු වැඩි කිරීම ප්‍රතික්ෂේප කිරීම ඇතුළු කරුනු ගණනාවක් මත ආණ්ඩුව සමග එකඟ නොවීම නිසා 2023 මැයි මස තම තනතුරෙන් ඉවත් කිරීමෙන් පසු මහජන උපයෝගිතා කොමිසමේ හිටපු සභාපති ජනක රත්නායකගෙන් කප්පම් මුදල් ඉල්ලා දුරකතනයෙන් තර්ජනය කර ඇත.

2023 දෙසැම්බර්

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂක ෂානි අබ්සේකර රිය අනතුරකින් මරා දැමීමට සැලසුම් කර ඇතැයි කියන කුමන්ත්‍රණයක් ගැන අභියාචනා අධිකරණයට දැනුම් දී ඇතැයි වාර්තා වී ඇත. මෙය හෙළි වූයේ තමාට ඇති ජීවිත තර්ජන නිසා ප්‍රමාණවත් ආරක්ෂාව ලබා දෙන ලෙස පොලිස්පතිගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් ඉල්ලා ෂානි අබේසේකර රිට් ආඥාවක් ලබා ගැනීමට ඉදිරිපත් කළ පෙත්සම් විභාගයේ දීය. දේශපාලකයෙකුට අයත්යැයි කියන මීගමුවේ ඇවෙන්රා ගාර්ඩන් හෝටලයේ මුළුතැන්ගේ පරික්ෂාවට ලක් කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් පස් දෙනා පලි ගැනිමක් වශයෙන් පොලීසියට කැඳවා ඇත.

# 10. පළාත් පාලන ඡන්ද විමසීම

2023 ජනවාරි

තම තනතුරුවලින් ඉල්ලා අස්වන්නැයි මැතිවරණ කොමිසමේ සාමාජිකයන් තිදෙනෙකුට මරණ කර්ජනය එල්ල කර ඇත. කැබිනට් තීරණයක් අනුව මැතිවරණ අපේක්ෂකයන්ගෙන් ඇප මුදල් භාර නොගන්නැයි රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු පළාත් පාලන සහ පලාත් සභා අමාත්‍යංශයේ ලේකම් ලිපියකින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට දන්වා ඇත.  හමුදාවේ විශ්‍රාමික කර්නල්වරයෙකු  ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයක් පවතින නිසා පළාත් පාලන ඡන්ද විමසීම නතර කරන්නැයි ඉල්ලා රිට් පෙත්සමක් ගොනු කෙළේය. එක්සත් ජාතික පක්ෂයේ වාරියපොළ කාර්යාලයට දේශපාලන විරුද්ධවාදීයෙකු පෙට්‍රොල් බෝම්බයකින් පහර දී ඇත.

2023 පෙරවාරි

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මුදල් ඇමති ලෙස චක්‍රලේඛයක් නිකුත් කර රජයේ වියදම් අත්‍යවශ්‍ය සේවා ලැයිස්තුවකට පමණක් සීමා කරන ලෙද දන්වා සිටියේය. එම ලැයිස්තුවට මැතිවරණයට අදාල වියදම් ඇතුළත් වූයේ නැත. අනතුරුව මුදල් සහ භාණ්ඩාගාරයේ ලේකම් පළාත් පාලන ඡන්ද විමසීමට අරමුදල් නිකුත් කිරීමට නොහැකි බව ජාතික මැතිවරණ කොමිසමට දැන් වූයේය. කෙසේ වුවත් පොලිස් ආරක්ෂාව නොමැති නිසාත් අවශ්‍ය අරමුදල් නොලැබෙන නිසාත් ඡන්ද පත්‍රිකා මුද්‍රණය කළ නොහැකි බව රජයේ මුද්‍රණයාලාධිපති කීවේය. ඒ අනුව තැපැල් ඡන්දය නැවත දන්වන තුරු කල් දමන ලදී.

# 11. වෙනත්

2023 ජනවාරි

උසස් පෙළ විභාගය පවත්වන කාලය තුළ විදුලිය සැපයුම අඛණ්ඩව ලබා දෙන්නැයි විදුලි බල මණ්ඩලයේ අනුමැතිය බලහත්කාරයෙන් ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ සාමාජිකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට තමා උපදෙස් ලබා ගන්නා බව විදුලිබල ඇමති කන්චන විජේසේකර පැවසුවේය.

රටේ ආර්ථිකය අස්ථායි කිරීමට දැන් උත්සාහ කරන නිසා සමහර වෘත්තීය සමිති සහ ශිෂ්‍ය සංගම් ත්‍රස්තවාදීන් සේ හැඳින්විය හැකියැයි රාජ්‍ය ඇමති අනුරාධ ජයරත්න කීවේය. කොමිසම සිය ස්ථාවරය වෙනස් කිරීම ගැන තම විරෝධය දැක්වීමට මහජන උපයෝගිතා කොමිසමට වෙනත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමග ගිය වෘත්තීය සමිති දෙකක නායකයින් කොමිසමේ සාමාජිකයන්ට තර්ජනය කෙළේයැයි පසුව අත්අඩංගුවට ගෙන ඇත. මහනුවර දළදා මාළිගාවට අපහාස කිරීමේ චෝදනාවක් මත යූටියුබ් ලේඛක සේපාල් අමරසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ජාත්‍යන්තර සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සන්ධානය පනතේ 3 වැනි වගන්තිය යටතේ නඩු පවරා ඇත.

ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පැවති සමයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බලහත්කාරයෙන් ඇතුළු වූයේයැයි කටුනායක ගුවන් තොටුපොළෙන් ආපසු ලංකාවට පැමිණි ක්‍රියාකාරික රන්දිමාල් ගමගේ අත් අඩංගුවට ගෙන ඇත. ජනාධිපති කාර්යාලයේ තිබී සොයා ගත් මුදල් බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ගේ නියෝගය අනුව ඇමතිවරයෙකුට භාර නොදී අධිකරණයට භාර දීම ගැන ඔහු තමාට තර්ජනය කෙළේයැයි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඩී ඇස් වික්‍රමසිංහ කොටුව මහෙස්ත්‍රාත්ට දනුම් දුන්නේය.



සේපාල් අමරසිංහ බන්ධණාගාර නිලධාරීන් විසින් මහෙස්ත්‍රාත් අධිකරණයට ගෙන යැමේ දී ඡායාරූප අනුග්‍රහය ගයාන් පුෂ්පික via Daily News

2023 පෙබරවාරි

ආණ්ඩු විරෝධී කටයුතු කරන්නේයැයි මහජන උපයෝගිතා කොමිසමේ හිටපු ප්‍රධානි ජනක රත්නායකගේ කාර්යාලය පොලීසියෙන් මුද්‍රා තබන ලදී. ඊට දින දෙකකට පෙර එම සභාපති ආණ්ඩුව මැතක දී ප්‍රකාශයට පත් කළ විදුලි ගාස්තු වැඩි කිරීමේ යෝජනාව සමග එකඟ වූයේ නැත. ඒ වෙනුට මහජන උපයෝගිතා කොමිසම විකල්ප යෝජනාවක් ඉදිරිපත් කෙළේය.
ක්‍රියාකාරික චින්තන අමරසිංහ තොරතුරු ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රයක් භාර දීමට රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධාන කාර්යාලයට පැමිණි අවස්ථාවේ අත්අඩංගුවට ගෙන කුරුඳුවත්ත පොලීසියේ රඳවා ගෙන වධහිංසා පැමිණ වූයේයැයි පැවසේ.
අත්‍යවශ්‍ය සේවා ප්‍රකාශයට පත්කරමින් ගැසට් නිවේදන දෙකක් නිකුත් කර ඇත. එම ගැසට් මගින් කලින් මාසවල මෙන් මහජන සාමය පවත්වා ගැනීමට සන්නද්ධ හමුදා කැඳවා ඇත. ඒ අනුව හමුදාවට සිවිල් කටයුතුවලට මැදිහත්වීමට අතිරේක බලයක් හිමි වේ.

2023 මාර්තු

තම පක්ෂය සමග දේශපාලන කටයුතුවල යෙදීම නිසා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විශ්‍රාමික එයාර් වයිස්මාර්ෂල් සම්පත් තුයකොන්ත ඇතුළු විශ්‍රාමික හමුදා නිලධාරීන් තිදෙනෙකු අසාදු ලේඛන ගත කර ඇතැයි ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේය. දේශපාලනයේ යෙදී සිටින වෙනත් හමුදා නිලධාරීන් බොහෝ දෙනෙකු විශ්‍රාමික හමුදා නිලධාරීන්ට හිමි වරප්‍රසාද භුක්ති විඳින අතර හමුදාවේ හිටපු සමහර නිලධාරීන් ඔවුන්ගේ දේශපාලන මතය අනුව අසාදු ලේඛන ගත කිරීම හෝ වරප්‍රසාද සීමා කිරීම වෙනස් කොට සැලකීමක් බව දිසානායක පෙන්වා දුන්නේය.

2023 අප්‍රේල්

කල් ඉකුත් වූ කඳුළු ගෑස් පිරිස් පාලනයට යොදා ගැනීම පැහැදිලි කළ පොලීසිය ඒවාට නිරාවරණය වීමෙන් මිනිසුන්ට බරපතළ හානියක් සිදු නොවන අතර එහි කාර්යක්ෂමතාවය අඩුයැයි කීවේය. විරෝධතාකරුවන්ගේ මරණ සහ කඳුළු ගෑස්වලට නිරාවරණයවීම අතර කිසියම් සම්බන්ධතාවයක් නැතැයි ඔවුහු කීහ.

කම්කරු සහ විදේශ රැකියා ඇමති මනුෂ නානායක්කාර මඩකලපුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මංත්‍රී ෂානක්‍යන් රාසමානික්කම් සම්බන්ධයෙන් ජාතිවාදී අපහාසාත්මක ප්‍රකාශයක් කෙළේය. මෙම උණුසුම් තත්වය ඇති වූයේ පාර්ලිමේන්තු මංත්‍රී රාසමානික්කම් තම වරප්‍රසාද ගැන ප්‍රශ්නයක් මතු කළ අවස්ථාවේ දීය. ඊට පිළිතුරු දීමේ දී කෝපයට පත් මංත්‍රී මනුෂ නානායක්කාර රාසමානික්කම් ''කොටියා''යැයි හැඳින් වූයේය. (කොටියා යන්න දෙමළ ජාතිකයන් එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ බව හැඟවීමට සිංහල අය යොදා ගන්නා අපහාසාත්මක වචනයකි.''

2023 මැයි

හිටපු ඇමති මර්වින් සිල්වා මාධ්‍යය අමතමින් ඒ වන විට විදෙස් ගතව සිටි ආගමික නායකයෙකු වන ජෙරොම් ප්‍රනාන්දු පියතුමා ලංකාවට පැමිණිය හොත් කායිකව පහර දෙන බවට තර්ජනය කොට ඔහු විදේශ කුමන්ත්‍රණයක හවුල්කරුවෙකුයැයි චෝදනා කෙළේය. තවදුරටත් කතා කළ මර්වින් සිල්වා ජෙරොම් වැනි අය වෛරය සහ ජාතික අසමගිය අවුලන නිසා රටින් පිටුවහල් කළ යුතුයැයි ද සමහර දේශපාලකයන් සහ ඔවුන්ගේ ඥාතීන් ජෙරොම්ගේ අනුගාමිකයන්යැයි ද පැවසුවේය. ජෙරොම් පියතුමා මෙම විවාදාත්මක ප්‍රකාශය කර ඇත්තේ බුද්ධාගම සහ ක්‍රිස්තියානි දහම සංසන්දනය කිරීමේ දී බුදුන් ද ආලෝකය සොයා ගිය අතර ජේසුස් ක්‍රිස්තුස් ආලොකය වන බැවින් ක්‍රිස්තියානි දහමට වැඩි වටිනාකමක් දිය යුතුයැයි කීම නිසා ය. මෙය සමාජ මාධ්‍ය තුළ සහ ඉන් බැහැරව ජෙරොම් ඉලක්ක කර ගත් වෛරී ප්‍රකාශන මාලාවකට හේතු වූ අතර ඔහු අත්අඩංගුවට ගෙන ICCPR පනතේ 3 වැනි වගන්තිය යටතේ 'වෙනස්කොට සැලකීම, එදිරිවාදුකම් හෝ ප්‍රචණ්ඩත්වය උත්සන්න කිරීමක් විය හැකි ජාතික, වාර්ගික, හෝ ආගමික වෛරය ඇති කරවන ප්‍රකාශයක් නිසා නඩු පැවරිය යුතුයැයි කීහ. ජෙරොම් අධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර තමා අත්අඩංගුවට ගැනීමෙන් වළක්වන ලෙස ඉල්ලා සිටියේය. ජෙරොම් ප්‍රනාන්දුගේ රටේ ආගමික එකමුතුවට එරෙහි වෛරී ප්‍රකාශන ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනටමත් විමර්ශනයක් ආරම්භ කර ඇතැයි නීතිපති අධිකරණයට දැනුම් දුන්නේය.

2023 ජුනි

බත්තරමුල්ල සමුපකාර රක්ෂණ සමාගමේ අලුතින් පත් වූ සභාපති දර්ශන සමරවික්‍රම නව තනතුරේ වැඩ භාර ගැනීමට යන විට හඳුනා නොගත් දෙදෙනෙකු විසින් වෙඩි තබා ඇත. කැබිතිගොල්ලෑව අධිකරණයේ වැඩ කරන නීතිඥයෙකු ආපසු පැමිණෙමින් සිටින විට දෙදෙනෙකු විසින් වෙඩි තබා ඇත. තම කාව්‍ය තුළින් අන්තවාදය පතුරුවන්නේයැයි අසාධාරණ ලෙස අත්අඩංගුවට ගෙන වසරකට වැඩි කාලයක් රඳවා ගෙන සිටි කවියෙකු වන අහ්නාෆ් ජසීම් නැවත වරක් ආරක්ෂක අමාත්‍යංශයේ ත්‍රස්තවාදයට සම්බන්ධ පුද්ගලයන් ගේ ලැයිස්තුවට ඇතුළත් කර ඇත.

2023 ජූලි

ජනාධිපති කාර්යාලයේ තිබී සොයා ගත් මුදල් ජනවාරි මස මහජන ආරක්ෂක ඇමතිට භාර නොදීම නිසා බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගේ තර්ජනයට ලක් වූ පොලිසියේ විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ පොලිස් පරීක්ෂක ඩී ඇස් වික්‍රමසිංහ පොලිසියේ පර්යේෂණ සහ සංවර්ධන කොට්ඨාශයේ අධ්‍යක්ෂක ලෙස වහාම ක්‍රියාත්මක වන පරිදි මාරු කර ඇත. 2022 ජූලි මස විරෝධතාකරුවන් ජනාධිපති මන්දිරයට කඩා වැදී එහි තිබී රු.දශලක්ෂ 17.5ක මුදලක් සොයා ගෙන එය පොලීසියට භාර දී ඇත. රාජපක්ෂ පවුල සමග බලවත් සම්බන්ධතා ඇති නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් එම මුදල් පොලිසිය භාර මහජන ආරක්ෂක ඇමති ටිරාන් අලස්ට භාර දීමට උපදෙස් දුන් නමුත් විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක එය අධිකරණයට භාර දුන්නේය. විශේෂ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂකගේ මෙම ස්ථාන මාරුව ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියාගේ උපදෙස් පිළිනොපැදීම නිසා කෙළේදැයි සැකයක් ශ්‍රී ලංකා බ්‍රීෆ් සහ තවත් වෙබ් අඩවිවල මතු කර තිබිණ.

ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ උත්සවයකට සහභාගි වූ නිවාස සහ නාගරික සංවර්ධන ඇමති ප්‍රසන්න රණතුංග තම පක්ෂයේ ආධාරකරුවන්ට හිරිහැර කරන ඕනෑම කෙනෙකුගෙන් පළි ගන්නා බවට තර්ජනය කෙළේය.

2023 අගෝස්තු

උතුරු සහ නැගෙනහිර බෞද්ධ පන්සල් ඉදි කිරීමට එරෙහිව කතා කරන යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මංත්‍රී ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් ගේ කොළඹ නිවස සිංහල ජාතිවාදී දේශපාලකයන් සහ ඔවුන්ගේ ආධාරකරුවෝ වටලා ගත්හ. ප්‍රසිද්ධ රැලියක් ඇමතූ හිටපු පාර්ලිමේන්තු මංත්‍රී මර්වින් සිල්වා උතුරු නැගෙනහිර බෞද්ධ පන්සල්වලට හානි කරන අයගේ හිස ගසා දමන බවට තර්ජනය කෙළේය.
රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි නොවන රා. නො. සං. ඉදිරියේ දී තහනම් කරන බවට මහජන ආරක්ෂක ඇමති ටිරාන් අලස් තර්ජනය කෙළේය.

2023 සැප්තැම්බර්

මුලතිවු දිස්ත්‍රික් විනිසුරු සහ මුලතිවු මහෙස්ත්‍රාත් වශයෙන් වැඩ බැලූ ටී සරවනරාජා තම ජීවිතයට ඇති තර්ජන නිසා තනතුරන් ඉල්ලා අස් වී රටින් පිටව ගියේය. පසුගිය මාසයේ දී දේශපාලකයෙකු විනිසුරු සරවනරාජා පිළිබඳව විවාදාත්මක ප්‍රකාශයක් කර තිබිණ.

2023 ඔක්තෝබර්

මහජන උපයෝගිතා ගාස්තු වැඩි කිරීම අනුමත නොකිරීම ඇතුළත් කරුණු ගණනාවක් පිළිබඳව ආණ්ඩුව සමග එකඟතාවයක් නොතිබීම නිසා 2023 මැයි මස තනතුරෙන් ඉවත් කරන ලද මහජන උපයෝගිතා කොමිසමේ හිටපු සභාපති ජනක රත්නායකට දූරකතනයෙන් තර්ජනය කොට කප්පම් මුදලක් ඉල්ලා ඇත.

2023 නොවැම්බර්

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන්කරුවෝ පක්ෂයේ උප සභාපති ඇනි නගුලේස් මියගිය එල්ටීටීඊ කාර්යධරයන්ගේ පවුල්වලට ආහාර සැපයීම නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන දෙසැම්බර් 7 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලදී. ඔහු අත්අඩංගුවට ගත්තේ ප්‍රදේශයේ මහාවීර් නාල් උත්සවයකට සහභාගිවෙමින් සිටිය දීය.

මෙම අත්අඩංගුවට ගැනීම පිළිබඳව පාර්ලිමේන්තුවේ දි ප්‍රකාශයක් කළ දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මංත්‍රී ආර් ෂානක්‍යයන් මෙය බරපතළ ප්‍රශ්නයක් බවත් අනුස්මරණය කිරීමට උතුරේ සහ නැගෙනහිර ඉඩ නොදෙන්නේනම් සංහිඳියාවක් ඇති නොවන බවත් සත්‍ය සහ සංහිඳියා කොමිසම සාර්ථක නොවන බවත් කීවේය.

2013 දෙසැම්බර්

නීතිඥයින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සම්බන්ධ කරමින් මහජන ආරක්ෂක ඇමති ටිරාන් අලස් කළ ප්‍රකාශය නීතිඥ වෘත්තීය සමිති තරයේ හෙළා දුටහ. පූස් බුද්ධ යනුවෙන් මුහුණු පොත් පිටුවක් සහ පූස් බුද්ධ අනුගාමිකයෝ යනුවෙන් කණ්ඩායමක් පවත්වා ගෙන ආ තරුණයෙකු දෙසැම්බර් 21 අත්අඩංගුවට ගෙන ජනවාරි 4 තෙක් රක්ෂිත බන්ධනාගාර ගත කෙළේය. සිංහල පදිංචිකරුවෙකු තම ගවයෙකුට වෙඩි තැබුවේයැයි දෙමළ කිරි ගොවියෙකු කළ පැමිණිල්ලක් සටහන් කර ගැනීමට වාලච්චේනෙයි පොලීසිය අකමැති වූ බව වාර්තාවේ.